# රණවිරුවා

2024 ඔක්තෝබර් • 270 කලාපය




## දිනා දී මව්බිම තනා මග සුරකින...

## 75 වසක අභිමානය

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.





## යුද්ධ හමුදාධිපති නව ජනාධිපතිතුමන් හමුවේ

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඉකුත් ඔක්තෝබර් මස 04 වන දින ජනාධිපති ලේකම් කාර්යාලයේ දී ජනාධිපති සහ සන්නද්ධ හමුදා සේනාධිනායක අනුර කුමාර දිසානායක මහතා හමුවිය. මෙම සුහද හමුවේදී යුද්ධ හමුදාධිපති විසින් ජනාධිපතිතුමන් වෙත සිය උණුසුම් සුබපැතුම් පිරිනැමීය. එහිදී, ජාතික ආරක්ෂාව තවදුරටත් තහවුරු කිරීම වෙනුවෙන් යුද්ධ හමුදාවේ කාර්යභාරය පිළිබඳ ජනාධිපතිතුමන් විසින් අවධාරණය කරන ලදී. මෙහිදී, රටේ ස්ථාවරත්වය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා යුද්ධ හමුදාවේ නොසැලෙන කැපවීම සහ දායකත්වය පිළිබඳ සහතිකය ජනාධිපතිතුමන් වෙත ලබාදුන් යුද්ධ හමුදාධිපති වර්තමානයේ අභියෝගවලට මුහුණ දීම සඳහා යුද්ධ හමුදාවේ සූදානම පිළිබඳව ද දැනුම්වත් කරන ලදී.

## යුද්ධ හමුදාධිපති නව අග්‍රාමාත්‍යතුමිය හමුවෙයි

යුද්ධ හමුදාධිපති ඉකුත් ඔක්තෝබර් මස 24 වන දින කොළඹ පිහිටි අග්‍රාමාත්‍ය කාර්යාලයේදී ශ්‍රී ලංකාවේ නව ආග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මැතිණිය හමුවිය.

මෙම සුහද හමුවේදී, නව අග්‍රාමාත්‍යතුමිය වෙත සිය සුබපැතුම් පිරිනැමූ යුද්ධ හමුදාධිපති, ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සහ මව්බිමේ අභිවෘද්ධිය උදෙසා යුද්ධ හමුදාවේ සහයෝගය නොඅඩුව ලබාදීමට ද පොරොන්දු විය.



## යුද්ධ හමුදාධිපති නව ආරක්ෂක ලේකම් හමුවෙයි




යුද්ධ හමුදාධිපති ඉකුත් ඔක්තෝබර් මස 02 වන දින ආරක්ෂක අමාත්‍යාංශයේ දී නව ආරක්ෂක ලේකම් වශයෙන් ධූරයේ රාජකාරී භාරගනු ලැබූ එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී (තෙවරක්) ආර්එස්පී (දෙවරක්) යූඑස්පී එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යයනය - චීනය) එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයන) එස්එන්ඩියූ (චීනය) පීඑස්සී හමුවිය. මෙම හමුවේදී රටේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා යුද්ධ හමුදාවේ පූර්ණ සහයෝගය අමාත්‍යාංශය වෙත ලබාදෙන බව ප්‍රකාශ කළ යුද්ධ හමුදාධිපති ආරක්ෂක ගැටලු සහ ඒ ආශ්‍රිත අනෙකුත් කරුණු පිළිබඳව ද අදහස් හුවමාරු කර ගත්හ.

# ආරක්ෂක ලේකම් යුද්ධ හමුදා මූලස්ථානයේ නිල සංචාරයක

නව ආරක්ෂක ලේකම් එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී (තෙවරක්) ආර්එස්පී (දෙවරක්) යූඑස්පී එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යයනය - චීනය) එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයන) එස්එන්ඩීයූ (චීනය) පීඑස්සී ඉකුත් ඔක්තෝබර් මස 28 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ නිල සංචාරයක නිරත විය.

එහිදී, එතුමන්ට ශ්‍රී ලංකා පාබල හමුදාවේ හටපිරිස් වෙතින් හිමිවූයේ ගෞරවනීය බුහුමනකි. අනතුරුව, යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ විසින් එතුමන්ව ඉතා උණුසුම් ලෙස පිළිගැනීමෙන් පසු යුද්ධ හමුදාවේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන්ව හඳුන්වාදීම ද සිදුකරන ලදී. පසුව, යුද්ධ හමුදාධිපති කාර්යාලයේ දී පැවති හමුවේදී දෙදෙනා අතර අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් කරුණු පිළිබඳව සාකච්ඡා කෙරිණ.

ආරක්ෂක ලේකම්තුමන් එහිදී යුද්ධ හමුදා සාමාජිකයින් අමතන්නට ද කටයුතු කළ අතර, රටේ භෞමික අඛණ්ඩතාව සහ ස්වෛරීභාවය ආරක්ෂා කිරීම සඳහා යුද්ධ හමුදාවේ කැපවීම ඇගයීමට ද ලක්කළේය. එසේම, සාමය සහ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා යුද්ධ හමුදාවේ ප්‍රධාන භූමිකාව ඉස්මතු කළ එතුමන්, ජාතික ආරක්ෂාව සහ අභියෝග හමුවේ ඔරොත්තු දීමේ හැකියාව, ඒ සඳහා කැපවීම පිළිබඳව ද අවධාරණය කළේය.














# යුද්ධ හමුදාවට කිතුනු සහ හින්දු ආගමික ආශීර්වාද



ඔක්තෝබර් මස 10 දිනට යෙදුන 75 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව සිදුකරනු ලැබූ ආශීර්වාදාත්මක ක්‍රිස්තියානි දේව මෙහෙය කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ගේ ප්‍රධානත්වයෙන් පසුගිය ඔක්තෝබර් මස 04 වන දින බොරැල්ල, සියලු සාන්තුවරුන්ගේ දේවස්ථානයේදී පැවැත්විණි. යුද්ධ හමුදා ක්‍රිස්තියානි සංගමයේ සභාපති මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සමගින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනී ජානකී ලියනගේ මහත්මිය එම අවස්ථාවට සහභාගී වූහ.



එහිදී, අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ධජය මෙන්ම අනෙකුත් සියලු යුද්ධ හමුදා රෙජිමේන්තු සහ ආයතනික ධජ වෙත ආශිර්වාද කිරීමෙන් පසුව විශේෂ දිව්‍ය පූජාවක් ද පවත්වන ලදී. දේව මෙහෙය අවසානයේ දී, මහජනතාව අතර ආධ්‍යාත්මික සුවය, සංහිඳියාව සහ සාමය ඇතිකිරීම වෙනුවෙන් එම දේවස්ථානය මගින් සිදුකරනු ලබන ආගමික සේවාවේ උන්නතිය උදෙසා යුද්ධ හමුදාධිපති විසින් අගරදගුරුතුමන් වෙත මූල්‍ය පරිත්‍යාගයක් ද සිදුකරන ලදී.



තවද, යුද හමුදා සංවත්සර දිනයට සමගාමීව සංවිධානය කෙරුණු හින්දු ආගමික ආශීර්වාද ලබාගැනීමේ "ආශිර්වාද" පූජාවක් ද කොළඹ 06, මයුරපති ශ්‍රී භද්‍රකාලි අම්මාන් කෝවිල් පරිශ්‍රයේදී ඉකුත් ඔක්තෝබර් මස 02 වන දින පැවැත්විණි. ශ්‍රී ලංකා යුද්ධ හමුදා හින්දු සංගමය විසින් සංවිධානය කරන ලද මෙම උත්සවය, හින්දු ආගමික වතාවත් හා චාරිත්‍රානුකූලව කෝවිල් පරිශ්‍රයේදී පැවැත්වූ අතර, එහිදී ද යුද්ධ හමුදා ධජයන්ට ආශීර්වාද එක්කෙරිණ.

යුද්ධ හමුදා හින්දු සංගමයේ සභාපති මේජර් ජෙනරාල් කේඑම්පීඑස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ගේ ප්‍රධානත්වයෙන් පැවති එම පූජාව එම කෝවිලේ ප්‍රධාන කුරුක්කල් සිවශ්‍රී රාගවන් ප්‍රමුඛ හින්දු පූජකවරු පිරිසක් මෙහෙයවනු ලැබූහ. ආගමික පූජා වතාවත්වලින් පසුව යුද්ධ හමුදාධිපති විසින් සියලුම යුද්ධ හමුදා සාමාජිකයන් වෙනුවෙන් හින්දු කෝවිලේ සංවර්ධන කටයුතු සඳහා එම කෝවිලේ සභාපති සුන්දරලිංගම් මහතා වෙත මූල්‍ය පරිත්‍යාගයක් ද සිදු කරන ලදී.





# සංවත්සරය සමරා සර්ව රාත්‍රික "පිරිත් සජ්ඣායනයක්"



ඔක්තොම්බර් මස 10 දිනට යෙදුන 75 වන යුද්ධ හමුදා සංවත්සරය නිමිත්තෙන් සංවිධානය කෙරුණු සම්ප්‍රදායික සර්ව රාත්‍රික "පිරිත් සජ්ඣායනය" ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේ දී ඉකුත් ඔක්තෝබර් මස 05 වන දින පැවැත්විණි. මෙම අවස්ථාවට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ඇතුළු පිරිසක් සහභාගී වූහ.

එහිදී, වර්ණවත් පෙරහැරකින් යුද්ධ හමුදාධිපතිතුමන් විසින් සර්වඥ ධාතු කරඬුව වැඩම කරවීමත් සමඟ සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායන වැඩසටහනේ වැඩකටයුතු ආරම්භ වූ අතර, යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජ්ඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ විසින් "පිරුවානා පොත්" වහන්සේ වැඩම කරවන ලදී. මෙම අවස්ථාව වෙනුවෙන් වැඩමවා වදාළ ගංගාරාම විහාරාධිපති පූජ්‍ය ආචාර්ය කිරින්දේ අස්සජි ස්වාමීන් වහන්සේ විසින් ප්‍රධාන අනුශාසනාව සිදුකරමින් සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනයේ මුලසුන හෙබවූ අතර, ශ්‍රී පාදස්ථානාධිපති බෙංගමුවේ පූජ්‍ය ධම්මදින්න ස්වාමීන් වහන්සේ එහිදී අනුශාසනාවක් ද පවත්වනු ලැබූහ. පිරිත් සජ්ඣායනයෙන් අනතුරුව පසුදින මහා සංඝරත්නය විෂයෙහි දානමය පිංකමක් ද පැවැත්විය.



# 75 වන යුද්ධ හමුදා දිනයට සමගාමීව රණවිරුවන් අනුස්මරණ කෙරේ

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 75 වන සංවත්සරයට සමගාමීව මවුබිමේ ඒකීයභාවය වෙනුවෙන් දිවිපිදූ වීරෝදාර රණවිරුවන්ගේ අමිල මෙහෙවර සිහිපත් කිරීමේ රණවිරු අනුස්මරණ උත්සවයක් බත්තරමුල්ල, රණවිරු ස්මාරකය අභියසදී ඉකුත් ඔක්තෝබර් මස 07 වන දින සන්ධ්‍යාවේ පැවැත්විණ. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් පැවැති මෙම සැමරුම් උත්සවය අභිමානවත් හැඟුම්බර අවස්ථාවක් විය.**



මීට වසර 15 කට ප්‍රථම අප වීරෝදාර රණවිරුවන් ජීවිත පරිත්‍යාගයෙන් ත්‍රස්තවාදය තුරන් කරමින් රට එක්සේසත් කිරීමට දැක්වූ නිර්භීත දායකත්වය ඇගයීමට ලක්කරමින් ඔවුන් වෙනුවෙන් සෑම වසරකම යුද්ධ හමුදා සංවත්සර දිනයට සමගාමීව මෙම උපහාර උත්සවය පවත්වනු ලබයි.

හිරු නැගෙනා මොහොතෙදීත් හිරු බසිනා මොහොතෙදීත් රට වෙනුවෙන් දිවිපිදූ විරෝදාර රණවිරුවන් වෙනුවෙන් හමුදා සම්ප්‍රදායානුකූලව වැයෙන යුද්ධ හමුදා තූර්යවාදක බියුගල් නලාකරුවන්ගේ අවර රණවිරු අනුස්මරණ බියුගල් නාදය එදිනට ගුවනට මුසුවූයේ එහි රැස්වූ සැමගේ හදවත් හැඟීම්බර කරමිනි. මෙම පුෂ්පෝපහාර පුදකිරීම සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානි, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක, ආරක්ෂක සේනා ආඥාපතිවරු, ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන් ඇතුළු විශාල පිරිසක් ද එක්වූහ











# විශේෂ ඉස්ලාමීය ආගමික වැඩසටහනක්



75 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව සිදුකරනු ලැබූ සර්ව ආගමික ආශිර්වාද වැඩසටහන් මාලාවේ තවත් ආශිර්වාද පූජාවක් ඉකුත් ඔක්තෝබර් මස 03 වන දින උදෑසන කොල්ලුපිටිය, ජුම්මා මුස්ලිම් පල්ලියේදී පැවැත්විණි. ඒ සඳහා යුද්ධ හමුදා සේවයේ නියුතු මුස්ලිම් නිලධාරීන් සහ සෙසු නිලයන් පිරිසක් සහභාගී වූහ. බ්‍රිගේඩියර් ටීඑන් මජීඩ් ආර්එස්පී යූඑස්පී එන්ඩීසී අයිඑස්සී සහ කොල්ලුපිටිය ජුම්මා මුස්ලිම් පල්ලියේ භාරකාර මණ්ඩලයේ සාමාජිකයින්ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ මෙම අවස්ථාවට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ප්‍රධානත්වය දැරීය.

එහිදී, රටේ අභිවෘද්ධිය උදෙසා යුද්ධ හමුදාව විසින් සිදු කරන ලද අපරිමිත මෙහෙය අගයමින් ඉස්ලාමීය ආගමික චාරිත්‍රානුකූල "බයාන්" (Bayan) ආගමික දේශනය පවත්වමින් යුද්ධ හමුදා ධජයන්ට සහ යුද්ධ හමුදාවට ආශිර්වාද එක්කරන ලද අතර, අනතුරුව මවුලවිතුමන් විසින් "කිරාත්" (Qirath) සහ "දුආ" (Dua) යන විශේෂ ආශිර්වාද යාඥාවන් ද පවත්වමින් යුද්ධ හමුදාවට ආශිර්වාද එක්කරන ලදී.

මෙම ආගමික උත්සවය අවසානයේදී එම ඉස්ලාමීය පූජනීය සිද්ධස්ථානයේ සංවර්ධන කටයුතු සඳහා මූල්‍ය පරිත්‍යාගයක් ද සිදුකල යුද්ධ හමුදාධිපති, රට තුළ පවතින සහජීවනය පිළිබඳව මවුලවිතුමන්ලා සමඟින් සුහදව අදහස් හුවමාරුවක ද නිරතවූහ.

# බහුවිධ පහසුකම් සංකීර්ණය විවෘත කෙරේ



යුද්ධ හමුදා නිලධාරීන් සහ සෙසුනිලයන්ගේ සුභසාධන පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් මේට්ලන්ඩ් පෙදෙසේ අභිනවයෙන් ඉදිකරනු ලැබූ බහුවිධ පහසුකම් සංකීර්ණය ඉකුත් ඔක්තෝබර් මස 30 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සුරතින් විවෘත කෙරිණ.

මෙම පස්මහල් ගොඩනැගිලි සංකීර්ණය අවන්හල් දෙකක්, උත්සව ශාලාවක්, සුඛෝපභෝගී කාමර සහ බිම් මහලේ රථගාලක් ඇතුළු නවීන පහසුකම්වලින් සමන්විත වන අතර, යුද්ධ හමුදාව තුළ පවතින සුභසාධන පහසුකම් තවදුරටත් වැඩිදියුණු කරමින් සියලුම නිලයන්ට උපරිම සේවාවක් සැපයීම මෙහි අරමුණයි.

ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ මඟපෙන්වීම මත 6 ඉංජිනේරු සේවා බලකායේ භටපිරිස්හි ශ්‍රමය සහ තාක්ෂණික දැනුම යොදාගනිමින් මෙහි ඉදිකිරීම් කටයුතු සිදුකෙරිණ. මෙම අවස්ථාවට යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන ඇතුළු නිලධාරීන් සෙනිලයින් රැසක් සහභාගී වූහ.







## “දිනාදී මව්බිම තනා මඟ සුරකින”

# ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 75 වසක අභිමානය



ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 75 වන සංවත්සරය ඉකුත් ඔක්තෝබර් මස 10 වන දින පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේදී උත්කර්ෂවත් අයුරින් පවත්වනු ලැබීය. යුද්ධ හමුදා ඉතිහාසයේ සංධිස්ථානයක් ලෙස සැලකෙන මෙම සංවත්සරය දශක තුනකට අධික කාලයක් පුරාවට අනේකවිධ ගැටළුවලට මුහුණ දී ජාතියට තිරසාර සාමයක් උදාකර දීම වෙනුවෙන් ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීම සඳහා වූ යුද්ධ හමුදා සාමාජිකයන්ගේ අසීමිත කැපවීම පෙන්නුම් කිරීමකි. එසේම, ජාතික ආරක්ෂාව සහතික කිරීම වෙනුවෙන් පෙරමුණේ රැඳී සිටිමින් තම කාර්යභාරය අඛණ්ඩව ඉටු කිරීමට යුද්ධ හමුදාව ප්‍රතිඥා දීමක් ලෙස ද මෙම අභිමානවත් සංවත්සරය සඳහන් කළ හැකිය.

යුද්ධ හමුදා ධජය, රෙජිමේන්තු ධජ සහ අනෙකුත් යුද්ධ හමුදා ආයතනයන්හි ධජ ලෙලදෙමින් විචිත්‍රවත් වූ එම උත්සවයට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගී විය.



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සමඟින් එහි සපැමිණි යුද්ධ හමුදාධිපති වෙත යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජ්ඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ සහ යුද්ධ හමුදා විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් සීඑස් මුණසිංහ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී අයිජ් ගේ උණුසුම් පිළිගැනුම් හිමිවූහ.



එහිදී, දිවංගත වීරෝදාර රණවිරුවන් අනුස්මරණය කරමින් ඔවුන්ගේ නිර්භීතකම සහ පරිත්‍යාගශීලී බව ඇගයූ යුද්ධ හමුදාධිපති යුද්ධ හමුදා වංශකථාව තුළ ඔවුන් අමරණීය ලෙස රැඳී පවතින බවද අවධාරණය කරලීය.

ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති සහ ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී සහ ගජබා රෙජිමේන්තුවේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ජීඒටී ගොඩේවත්ත ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ අණදීමෙන් යුතුව මෙවර පැවති යුද්ධ හමුදා සංවත්සර දින පෙළපාලිය සඳහා යුද්ධ හමුදාවේ රෙජිමේන්තු 25 නියෝජනය කරමින් නිලධාරීන් 75 දෙනෙක් සහ සෙසුනිලයෝ 626 දෙනෙක් යුද්ධ හමුදා වර්ණ සමඟින් සහභාගී වූහ.



මෙවර සංවත්සර දින නිමිත්තෙන් යුද්ධ හමුදාධිපති, යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන සහ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන ගේ සුරතින් තෝරාගත් නිලධාරීන් 35 දෙනෙක් සහ සෙසුනිලයෝ 25 දෙනෙක් වෙත සංවත්සර දින විශේෂ සැමරුම් පදක්කමක් ද පැළඳ වූහ.




# සංවත්සරය සමරා සංගීත ප්‍රසංගයක්

මව්බිමේ ඒකීයභාවය වෙනුවෙන් සටන් වැද තුවාල ලැබ මිහිඳු සෙත් මැඳුර සුවතා නිකේතනයෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන් වෙනුවෙන් උපහාර පිදීමේ අරමුණින් සංවිධානය කෙරුණු සංගීත ප්‍රසංගයක් ඉකුත් ඔක්තෝබර් මස 08 වන දින එම නිකේතනයේ දී පැවැත්විණ. යුද්ධ හමුදාවේ 75 වැනි සංවත්සරයට සමගාමීව පැවැත්වුන මෙම අවස්ථාවට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සමඟින් යුද්ධ හමුදා සේවාවනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ද එක්වූහ.





යුද්ධ හමුදා අධිරිද්ම සංගීත කණ්ඩායම සමඟින් ජනප්‍රිය ගායන ශිල්පීන් රැසක් ද එක්වූ මෙම ප්‍රසංගයේ දී පැවති රෝද පුටු නර්තන ඇතුළු වැඩසටහන සඳහා එම සුවතා නිකේතනයේ රණවිරුවෝ 75 දෙනක් සහභාගී වූහ. උත්සවය සමාප්තියේ ආරාධිත අමුත්තන්ගේ සහභාගීත්වයෙන් රාත්‍රී භෝජන සංග්‍රහයක් ද පැවති අතර, මේ සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන, ඇතුළු නිලධාරීන්, ඔවුන්ගේ භාර්යාවන්, සහ සෙසුනිලයන් පිරිසක් ද සහභාගී වූහ.





# කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවය





ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවය ඉකුත් ඔක්තෝබර් මස 14 සහ 15 දෙදින තුළ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණි. එහිදී, උපායමාර්ගික අධ්‍යයනය සහ ජාත්‍යන්තර සබඳතා, වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, නීතිය, කළමනාකරණය, සෞඛ්‍ය විද්‍යාව, නිර්මිත පරිසරය හා අවකාශීය විද්‍යාව, පරිගණක තාක්ෂණය ඇතුළු විවිධ අධ්‍යයන විෂයයන්හි උපාධි අපේක්ෂකයින් වෙත උපාධි සහතිකපත් පිරිනැමිණි.

මෙම උත්සවයේදී, උපාධිධාරීන් 1,728 දෙනකු වෙත ආචාර්ය උපාධි, ශාස්ත්‍රපති උපාධි, ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකපත් පිරිනැමිණි. එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී (තෙවරක්) ආර්එස්පී (දෙවරක්) යූඑස්පී එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යයනය - චීනය) එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයන) එස්එන්ඩීයූ (චීනය) පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන, ත්‍රිවිධ හමුදාධිපතිවරු, වැඩබලන පොලිස්පති, විශ්වවිද්‍යාල ප්‍රධානීන්, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය, උපාධිලාභීන්ගේ දෙමාපියන් ඇතුළු විශාල පිරිසක් එක්ව සිටියහ.




# ගජබා රෙජිමේන්තුවේ 41 වන සංවත්සරය සමරා පිරිත් සජ්ඣායනාවක්



ගජබා රෙජිමේන්තුවේ 41 වන සංවත්සරය වෙනුවෙන් ඉකුත් ඔක්තෝබර් මස 13 සහ 14 යන දෙදින තුළ අනුරාධපුර, සාලියපුර හි ස්ථාපිත එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී සැමරුම් උත්සව මාලාවක් පැවැත්විණි. එහි සමාරම්භය සනිටුහන් කරමින් රෙජිමේන්තුවට ආශිර්වාද එක්කිරීම සහ රෙජිමේන්තුවේ දිවංගත රණවිරුවන්ට පිං අනුමෝදන් කරමින් සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාවක් පැවැත්විණි. මෙම සුවිශේෂී අවස්ථාව සඳහා ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති සහ ගජබා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ගෞරවනීය ඇරයුමෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ද සහභාගී විය.



ඉතිහාසය තුළ මව්බිමේ තීරණාත්මක කාලපරිච්ඡේදයන්හිදී යුද්ධ හමුදාවේ නායකත්වයන් දරමින් එම රෙජිමේන්තුව වෙතින් සිදුකළ අමිල කාර්යභාරය පිළිබඳව අදහස් දක්වමින් එම අවස්ථාවට වැඩමවා වදාළ ස්වාමීන් වහන්සේ නමක් විසින් එහිදී අනුශාසනාවක් ද සිදුකරනු ලැබූහ. යුද්ධ හමුදාධිපති එම අවස්ථාවට එක්ව සිටි දිවිපිදූ රණවිරුවන්ගේ ඥාතීන් සමඟ සුහද කතාබහක නිරත වන්නට ද අමතක නොකළහ.







# යුද්ධ හමුදා සංවත්සර දින රාත්‍රී භෝජන සංග්‍රහය

යුද්ධ හමුදා 75 වෙනි සංවත්සර දිනය සනිටුහන් කරමින් යුද්ධ හමුදාවේ සියලු නිලයන් අතර සුහදත්වය සහ සහයෝගීතාවය ඇතිකිරීමේ අරමුණින් සම්ප්‍රදායිකව සංවිධානය කරන රාත්‍රී භෝජන සංග්‍රහය පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේ දී ඉකුත් ඔක්තෝබර් මස 10 වන දින පැවැත්විණි. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදාවේ රෙජිමේන්තු 25 නියෝජනය කරමින් සාමාජික සාමාජිකාවෝ සහභාගී වී සිටි අතර, එම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ එක්විය.

යුද්ධ හමුදා සංවත්සර සැමරුම වෙනුවෙන් 2009 වර්ෂයේ සිට පැවැත්වෙන මෙම සියලු නිල රාත්‍රී භෝජන සංග්‍රහය සඳහා සහභාගී වන සියලුම යුද්ධ හමුදා සාමාජිකයින්ට එහිදී, සිය වෘත්තීය දිවියේ මතක හා අත්දැකීම් පිළිබඳ අදහස් හුවමාරු කරගැනීමටත් එකිනෙකා අතර සුහදත්වය වර්ධනය කරගැනීමටත් මෙය කදිම අවස්ථාවකි.



මෙම අවස්ථාව සඳහා සහභාගී වූ යුද්ධ හමුදාධිපති ප්‍රමුඛ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හටපිරිස් සමඟ සුහදව අදහස් හුවමාරු කරගනිමින් ඔවුන් අතර පවතින බැඳීම් තවදුරටත් ඉහළ නංවාගැනීමට කටයුතු කරනු ලැබීය. එහිදී, හටපිරිස් අසුන්ගෙන සිටි ස්ථාන වෙතම ගිය යුද්ධ හමුදාධිපති විවිධ රෙජිමේන්තු නියෝජනය කරනු ලබන රෙජිමේන්තු සැරයන් මේජර්වරුන් වෙත මුල් දින කවරය සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 75 වන සංවත්සර දින මුද්දරය පිරිනැමීමට ද කටයුතු කළේය. එමෙන්ම, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉතිහාසය පුරාවට කල්පවත්නා වටිනාකම, පක්ෂපාතීත්වය, අනුපමේය සේවය සහ යුද්ධ හමුදා දිවිය පිළිබඳ මතකාවර්ජනය කිරීම සඳහා මෙය කදිම අවස්ථාවක් විය. යුද්ධ හමුදාවේ විවිධ රෙජිමේන්තු නියෝජනය කරමින් සහභාගී වූ සාමාජිකයන් ජාතික ආරක්ෂාව සහ යහපැවැත්ම සඳහා කැප වූ බලවේගයක් වශයෙන් කටයුතු කරනු ලබන බවට එමගින් කියාපෑ සෙයකි.















# ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ සාමාජිකයන්ට අභිමානවත් සෙවණක්

කුරුණෑගල, හෙරලියාවල පිහිටි ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු රෙජිමේන්තු මූලස්ථාන බළඇණි පරිශ්‍රයේ අභිනවයෙන් ඉදිකළ නවාතැන් පහසුකම් සංකීර්ණය යුද්ධ හමුදාධිපති සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ රෙජිමේන්තු අධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පසුගිය ඔක්තෝබර් මස 11 වන දින සන්ධ්‍යාවේ විවෘත කෙරිණි.

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එච්ජ් කීර්තිනාථ ආර්එස්පී කේඑස්පී පීඑස්සී ගේ ගෞරවනීය ඇරයුමෙන් එහි පැමිණි යුද්ධ හමුදාධිපති, හටපිරිස් 350 දෙනකුට නවාතැන් ගැනීමේ හැකියාව ඇති එම තෙමහල් නවාතැන් පහසුකම් සංකීර්ණය පරීක්ෂා කරනු ලැබීය. එහිදී, එතුමන් නවීන පහසුකම්වලින් සමන්විතව එම ගොඩනැගිලි ඉදිකිරීම සඳහා තාක්ෂණික, ඉංජිනේරු දැනුම හා ශ්‍රම දායකත්වය ලබාදුන් ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ හටපිරිස් සමඟින් සුහද අදහස් හුවමාරුවක ද නිරත වූයේය.

ඉන් අනතුරුව, එතුමාගේ සුරතින් ශ්‍රී ලංකා රෝදපුටු ක්‍රිකට් සංගමය නියෝජනය කරන රණක්ෂිතයට පත් සාමාන්‍ය සෙබළ කුමාරවංශ පීඑච්එස් යන සෙබළා වෙත රෝද පුටුවක් ද පරිත්‍යාග කරනු ලැබීය. එසේම, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා වූ නවාතැන් පහසුකම් ගොඩනැගිල්ල (Mountain View) විවෘත කිරීම ද එහිදී යුද්ධ හමුදාධිපති ගේ සුරතින් සිදුකෙරිණ. අවම පිරිවැයකින් එම ව්‍යාපෘතිය සාර්ථකව නිමකිරීම පිළිබඳව ද එහි හටපිරිස් වෙත යුද්ධ හමුදාධිපති සිය නොමඳ පැසසුම් එක්කළේය.







# ජාත්‍යන්තර ටයිකොන්ඩෝ ප්‍රදර්ශනය



ජාත්‍යන්තර ටයිකොන්ඩෝ ප්‍රදර්ශනය පසුගිය ඔක්තෝබර් මස 23 වන දින පනාගොඩ යුද්ධ හමුදා ශාරීරික අධ්‍යයන පුහුණු මධ්‍යස්ථානයේ දී පැවැත්විණ. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකාවේ කොරියානු ජනරජයේ තානාපති අතිගරු මියොන් ලී මැතිණිය සහභාගී වූවාය. මෙම අවස්ථාවේදී, කොරියානු තානාපති සහ ටයිකොන්ඩෝ කණ්ඩායමේ සාමාජිකයන් ඇතුළු අයවළුන් සඳහා යුද්ධ හමුදාධිපති ගේ සුරතින් සම්මාන ප්‍රදානය කෙරිණි. කොරියානු ටයිකොන්ඩෝ කණ්ඩායමේ සංදර්ශනයක් ද සමගින් වර්ණවත් වූ මෙම තරඟාවලියට ශ්‍රී ලංකා යුද්ධ හමුදා නර්තන කණ්ඩායමේ නර්තනාංග රැසක් ද එක්ව තිබිණ.



ටයිකොන්ඩෝ ක්‍රීඩාවේ අභිවෘද්ධිය සහ රට තුළ එම ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම උදෙසා යුද්ධ හමුදාධිපති දැක්වූ දායකත්වය ඇගයීමට ලක්කරමින් අතිගරු මියොන් ලී මැතිණියගේ සුරතින් එතුමන් වෙත එහිදී ගෞරව සම්මානයක් ද පිරිනැමූ අතර, එසේ පිදුම් ලද ප්‍රථම ශ්‍රී ලාංකික යුද්ධ හමුදාධිපති ඔහු වීම ද විශේෂත්වයකි.





අන්‍යෝන්‍ය අවබෝධය සහ සුහදත්වය ප්‍රවර්ධනය කිරීමේදී දෙරටෙහි සංස්කෘතික අංගයන් හුවමාරුව සහ සහයෝගීතාවයේ වැදගත්කම පිළිබඳ අවධාරණය කරමින් කොරියානු තානාපතිතුමිය විසින් සමාප්ති දේශනය පැවැත්වූ අතර එහිදී, ශ්‍රී ලංකාව සහ කොරියාව අතර පවතින ශක්තිමත් සබඳතාවයන් පිළිබඳව ද අවධාරණය කළාය.










# සෙවණක් තනා සරණක් වූ වගයි

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 75 වන සංවත්සරයට සමගාමීව, 2 බලඇණිය යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ භට පිරිස් විසින් ඉකුත් සැප්තැම්බර් මස 27 වන දින වව්නියාව, පුරවසම්කුලම්, නිලියාමොටේ ප්‍රදේශයේ නිවාස අවශ්‍යතා ඇති පවුලක් සඳහා නව නිවසක් ඉදිකරදෙනු ලැබූහ.

21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්එස්කේ වනසිංහ ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණය යටතේ අභිනවයෙන් ඉදිකළ මෙම නිවස අනුරාධපුර ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස පැවති යුද්ධ හමුදා ධජ ආශිර්වාද පූජෝත්සවයේ දී නිල වශයෙන් එම්. සදානන්දන් කුමාරි මහත්මිය වෙත ප්‍රදානය කෙරිණි. මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස සහභාගී වූ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් අදාළ නිවසේ යතුර ප්‍රතිලාභියා වෙත භාරදෙන ලදී.

# අභාවප්‍රාප්ත නිලධාරීට යුද්ධ හමුදාධිපති ගේ ගෞරවාචාරය



ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ කර්නල් ඩීඑම්බීපීබී දිසානායක ආර්එස්පී යූඑස්පී අසනීප තත්වයක් හේතුවෙන් පසුගිය ඔක්තෝබර් මස 07 වන දින අභාවප්‍රාප්ත විය. ඔහුගේ දේහය වෙත යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඉකුත් ඔක්තෝබර් මස 08 වන දින ජයරත්න මල්ශාලාවේ දී සිය ගෞරවාචාරය පුදකළේය. එහිදී, මියගිය එම නිලධාරීගේ පවුලේ සාමාජිකයන් සමඟ සුහද පිළිසඳරක ද නිරත වූ යුද්ධ හමුදාධිපති ඔවුන් වෙත සිය හෘදයාංගම ශෝකය පුදකළේය.



වර්ෂ 1996 ජූලි මස 15 වන දින කෙඩෙට් නිලධාරී පුහුණු පාඨමාලා අංක - 45 යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බලසේනාවට බැඳී ඇති ඔහු දියතලාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයෙන් මූලික පුහුණුව සාර්ථකව හැදෑරීමෙන් අනතුරුව දෙවන ලුතිනන් නිලයේ අධිකාරියට පත්ව වර්ෂ 1998 ජූනි මස 20 වන දින ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවට අනුයුක්ත වී ඇත. සිය වෘත්තීය දිවිය තුළ විවිධ තනතුරු දැරූ ඔහු අභාවප්‍රාප්ත වනවිට පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ කර්නල් (බඳවාගැනීම්) ධූරය හොබවමින් සිටියේය.

# ජාතික ආරක්ෂක විද්‍යාලයේ ආරාධිත දේශනයක්





ජාතික ආරක්ෂක විද්‍යාලයේ පාඨමාලාවන් හදාරනු ලබන ශිෂ්‍ය නිලධාරීන් වෙනුවෙන් 'Sri Lanka Army National Security Concern' තේමාව යටතේ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ විසින් ඉකුත් ඔක්තෝබර් මස 24 වන දින දේශනයක් සිදුකරන ලදී.

නිදහසින් පසු මෙරට යුද්ධ හමුදාවට එල්ල වන තර්ජන, ආරක්ෂක ගැටලු සහ ඒවායේ විවිධ ස්වරූපයන් පිළිබඳවත් ඉදිරියේදී ඇතිවිය හැකි තර්ජනයන් පිළිබඳවත් යුද්ධ හමුදාධිපති එහිදී අදහස් දැක්වීය. එමෙන්ම, යුද්ධ හමුදාව වෙතින් අනාගතයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් පිළිබඳව ද මෙහිදී සවිස්තරාත්මකව පැහැදිලි කෙරුණු අතර දේශනය අතරතුරදී, ශිෂ්‍ය නිලධාරීන්ට ඔවුන් සතු ගැටලු සබැඳිව යුද්ධ හමුදාධිපතිතුමන් සමඟ සාකච්ඡා කිරීමට ද අවස්ථාව හිමිවිය.

ජාතික ආරක්ෂක විද්‍යාලය වෙතින් පවත්වනු ලබන ජාතික ආරක්ෂාව සහ උපායමාර්ගික අධ්‍යයන පාඨමාලා අංක - 03 යුද්ධ හමුදාවේ ශිෂ්‍ය නිලධාරීන් 16 ක්, නාවික හමුදාවේ ශිෂ්‍ය නිලධාරීන් 08 ක්, ගුවන් හමුදාවේ ශිෂ්‍ය නිලධාරීන් 06 ක් සහ විදේශ රටවල ශිෂ්‍ය නිලධාරීන් 08 දෙනෙක් හදාරනු ලබති.

ජාතික ආරක්ෂක විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ විසින් මෙම අවස්ථාවට සපැමිණි යුද්ධ හමුදාධිපති උණුසුම් අයුරින් පිළිගැනීමෙන් අනතුරුව ජ්‍යෙෂ්ඨ උපදේශක (යුද්ධ හමුදා) බ්‍රිගේඩියර් එම්ජේආර්එස් මැදගොඩ ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී විසින් සමාරම්භක දේශනය පැවැත්වීය.

# ශ්‍රී ලංකාවේ තුර්කි තානාපති යුද්ධ හමුදාධිපති හමුවෙයි



ශ්‍රී ලංකාවේ තුර්කි තානාපති කාර්යාලයේ තානාපති සෙමි ලුට්ෆු තුර්ගුත් මහතා ඉකුත් ඔක්තෝබර් මස 25 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවිය.

මෙම සුහද හමුවේදී, දශක කිහිපයක් පුරා තුර්කිය සහ ශ්‍රී ලංකාව අතර පවතින දීර්ඝකාලීන රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඇතුළු අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් තවත් කරුණු කිහිපයක් පිළිබඳව සාකච්ඡා කෙරිණි. එහිදී, දෙරටෙහි ද්විපාර්ශ්වික සබඳතා පවත්වාගෙන යාමේ වැදගත්කම සහ තවදුරටත් එම සහයෝගීතාවය ශක්තිමත් කිරීම වෙනුවෙන් ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳව ගවේෂණය කිරීමේ වැදගත්කම ද සාකච්ඡා කරනු ලැබීය. මෙම අවස්ථාව සනිටුහන් කරමින් විශේෂ සමරු තිළිණ හුවමාරුවක් ද සිදුවිය.

# ලානිල් ගලබොඩ අනුස්මරණ "සංඝාවාසය" විවෘත කෙරේ

පෑලියගොඩ, ජයතිලකාරාම විහාරස්ථානයේ ලානිල් ගලබොඩ අනුස්මරණ "සංඝාවාසය" විවෘත කිරීමේ උත්සවය ඉකුත් ඔක්තෝබර් මස 13 වන දින පැවති අතර, එම අවස්ථාවට පූජ්‍ය ගැටබේරිකන්දේ රතනසිරි නායක හිමිපාණන්ගේ ආරාධනයකට අනුව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සහභාගී වූහ. ජී.කේ. ජිනදාස සහ චන්ද්‍රා පියසීලි අමරසේන යන මහත්ම මහත්මීන් විසින් ලබාදුන් මූල්‍ය අනුග්‍රාහකත්වය මත යුද්ධ හමුදා හටපිරිස් මෙම සංඝාවාසයේ ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලැබූහ.







# ඉන්දීය නියෝජිත පිරිසක් මාණ්ඩලික ප්‍රධාන හමුවෙති

ඉන්දියාවේ ආරක්ෂක කළමනාකරණ මාණ්ඩලික විද්‍යාලයේ කර්නල් කේදාර් දත්තත්‍රයා ගුප්තේ (Kedar Dattatraya Gupte), ගෘප් කපිතාන් දිපේන්ද්‍ර භදෝරියා (Dipendra Bhadoria), කර්නල් කුනාල් රමේෂ් ලෝනාරි (Kunal Ramesh Lonari) සහ ලුතිනන් කර්නල් මන්දීප් සිං නෙගී (Mandeep Singh Negi) යන නිලධාරීන් යුද්ධ හමුදා මූලස්ථානයේදී ඉකුත් ඔක්තෝබර් මස 14 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජ්ඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ හමුවූහ.



මෙම හමුව අතරතුර, දෙපාර්ශ්වය විසින් ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවන් අතර ඓතිහාසික වශයෙන් පවතින්නා වූ සුහදතාවය, සහයෝගීතාව සහ අන්‍යෝන්‍ය අවබෝධය පිළිබඳව අදහස් හුවමාරු කරගත්හ.



# මව් රෙජිමේන්තුවෙන් හරසර





ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අභිමානවත් 68 වන සංවත්සරයට සමගාමීව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නව මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජ්ඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ වෙත ගෞරවාචාර පුදකිරීමේ උත්සවයක් ඉකුත් ඔක්තෝබර් මස 01 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී පැවැත්විණි.

එහිදී, රෙජිමේන්තු හටපිරිස්වල ගෞරවාචාර මධ්‍යයේ එහි සපැමිණි මාණ්ඩලික ප්‍රධාන රණවිරු ස්මාරකය අභියස දී මාතෘභූමියේ ඒකීයභාවය වෙනුවෙන් දිවිපිදූ එම රෙජිමේන්තුවේ වීරෝදාර රණවිරුවන් සිහිකොට පුෂ්පෝපහාර පුද කිරීමට ද අමතක නොකළේය. තවද, හටපිරිස් ඇමතූ එතුමන් සියලු නිල දිවාභෝජන සංග්‍රහයකට ද එක්විය.

# ඉන්දීය සහකාර ආරක්ෂක උපදේශක හා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන අතර හමුවක්



කොළඹ පිහිටි ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ සහකාර ආරක්ෂක උපදේශක ලුතිනන් කර්නල් මන්දීප් සිංනේගි, එස්එම් (Lieutenant Colonel Mandeep Singh Negi, SM) ඉකුත් ඔක්තෝබර් මස 03 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජ්ඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ හමුවිය. මෙම හමුවේ දී ද්විපාර්ශ්වීයව වැදගත් කරුණු පිළිබඳව සහ දෙරටෙහි සන්නද්ධ හමුදාවන් අතර සුහදතාව, සහයෝගීතාව සහ අවබෝධතාව වැඩිදියුණු කිරීම යන කරුණු පිළිබඳව සාකච්ඡා කෙරිණි.

# ඕස්ට්‍රේලියානු නියෝජිත පිරිසක් යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන හමුවෙති



කර්නල් ලාරා ට්‍රෝයි සීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් කර්නල් අමන්දා ජොන්ස්ටන් (ආරක්ෂක උපදේශක), කර්නල් එමා මාරි තෝමස් (නවසීලන්තය) සහ ආරක්ෂක සහ උපායමාර්ගික පාඨමාලාව - 2024 හි කර්නල් ඇන්ඩෘ ගෝර්ඩන් ටෙම්පල් කර්බි යන ඕස්ට්‍රේලියානු දූත පිරිස පසුගිය ඔක්තෝබර් මස 21 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජ්ඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ හමුවූහ. මෙම හමුවේදී දෙරටෙහි සන්නද්ධ හමුදාවන් අතර මිත්‍රත්වය, සහයෝගීතාවය සහ අන්‍යෝන්‍ය අවබෝධය පිළිබඳව අදහස් හුවමාරු කරගන්නා ලදී. මෙම අවස්ථාවට යුධ සේවා ලේකම් මේජර් ජෙනරාල් කේඑම්පීඑස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ද සහභාගී විය.

## සංචාරයක සටහන්





1 බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එම්ටීඅයි මහලේකම් ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ඉකුත් ඔක්තෝබර් මස 26, 28 සහ 29 යන දිනයන්හිදී එම බලප්‍රදේශයේ සංචාරයක නිරතවිය. 58 වන පාබල සේනාංකය, 583 සහ 581 වන පාබල බලසේනා, කමාන්ඩෝ බලසේනා මූලස්ථානය, 4 කමාන්ඩෝ රෙජිමේන්තුව සහ 5 බලඇණිය විජයබාහු පාබල රෙජිමේන්තුව එලෙස ඔහු සංචාරය කළ ස්ථාන විය.

එහිදී, එම මූලස්ථානයන්හි රජකාරී ස්වභාවය සහ වගකීම් පිළිබඳ සොයා බැලූ හෙතෙම එහි භට පිරිස් අමතන්නට ද කටයුතු කළේය. නීති විරෝධී ක්‍රියාකාරකම් වැළැක්වීම, සෞඛ්‍ය සම්පන්නව රාජකාරි සිදුකිරීම තුළින් සමතුලිතතාවය පවත්වා ගැනීම, හමුදා විනය, ක්‍රියාශීලීවීම සහ 1 බලකායේ ක්‍රියාන්විතයන් සඳහා සහය දැක්වීමේ ක්‍රියාකාරී සූදානම අඛණ්ඩව පවත්වාගැනීමේ වැදගත්කම වැනි ප්‍රධාන කරුණු පිළිබඳ එහිදී ඔහු භට පිරිස් දැනුවත් කළේය.





කිලිනොච්චිය සහ පරන්තන් ප්‍රදේශයේ පදිංචි අඩු ආදායම්ලාභී පවුල් දෙකක් වෙනුවෙන් නිවසක් තනාදීමට 6 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව සහ 14 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ භටපිරිස් කටයුතු කළහ. 55 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්කේඑන්සී ජයවර්ධන ආර්එස්පී එන්ඩීසී ගේ උපදෙස් මත 553 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් ඩබ්ලිව්ජ්අයිඑස් මෙන්ඩිස් ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණයෙන් මෙම කටයුත්ත සිදුවිය. යාපනය අරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එම්ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පසුගිය ඔක්තෝබර් මස 16 වන දින මෙම පවුල් සඳහා යතුරු ප්‍රදානය කෙරුණු අතර, එය එතෙක් තමන්ගේම නිවසක හිමිකම වෙනුවෙන් බලාපොරොත්තු දල්වා සිටි ඔවුන්ගේ සිහින සැබෑවීමකි. යාපනය අරක්ෂක සේනා ආඥාපති ගේ අදහසකට අනුව උතුරු ප්‍රදේශයේ ජනදිවියට සෙවණ සදන නිවාස ව්‍යාපෘතියේ මෙය තවත් සාර්ථක අදියරක නිමාවකි.

# උතුරට සෙවණක් රණවිරු සරණක්





# ශ්‍රී නාග විහාරයේ කඨින පිංකම

යාපනය ඓතිහාසික ශ්‍රී නාග විහාරයේ සම්ප්‍රදායික "කඨින පූජාව" ඉකුත් ඔක්තෝබර් මස 26 සහ 27 යන දෙදින තුළ විහාරාධිපති ශාස්ත්‍රපති පූජ්‍ය මීගහජඳුරේ සිරිවිමල හිමියන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එම්ජ්ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ මඟපෙන්වීමෙන් 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීජේකේ විමලරත්න ආර්ඩබ්ලිව්පී පීඑස්සී ගේ අධීක්ෂණයෙන් මෙම පුණ්‍යකර්මය සිදුකෙරිණ.



නාවික, ගුවන්, පොලිස් හා විශේෂ කාර්ය බලකායේ භට පිරිස් සහ සිවිල් ප්‍රජාව එහි ආගමික වතාවත් සඳහා සහයෝගය දැක්වූහ. ආගමික නායකයින්, රාජ්‍ය නිලධාරීන්, සිවිල් ප්‍රභූවරුන් ඇතුළු බැතිමතුන් විශාල පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.



# වන්නි ජන දිවියට රණවිරු සෙවණක්

වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ මගපෙන්වීමෙන් එම බලප්‍රදේශ තුළ ස්ථාපිත ඒකකවල සහභාගීත්වයෙන් ප්‍රදේශයේ නිවාස නොමැති අයවලුන් සඳහා නිවාස ඉදිකිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වේ. ඒ යටතේ එතුමන්ගේ ප්‍රධානත්වයෙන් පහත නිවාස ජනතා අයිතියට පැවරිණ.



2 ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී මේජර් එච්එම්එස්ජේ බණ්ඩාර ගේ මගපෙන්වීමෙන් අනුරාධපුර තිසාවැව බටහිර ප්‍රදේශයේ ප්‍රතිසංස්කරණය කරන ලද නිවස 2024.10.15 වන දින අදාළ නිවැසියන් වෙත භාරදෙමින්



5 ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළඇණියේ අණදෙන නිලධාරී මේජර් එම්පීඩීසී සිකුරාජපති යූඑස්පී පීඑස්සී එල්එස්සී ගේ මගපෙන්වීමෙන් මාන්කඩවල ප්‍රදේශයේ ප්‍රතිසංස්කරණය කරන ලද නිවස 2024.10.15 වන දින අදාළ නිවැසියන් වෙත භාරදෙමින්



2 ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ අණදෙන නිලධාරී මේජර් එම්පීජීඑම් අබේකෝන් පීඑස්සී එල්එස්සී ඒඒවීඩී ගේ මගපෙන්වීමෙන් පරසන්ගස්වැව ප්‍රදේශයේ ඉදිකළ නිවස 2024.10.15 වන දින අදාළ නිවැසියන් වෙත භාරදෙමින්



4 විජයබාහු පාබල රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී මේජර් සීඑස්කේ ලියනගේ පීඑස්සී ගේ මගපෙන්වීමෙන් ඉදිකළ නිවස 2024.10.12 වන දින අදාළ නිවැසියන් වෙත භාරදෙමින්



8 විජයබාහු පාබල රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී මේජර් එස්එච්ආර්පී ද සිල්වා ආර්එස්පී පීඑස්සී ගේ මගපෙන්වීමෙන් පිවනගර්, මුරුන්කන් ප්‍රදේශයේ ඉදිකළ නිවස 2024.10.12 වන දින අදාළ නිවැසියන් වෙත භාරදෙමින්



12 (සෙව) විජයබාහු පාබල රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ගේ මගපෙන්වීමෙන් වව්නියාව, සින්නවලයන්කඩ්ඩු ප්‍රදේශයේ ඉදිකළ නිවස 2024.10.02 වන දින අදාළ නිවැසියන් වෙත භාරදෙමින්

# රණවිරු ශ්‍රමයෙන් නව නිවසක්

23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්පී කාරියවසම් ගේ මගපෙන්වීම මත 231 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් එම්ජීජ් මලන්දෙනිය ආර්එස්පී ගේ අධීක්ෂණයෙන් අලවකුඹුර ග්‍රාම නිලධාරි වසමේ පදිංචි බී. ඉන්ද්‍රවතී මැණියන් වෙනුවෙන් පසුගියදා නව නිවසක් ඉදිකෙරිණ.

12 ගැමුණු හේවා බලකායේ හටපිරිස්හි ශ්‍රමදායකත්වයෙන් ඉදිවූ මෙම නිවස සඳහා අරලගංවිල මහජන බැංකුවේ මූල්‍ය අනුග්‍රහය හිමිවිය. නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එස්ජ් කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී ගේ සුරතින් අදාළ නිවස එම නිවැසියන් වෙත භාරකෙරිණ.







# දෙමළ භාෂා සහතික පත් ප්‍රදානයක්

යුද්ධ හමුදාව විසින් සංවිධානය කරන ලද දෙමළ භාෂා පුහුණු පාඨමාලාවක සහතික පත් ප්‍රදානය කිරීම ඉකුත් ඔක්තෝබර් මස 01 වන දින වැලිකන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ දී පැවැත්විණි. නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එස්ජ් කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම උත්සවයේ දී සිංහපුර කනිෂ්ඨ විද්‍යාලයේ සහ නෙළුම් වැව මහා විද්‍යාලයේ සිසුන් 178 දෙනෙක් වෙත සහතික පත් ප්‍රදානය කෙරිණ.

සිසුන්ගේ වර්ණවත් සංස්කෘතික සංදර්ශනයකින් ද සමන්විත වූ මෙම උත්සවය සඳහා වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් එම්.එම්. හයිරුනිෂා මහත්මිය, යුද්ධ හමුදා නිලධාරීන්, සෙසුනිලයින්, දෙමාපියන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.









# විරුවන් නමට දිරිදුන් ඇගයුමක්



නිල්වලා ගඟට පැන සියදිවි නසා ගැනීමට තැත්කළ පුද්ගලයකු බේරා ගැනීමට ක්‍රියා කළ 3 ගැමුණු හේවා බලකායේ නිලධාරියකු සහ සෙසු නිලයින් සිව් දෙනකු හට ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී විසින් පසුගියදා උපහාර පුදන ලදී.

මේ යටතේ ත්‍යාග හා ඇගයීම් හිමිවූයේ නි/8559 මේජර් එස් ඉන්දික, සෙ/20එෆ්00157 ච/සැරයන් දළුවත්ත ඒඩී, සෙ/එෆ්102312 පාසෙ ජයසිංහ ඩීඑම්යූඑස්, සෙ/එෆ්102195 පාසෙ වර්ණකුලසූරිය ඩබ්ලිව්එම්එස් හා සෙ/එෆ්102192 පාසෙ ලක්මාල් කේඑල්ටී යන රණවිරුවන් වෙතය.

නිකරුණේ විනාශවීමට ගිය වටිනා ජීවිතයක් බේරාගැනීම සඳහා තම ජීවිතවලට සිදුවිය හැකි උපද්‍රව නොතකා ක්‍රියාකළ එම රණවිරු පිරිස සමාජයට කදිම ආදර්ශයක් ද යුද්ධ හමුදාවට අභිමානයක් ද අත්කරදී ඇත. යුද්ධ හමුදාව යනු නිරන්තරව එවන් අභීත පුතුන් බිහිකරන තෝතැන්නක් බව මෙමගින් කදිමට සනාථ කොට ඇති අතර, "රණවිරුවා" ද එම අභීත පුතුනට මෙසේ සුබපැතුම් එක්කරයි.



# ආරක්ෂක සේනා ආඥාපති 572 වන පාබල බලසේනාවේ සංචාරයක



ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් ඔක්තෝබර් මස 24 වන දින 572 වන පාබල බලසේනාවේ නිල සංචාරයක නිරත විය. මෙම සංචාරය ආරම්භ වූයේ බලසේනා මූලස්ථානය නැවත ස්ථානගත කිරීම සඳහා අලුතින් යෝජිත භූමි ප්‍රදේශයක් පරීක්ෂා කිරීමෙනි. ස්ථාන ඇගයීමේදී, ආඥාපති විසින් පවතින තත්වය පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ලබාදෙන ලෙස බලසේනාධිපති වෙත උපදෙස් දුන් අතර, මූලස්ථානය නැවත ස්ථානගත කිරීමේදී උපාය මාර්ගික සැලසුම් සහ සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීමේ වැදගත්කම ද අවධාරණය කරන ලදී.




බලසේනා මූලස්ථානය වෙත පැමිණි ආඥාපති 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් කේටීපී සිල්වා ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී විසින් උණුසුම් ලෙස පිළිගනු ලැබීය. තවද, 572 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් ඒපීඒඩීඩී ධර්මකීර්ති ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී පීටීඑස්සී විසින් එම බලසේනාවේ බලප්‍රදේශය, කාර්යයන් සහ එහි වගකීම් පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් ද සිදුකරන ලදී. එහිදී ආඥාපති, 8 ගැමුණු හේවා බළඇණියේ ද සංචාරය කරමින් එහි හටපිරිස් අමතන්නට ද කටයුතු කළේය. තවද, එම බලකායේ ආපදා සහන උපකරණවල ක්‍රියාකාරී සූදානම පිළිබඳව ද ආඥාපති ගේ නිරීක්ෂණයට බඳුන්විය.



# 12 වන පාබල සේනාංකයේ සංචාරයක නිරත වෙමින්





මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් වයිඒබීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ඉකුත් ඔක්තෝබර් මස 30 සහ 31 යන දිනයන්හිදී 12 වන පාබල සේනාංකය, 121 සහ 122 වන පාබල බලසේනා, 20 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව, 18 ගැමුණු හේවා බලකාය, 12 ගජබා රෙජිමේන්තුව සහ 3 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවෙහි සංචාරයන්හි නිරත විය. එහිදී, 12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීකේඩබ්ලිව්ඩබ්ලිව්එම්ජේඑස්බීඩබ්ලිව් පල්ලෙකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ එහි සපැමිණි ආඥාපති වෙත එම භටපිරිස් වෙතින් ද හිමිවූයේ ගෞරවනීය පිළිගැනුමකි.

එහිදී, සේනාංකාධිපති, බලසේනාධිපතිවරු සහ ඒකක අණදෙන නිලධාරීවරු විසින් එම බලප්‍රදේශ පිළිබඳව ආඥාපති වෙත සවිස්තරාත්මක දැනුම්වත් කිරීමක් ද සිදුකරනු ලැබූහ. අනතුරුව භටපිරිස් ආමන්ත්‍රණය කළ ආඥාපති සමාජ මාධ්‍ය වගකීමෙන් යුතුව භාවිතා කිරීම, නීතිවිරෝධී ක්‍රියාවන්ගෙන් වැළකීමේ වැදගත්කම සහ පෞද්ගලික මූල්‍ය කළමනාකරණයේ අවශ්‍යතාව වැනි කරුණු පිළිබඳව අවධාරණය කරන ලදී. සිය සංචාරය අතරතුර එතුමන්, කතරගම ජනාධිපති මන්දිරය සහ යාල ලයා හෝටලය නිරීක්ෂණය කිරීමට ද එක්විය.

# ඉන්දීය උසස් ආරක්ෂක කළමනාකරණ පාඨමාලාවේ නිලධාරීන්ගේ සංචාරය



ශ්‍රී ලංකා සංචාරයක් සඳහා පැමිණි ඉන්දීය උසස් ආරක්ෂක කළමනාකරණ පාඨමාලාව හදාරණු ලබන නිලධාරීන් පිරිසක් ඉකුත් ඔක්තෝබර් මස 17 වන දින මධ්‍යම ආරක්ෂක සේනා මූලස්ථානයෙහි සංචාරයක නිරතවිය.

ඒ අනුව ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් වයිඒබීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී විසින් එම නිලධාරීන්ව ඉතා උණුසුම් අයුරින් පිළිගැනීමෙන් අනතුරුව දෙපාර්ශ්වය විසින් දෙරටේ සන්නද්ධ හමුදාවන් අතර, ඓතිහාසික වශයෙන් පවතින්නාවූ සුහදතාවය සහයෝගීතාවය සහ අන්‍යෝන්‍ය අවබෝධය පිළිබඳව අදහස් හුවමාරු කරගත්හ.






# බෝම්බ සහ වැඩිදියුණු කළ පුපුරණ ද්‍රව්‍ය නිෂ්ක්‍රීය කිරීමේ පාඨමාලාව







"බෝම්බ සහ වැඩිදියුණු කරන ලද පුපුරණ ද්‍රව්‍ය නිෂ්ක්‍රීය කිරීමේ පාඨමාලා අංක - 8" හි විසිරයාම සහ සහතිකපත් ප්‍රදානෝත්සවය ඉකුත් ඔක්තෝබර් මස 04 වන දින ඉංජිනේරු පුහුණු පාසලේ දී පැවැත්විණි.

ශ්‍රී ලංකා ඉංජිනේරු පුහුණු පාසලේ අණදෙන නිලධාරී කර්නල් ජේජ්සීඑස් ජාගොඩ පීඑස්සී ගේ ආරාධනයකට අනුව මෙම අවස්ථාවට ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති සහ ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී වූයේය.

එහිදී, එම පුහුණු පාඨමාලාව හැදෑරූ සිසුහු වැඩිදියුණු කරන ලද පුපුරණ ද්‍රව්‍ය නිෂ්ක්‍රීය කිරීමේ ආදර්ශනයක් ද එළිදැක්වූහ. අනතුරුව, ප්‍රධාන ආරාධිත අමුත්තා සහ කාර්ය නියුක්ත සේනාවිධායක එක්ව පාඨමාලාව හැදෑරූ සිසුන් වෙත බෝම්බ නිශ්ක්‍රීය කිරීමේ ලාංඡන පළඳවනු ලැබූහ. ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ නිලධාරියෙක් සහ සෙසුනිලයන් 23 දෙනෙකු වෙත එහිදී එම ලාංඡන පැළඳ වූ අතර, පාඨමාලාවේ විශිෂ්ට දක්ෂතා දැක්වූ සිසුන් වෙත සහතිකපත් ද පිරිනැමිණි. දක්ෂතා අනුව පාඨමාලාවේ ප්‍රථම ස්ථානය හිමිකරගන්නා ලද්දේ කපිතාන් එන්ආර්ජේ තුඩාවහේවා විසිනි.

මෙම අවස්ථාව සඳහා මේජර් ජෙනරාල් ඩීබීඑල් කොලොන්නෙ යූඑස්පී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉංජිනේරු සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ටීසී පීරිස් ආර්එස්පී යූඑස්පී, 12 වන පාබල සේනාංකයේ නියෝජ්‍ය සේනාංකාධිපති ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයන් රැසක් ද සහභාගී වූහ.

# උසස් ආපදා ප්‍රතිචාර පුහුණු පාඨමාලා අංක 12 සාර්ථකව අවසන්

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආපදා ප්‍රතිචාර පුහුණු මධ්‍යස්ථානය මගින් පවත්වනු ලැබූ උසස් ආපදා ප්‍රතිචාර පුහුණු පාඨමාලා අංක 12, ගම්පොළ පිහිටි එම පුහුණු මධ්‍යස්ථානයේ දී නිමාවට පත්විය. 2024 සැප්තැම්බර් මස 30 වන දින සිට ඔක්තෝබර් මස 16 වන දින දක්වා පැවති මෙම පාඨමාලාව සඳහා සිසුන් 57 දෙනකු සහභාගී වූ අතර, එහිදී ආපදා ප්‍රතිචාර දැක්වීම සහ ආපදා කළමනාකරණය පිළිබඳ ඔවුන්ගේ කුසලතා සහ දැනුම වැඩි දියුණු කෙරිණ.





පාඨමාලා පුහුණු කාලය තුළ දැක්වූ දක්ෂතා වෙනුවෙන් ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ නි/71076 කපිතාන් එන්ජ්එස්එස් නාපාගොඩ එහි පළමු ස්ථානය හිමිකර ගන්නා ලදී. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආපදා ප්‍රතිචාර පුහුණු මධ්‍යස්ථානයේ සේනාවිධායක කර්නල් ආර්එම්එච්පීකේ රත්නායක පාඨමාලාවේ අවසන් දින දේශනය සිදුකරමින් මෙම පාඨමාලාව සඳහා සහභාගී වූ සියලුම දෙනාගේ උත්සාහය පැසසුමට ලක් කරමින් ආපදා ප්‍රතිචාර දැක්වීමේදී සූදානමේ ඇති වැදගත්කම පිළිබඳව කරුණු අවධාරණය කළේය.



# Lead-Acid බැටරි නඩත්තු කිරීමේ වැඩමුළුවක්

ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා රෙජිමේන්තුවේ නිලධාරීන් 25 දෙනෙක් සඳහා Lead-Acid බැටරිවල තාක්ෂණය සහ නඩත්තු කිරීම පිළිබඳ එක්දින වැඩමුළුවක් ඉකුත් ඔක්තෝබර් මස 11 වන දින රත්මලාන 'Elcardo' කර්මාන්ත ශාලාවේ දී පැවැත්විණ.



මෙම වැඩමුළුවට කර්මාන්තශාලාව තුළ නිරීක්ෂණ සංචාරයක් සහ Lead-Acid බැටරි නිෂ්පාදන ක්‍රියාවලීන් සහ නඩත්තු ක්‍රියා පටිපාටීන් පිළිබඳව දැණුම්වත් කිරීමක්ද ඇතුළත් විය. ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ සාමාජිකයන් ගේ කුසලතා වැඩි දියුණු කිරීම හා එම සාමාජිකයින් හට වටිනා අත්දැකීම් ලබාදීමේ අරමුණින් ක්‍රියාත්මක මෙම වැඩසටහන විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ ගේ මගපෙන්වීමෙන් ආරම්භ කෙරිණ.



# එක්සත් ජාතීන්ගේ සිවිල් පුද්ගලයන් ආරක්ෂා කිරීමේ පාඨමාලා අංක - 02

ගෝලීය සාම මෙහෙයුම් මුලපිරීමේ අයතනය (Global Peace Operations Initiative) විසින් අනුග්‍රහය දක්වන ලද එක්සත් ජාතීන්ගේ සිවිල් පුද්ගලයන් ආරක්ෂා කිරීමේ පාඨමාලා අංක 02 ශ්‍රී ලංකා සාම සාධක මෙහෙයුම් පුහුණු ආයතනයේ දී පසුගියදා අවසන් විය.



ඉකුත් සැප්තැම්බර් මස 30 වන දින සිට ඔක්තෝබර් මස 04 වන දින දක්වා පැවති මෙම පාඨමාලාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරීන් 23 දෙනෙක්, නාවික හමුදාවෙන් නිලධාරියෙක්, ගුවන් හමුදාවෙන් නිලධාරීන් දෙදෙනෙක් මෙන්ම බංග්ලාදේශය, මොංගෝලියාව සහ නේපාලය යන රටවල නිලධාරීන් 5 දෙනෙක් සහභාගී වූහ.

එක්සත් රාජධානියේ රොජර් ඩේවිඩ් හියුස් මහතාගේ නායකත්වයෙන් යුත් විෂය කරුණු පිළිබඳ විශේෂඥයින් හතර දෙනකුගෙන් යුත් කණ්ඩායමක් මෙම පුහුණුව සඳහා පහසුකම් සැපයූහ. මෙම පාඨමාලා අවසන් අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස සහභාගී වූ ශ්‍රී ලංකා සාම සාධක මෙහෙයුම් පුහුණු ආයතනයේ සේනාවිධායක බ්‍රිගේඩියර් එස්ජ් හෙට්ටිගේ ආර්එස්පී පීඑස්සී ගේ සුරතින් පාඨමාලාවට සහභාගී වූවන් වෙත සහතික පත් ප්‍රදානය කෙරිණ.



# රණවිරු දෑතින් නව නිවසක්



51 වන පාබල සේනාංකායේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීජේකේ විමලරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් වංකානෙයි ප්‍රදේශයේ වෙසෙන සෙල්වරාසා සුදාකරන් සහ ඔහුගේ පවුලේ සාමාජිකයින් වෙනුවෙන් ඉදිකරන ලද නව නිවසක් පසුගිය ඔක්තෝබර් මස 09 වන දින එම පවුල වෙත භාරකෙරිණ.



යුද්ධ හමුදාවේ 75 වන සංවත්සරයට සමගාමීව ඉදිකළ මෙම නිවස සෑදීම සඳහා මූල්‍ය දායකත්වය ලබාදී ඇත්තේ වලිකාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ දානපති වී. තබෝධරන් මහතා විසිනි. 513 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඊඑම්එල්පී ඒකනායක යූඑස්පී ගේ අධීක්ෂණය යටතේ 11 වන පාබල හමුදාවේ අණදෙන නිලධාරී හා එහි හටපිරිස් මේ සඳහා ශ්‍රම දායකත්වය ලබාදුන්හ.

# 75 වන යුද්ධ හමුදා සංවත්සරය සමරා ප්‍රජාසත්කාර රැසක්







ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අභිමානවත් 75 වන සංවත්සරයට සමගාමීව 522 වන පාබල බලසේනාවේ වැඩබලන බලසේනාධිපති කර්නල් එස්එම්සීඑස් සමරතුංග ආර්එස්පී ගේ අධීක්ෂණයෙන් ප්‍රජාසත්කාරක වැඩසටහන් රැසක් දියත් කෙරිණ. ඒ අනුව එම බලසේනාව යටතේ ස්ථාපිත 23 ගැමුණු හේවා බලකායේ වැඩබලන අණදෙන නිලධාරී මේජර් එච්ජීටීජේ හපුරුගල ඇතුළු එහි හටපිරිස් එකතුව මුල්ලෙයඩි ග්‍රාමසේවා වසමේ පිහිටි විනයාගර් පෙර පාසලේ ළමුන් සඳහා දිවා ආහාර වේලක් පිරිනමනු ලැබුහ.



තවද, 10 විජයබාහු පාබල රෙජිමේන්තු අණදෙන නිලධාරී මේජර් එස්එච් සුදුසිංහ ගේ උපදෙස් පරිදි එම ඒකක හට පිරිස් විසින් මරදන්කේණි රෝහලේ කාර්ය මණ්ඩලයට සහ එහි බාහිර ප්‍රතිකාර සඳහා පැමිණෙන රෝගීන් සඳහා පෝෂ්‍යදායී දිවා ආහාර වේලක් පිරිනැමීම ද සිදුකරන ලදී. එසේම, 1 යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව ද තවත් ප්‍රජාසත්කාරයකට දායක විය. එහි අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් පීආර් අතපත්තු යූඑස්පී ගේ මගපෙන්වීමෙන් එහි හටපිරිස් එකතුව සිදුකළ එම සත්කාරය මඟින් මුහාවිල් ග්‍රාමසේවා වසමේ පිහිටි ඉරම්බරෙයි පෙර පාසලේ ළමුන් සහ අදාවන් පෙර පාසලේ ළමුන් සඳහා පෝෂ්‍යදායී ආහාර වේලක් පිරිනැමුණි.

# ලේ දන්දීමේ වැඩසටහනක්



11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේජ්යූ කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී ගේ අදහසකට අනුව දිගන ප්‍රජා සංවිධානයේ සහයෝගය ඇතිව සංවිධානය කෙරුණු ලේ දන්දීමේ වැඩසටහනක් පසුගිය ඔක්තෝබර් මස 12 වන දින දිගන සිල්වක්‍රෝස් වෛද්‍ය මධ්‍යස්ථානයේ දී පැවැත්විණ. මේ සඳහා ප්‍රදේශවාසී සිවිල් ජනතාව විශාල පිරිසක් එක්වූහ.

# තුවාල ලැබූ ශ්‍රී ලංකා සෙබළාගේ සුවදුක් විමසයි



එක්සත් ජාතීන්ගේ අතුරු බලකා මූලස්ථානයේ (UNIFIL) දූත මණ්ඩල ප්‍රධානී සහ බලසේනාධිපති ලුතිනන් ජෙනරාල් ඇරොල්ඩෝ ලසරෝ සෙන්ස් (Lieutenant General Aroldo Lazaro Saenz) සමඟින් ශ්‍රී ලංකා මූලස්ථාන ආරක්ෂක භට කණ්ඩායමේ අණදෙන නිලධාරි 2024 ඔක්තෝබර් මස 12 වන දින ලෙබනනයේ, "ටයිරේ" (Tyre) ප්‍රදේශයේ පිහිටි ජබෙල් ආමෙල් (Jabel Amel) රෝහලේ සංචාරයක නිරතවූහ. ලෙබනනයේ, නකෝරා ප්‍රදේශයේ ස්ථාපිත ලෙබනන් එක්සත් ජාතීන්ගේ අතුරු බලකා මූලස්ථානයේ ආරක්ෂක රාජකාරීන්වල යෙදී සිටියදී තුවාල ලැබූ ශ්‍රී ලාංකික යුද හමුදා සෙබළාගේ සුවදුක් විමසීම එහි අරමුණ විය.

මෙම සංචාරයේ දී දූත මණ්ඩල ප්‍රධානී තුවාල ලැබූ සෙබළා වෙනුවෙන් සිය කණගාටුව ප්‍රකාශ කළ අතර, ඔහුගේ වත්මන් ප්‍රතිකාර තත්ත්වය පිළිබඳව ද සොයාබැලීය. එසේම, එම රෝහල් වෛද්‍ය බලධාරීන් හමුවී එක්සත් ජාතීන්ගේ අතුරු බලකා මූලස්ථාන කාර්ය මණ්ඩලය වෙනුවෙන් ලබාදෙන ප්‍රතිකාර උසස් මට්ටමින් සිදුකිරීමේ වැදගත්කම පිළිබඳව ද එතුමන් පෙන්වා දුන්නේය. එම රෝහල් පරිශ්‍රයෙන් නික්ම යාමට ප්‍රථම එතුමන් රණකෂිතයට පත්ව සිටින එම සෙබළාගේ කාර්යභාරය ද ඇගයීමට ලක්කරමින් එක්සත් ජාතීන්ගේ අතුරු බලකා මූලස්ථානයේ සමරු කාසියක් ද ඔහුට පිරිනැමීය.



# ලෝක ළමා දිනයට සමගාමීව පාසල් උපකරණ බෙදාදීමක්





241 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එල්එස්ඩීඑන් පතිරත්න ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස් හා සම්බන්ධීකරණයෙන් එම පාබල බලසේනාවේ භටපිරිස් ලෝක ළමා දිනයට සමගාමීව අම්මාන් මහරිල්ලා කාන්තා ළමා නිවාසයේ සිසුවියන් 34 දෙනෙක් සඳහා පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබූහ. තවද, එහිදී එම කාර්ය මණ්ඩලය ඇතුළු සියලුම දැරියන් සඳහා දිවා ආහාර වේලක් පිරිනැමීමට ද කටයුතු කෙරිණ.

# යුද්ධ හමුදා වෛද්‍ය බලකා කණ්ඩායමේ සේවය ජාත්‍යන්තර ඇගයුමට







දකුණු සුඩානයේ SRIMED දෙවන මට්ටමේ රෝහලේ සේවයේ නියුතු 10 වන යුද්ධ හමුදා වෛද්‍ය බලකා කණ්ඩායමේ සේවය ඇගයීමට ලක්කරමින් ඉකුත් ඔක්තෝබර් මස 17 වන දින බෝර් ප්‍රදේශයේ පිහිටි එම රෝහල් පරිශ්‍රයේ දී ඔවුන් වෙත එක්සත් ජාතීන්ගේ සාමසාධක පදක්කම් පිරිනැමිණි.

එහිදී, 10 වන යුද්ධ හමුදා වෛද්‍ය බලකා කණ්ඩායමේ නිලධාරීන් 17 දෙනකු සහ සෙසුනිලයන් 48 දෙනකු වෙත පදක්කම් පිරිනැමිණි. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දකුණු සුඩාන මෙහෙයුමේ (UNMISS) අණදෙන නිලධාරී ලුතිනන් ජෙනරාල් මොහාන් සුබ්‍රමනියන් ඔවුන්ගේ වෘත්තීයභාවය සහ කැපවීම ඇගයීමට ලක්කළේය.

# සංචාරයක සටහන්





59 වන පාබල සේනාංකයේ නව සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීආර්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ඉකුත් ඔක්තෝබර් මස 02 වන දින 593 වන පාබල බලසේනාව, 6 ගැමුණු හේවා බළඇණිය සහ 6 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ සංචාරයක නිරත විය. 593 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් යූඑස්බී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී විසින් එහිදී එම බලප්‍රදේශය තුළ හටපිරිස් ස්ථානගත කිරීම්, මෙහෙයුම් කාර්යභාරයන් හා දෛනික රාජකාරී පිළිබඳ සේනාංකාධිපති දැනුම්වත් කළහ.

සිය සංචාරයේ දී හටපිරිස් සමඟ සුහද සාකච්ඡාවක ද නිරත සේනාංකාධිපති ඔවුන්ගේ පාලන අවශ්‍යතා සොයාබලමින් රාජකාරී පිළිබඳ ඇගයීමට ද ලක්කළේය. මෙම අවස්ථාවට එම සේනාංකයේ නියෝජ්‍ය සේනාංකාධිපති බ්‍රිගේඩියර් කේඑච්එන්පී හැන්නදිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ද සහභාගී විය.

# FERENTINO Tyre Corporation එක්දින වැඩමුළුවක්





ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ටයර් නිෂ්පාදන ආයතනයක් වන FERENTINO Tyre Corporation පුද්ගලික සමාගම වෙතින් යුද්ධ හමුදා සාමාජිකයන් වෙනුවෙන් මෙහෙයවූ එක්දින අධ්‍යාපනික වැඩමුළුවක් ඉකුත් ඔක්තෝබර් මස 25 වන දින පවත්වනු ලැබීය. මෙම වැඩමුළුවේදී, එම කර්මාන්ත ශාලාවේ සංචාරයක් සමඟින් විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු සාමාජිකයන්ගේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා නිර්මාණය කරනු ලැබූ තාක්ෂණික සැසියක් ද පැවැත්විණි.



විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් පී විතානගේ ගේ ඉල්ලීමකට අනුව පැවැත්වූ මෙම වැඩමුළුවේ දී, ටයර් පිරිවිතර පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් ලබාදුන් අතර විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු නිලධාරීන්ට අත්‍යවශ්‍ය අවබෝධයක් ලබාදෙමින් ටයර් නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ ආදර්ශන ද ඉදිරිපත් කරන ලදී. විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා නිලධාරීන් 25 දෙනෙක් මෙම අවස්ථාවට සහභාගී වූ අතර, එහිදී ලබාදුන් වටිනා දැනුම් සම්භාරය වෙනුවෙන් ඔවුන් එම සමාගමේ නිලධාරීන් වෙත සිය කෘතඥතාව පුදකළහ.

# දෘශ්‍යාබාධිත පුද්ගලයින් සඳහා ඇස් කණ්නාඩි බෙදාදීමක්

12 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුව විසින් සංවිධානය කළ ඇස් කන්නාඩි ප්‍රදානය කිරීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් මස 02 වන දින කාක්යන්කුලම් ප්‍රජා ශාලාවේ දී පැවැත්විණ. මෙම අක්ෂි පරීක්ෂණ සායනය සහ නොමිලේ ඇස් කන්නාඩි බෙදාදීම හරහා ප්‍රදේශවාසීන්ගේ එතෙක් පැවති දැවෙන ගැටලුවකට විසඳුම් ලබාදීම අරමුණ විය. මෙහිදී, සිවිල් වැසියන් 102 ක් වෙනුවෙන් ඇස් කන්නාඩි ප්‍රදානය කරන ලද අතර, මෙහි නොමසුරු දායකත්වය සහකාර නැවත පදිංචි කිරීම් සහ පුනරුත්ථාපන සංවිධානයේ (UK & SRI LANKA) සභාපති ආචාර්ය වී සර්වේෂ්වරන් මහතා විසින් දරණ ලදී.

56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාව සඳහා 562 වන පාබල බලසේනාවේ බලසේනාධිපති සහ 12 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ඇතුළු පිරිසක් සහභාගී වූහ. තවද, කාක්යන්කුලම් දේවස්ථානයේ සභාපති බසීර් මහතා ද මෙම අවස්ථාවට එක්විය.





# ලේ දන්දීමේ වැඩසටහනක්





යුද්ධ හමුදා 75 වන සංවත්සරයට සමගාමීව 212 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ආර්එම්සී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණය යටතේ එම බලසේනාව මගින් සංවිධානය කළ රුධිරය පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් මස 07 වන දින පැවැත්විණ. 21 වන පාබල සේනාංකය යටතේ පාලනය වන බසේමු සහ ඒකකවලට අයත් නිලධාරීන් සහ සෙබළුන් 173 දෙනෙක් මේ සඳහා සහභාගී වූහ.

# දෙරණට සෙවණක්



ශ්‍රී ලංකා යුද හමුදාවේ 75 වැනි සංවත්සරයට සමගාමීව පාරිසරික තිරසරභාවය ප්‍රවර්ධනය කිරීමේ සුවිශේෂී පියවරක් ලෙස 57 වන පාබල සේනාංකය මගින් සංවිධානය කළ රුක් රෝපණ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් මස 08 වන දින දියත් කෙරිණ. මේ සඳහා පාන්ගොල්ලේ පිහිටි කඳවුරු පරිශ්‍රයේ දී එම සේනාංක හටපිරිස් හා ප්‍රජා සාමාජිකයින් එක් වූ අතර, එහිදී සෑම සහභාගී වූ අයකුටම පැළයක් සිටුවීමට අවස්ථාව ලබාදීම විශේෂත්වයකි.



මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්පීඑම් විජේසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ මඟපෙන්වීම යටතේ, සංවිධානය කෙරුණු මෙම වැඩසටහනට ප්‍රදේශයේ ගරු පියතුමා සමග "ජනසෙත ආයතනයේ" තුසිත ප්‍රියංග මහතා සහ ඔහුගේ කණ්ඩායම දායක වූහ. කලාපයේ හරිත ගහනය වැඩිදියුණු කිරීමේ අරමුණින් සිදුකෙරුණු මෙම වැඩසටහන හරහා පැළ 300කට අධික සංඛ්‍යාවක් රෝපණය කෙරිණ.

# ඒකක සංචාරයක්





561 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් බීඩී ප්‍රනාන්දු යූඑස්පී එච්ඩීඑම්සී පීඑස්සී පසුගියදා 10 ශ්‍රී ලංකා පාබල හමුදාවේ හා 16 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සංචාරයක නිරත විය. එහිදී, එම ඒකකයන්හි පාලන ගැටලු හා ඔවුන්ගේ සුබසාධන අවශ්‍යතා පිළිබඳ සොයා බැලූ හෙතෙම ඒකක සාමාජිකයින් සමඟ සුහද කථාබහක ද නිරතවූහ.

# සංචාරයක සටහන්



61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ලෙස නවතමයෙන් වැඩ භාරගත් බ්‍රිගේඩියර් කේටීපී ද සිල්වා ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ඉකුත් ඔක්තෝබර් මස 16 වන දින 613 වන පාබල බලසේනාවේ සිය මංගල නිල සංචාරය සිදුකරන ලදී. එහිදී, එහි බලසේනාධිපති බ්‍රිගේඩියර් එස්එන්එම්ජ්බී අරම්බෙපොල ආර්ඩබ්ලිව්පී ඇතුළු එම හටපිරිස් වෙතින් ඔහු වෙත ලැබුණේ ගෞරවනීය පිළිගැනුමකි. සිය සංචාරයේ දී හටපිරිස් ඇමතීමට ද කටයුතු කළ සේනාංකාධිපති ඔවුනගේ රාජකාරී හා පාලන අවශ්‍යතා ගැටලු ආදිය ද සොයා බැලීය.

අනතුරුව, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ 9 වන බළඇණිය සහ ගැමුණු හේවා බළඇණිය වෙත ද ගිය සේනාංකාධිපති ඔවුන්ගේ ආරක්ෂක කුටි, අවි ගබඩාව, වෛද්‍ය පහසුකම්, කාර්යාල සංකීර්ණ, නවාතැන්, සුභසාධන පහසුකම් ඇතුළු තවත් දේ ද නිරීක්ෂණය කළේය.






# ප්‍රථම නිල සංචාරය සිදුකරමින්





22 වන පාබල සේනාංකයේ නව සේනාංකාධිපති වශයෙන් පත් වූ මේජර් ජෙනරාල් යූකේඩීඩීපී උඩුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සිය රාජකාරී භාරගැනීමෙන් අනතුරුව ඉකුත් සැප්තැම්බර් මස 18, 19 සහ 20 යන දිනයන්හිදී එම සේනාංකය යටතේ ඇති 221, 222 සහ 223 වන පාබල බලසේනාවල සහ ඒ යටතේ ඇති බළඇණිවල තම ප්‍රථම නිල සංචාරය සිදුකරන ලදී. සේනාංක බලප්‍රදේශ පිළිබඳ අවබෝධයක් ලබාගැනීම, ඒ යටතේ ඇති බලසේනා සහ ඒකකයන්හි ස්ථානගතවීම්, රාජකාරී ස්වභාවය හා ඔවුනගේ පරිපාලන ගැටලු පිළිබඳ අධ්‍යයනය කිරීම එහි අරමුණ විය.





සේවා වනිතා
සේවා

# "Army Seva Vanitha Wetland Cafe"



Celon Cold Stores PLC (CCS) සමාගමේ පූර්ණ අනුග්‍රහයෙන් ඉදිකරන ලද "Army Seva Vanitha Wetland Cafe" අවන්හල ජනතාවගේ ප්‍රයෝජනය සඳහා පසුගිය ඔක්තෝබර් මස 01 වන දින විවෘත කෙරිණ. ලෝක ළමා දිනය නිමිත්තෙන් සිදුකෙරුණු මෙම කටයුත්තට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ප්‍රධානත්වය දැරුවාය.




එහිදී, විරු කැකුළු පෙර පාසල් දරු දැරියන් සහ පැමිණ සිටි අනෙකුත් දරු දැරියන් 450 කට අධික පිරිසක් සඳහා Ceylon Cold Stores PLC (CCS) සමාගම වෙතින් කෙටි ආහාර වේලක් සහ අයිස්ක්‍රීම් ලබාදීමට ද කටයුතු කෙරිණ. තවද, එහිදී දූ දරුවන් වෙනුවෙන් සංවිධානය කරන ලද තරඟ ඉසව් රැසක් ද පැවති අතර, එහි ජයග්‍රහණය කරන ලද දරුවන් සඳහා ත්‍යාග පාර්සල් ද පිරිනැමිණ.



මෙම අවස්ථාවට යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන මෙන්ම ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ විධායක කමිටුවේ සහකාර මහජන සම්බන්ධතා නිලධාරී මෙන්ම පනාගොඩ හා මැනිංටවුන් විරු කැකුළු පෙර පාසල් අධීක්ෂණ භාර ජ්‍යෙෂ්ඨ සාමාජිකා සුරංගි අමරපාල මහත්මිය, Ceylon Cold Stores PLC (CCS) ආයතනයේ විධායක නිලධාරීන් ඇතුළු යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයෙහි සාමාජිකාවෝ රැසක් ද සහභාගී වූහ.



තවද, මුල්ලේරියා ජාතික මානසික විද්‍යායතන අතරමැදි නිවස්නයේ වාට්ටු අංක 06 හි නේවාසිකව ප්‍රතිකාර ලබන කාන්තාවන් හට දිවා ආහාරය ලබාදීම සහ එම වාට්ටුවට අවශ්‍ය පොදු අවශ්‍යතාවන් සපුරාලීමේ කටයුත්තක් ද ඉකුත් ඔක්තෝබර් 30 වන දින එම රෝහල් පරිශ්‍රයේ දී සිදුකෙරිණ. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ බ්‍රිගේඩියර් (සම්බන්ධීකරණ) බ්‍රිගේඩියර් එන් මහවිතාන කේඑස්පී එම අවස්ථාවට ප්‍රධානත්වය දැරීය. එහිදී, එම රෝහලේ වාට්ටු අංක 06 හි ගොඩනැගිල්ල හා අවට පිරිසිදු කිරීම මෙන්ම එහි අලුත්වැඩියා කටයුතු ද ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ රාජකාරී කරනු ලබන අයවලුන්ගේ ශ්‍රම දායකත්වයෙන් සිදුකෙරිණ.









සේවා වනිතා

# සේවා

රණවිරු සේවා අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන සෙනෙහස අධ්‍යාපන සම්පත් පර්යේෂණ සහ තොරතුරු කේන්ද්‍රයෙහි ඉගෙනුම ලබන දුවා දරුවන්ගේ සුවදුක් සොයාබැලීම සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ඉකුත් ඔක්තෝබර් මස 25 වන දින එම කේන්ද්‍රයෙහි සංචාරයක නිරත වූවාය. එහි සේනාවිධායක බ්‍රිගේඩියර් ජීජීආර් මාදුගොඩ යූඑස්පී ගේ පිළිගැනුම් මධ්‍යයේ සපැමිණි සභාපතිතුමිය පංති කාමර වෙත ගොස් එම දුවා දරුවන්ගේ සුවදුක් විමසනු ලැබුවාය. අනතුරුව එම කේන්ද්‍රයෙහි ඉදිකර ඇති පිහිනුම් තටාකය පිරිසිදු කිරීම සඳහා අවැසි පවිත්‍රතා ද්‍රව්‍ය හා ආම්පන්න පරිත්‍යාගයක් ද සිදුකරන ලදී. තවද, එහි දුවා දරුවන්ගේ සුබසාධන අවශ්‍යතා ඇතුළත් ත්‍යාග පාර්සල් ද වානේ අල්මාරි 02 ක් ද පිරිනැමීය.





ශ්‍රී ලංකා මාතෘ භූමියේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාව වෙනුවෙන් තම කායදානය ලබාදී රණක්ෂිතයට පත්ව පාන්ගොල්ල අභිමංසල III සුවසහන නිකේතනයෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන වීරෝදාර රණවිරුවන්ගේ සුවදුක් විමසීම සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ඉකුත් ඔක්තෝබර් මස 11 වන දින සංචාරයක නිරත වූවාය. එහිදී, ප්‍රතිකාර ලබන රණවිරුවන් තිදෙනකු විසින් කරන ලද ඉල්ලීමකට අනුව ඔවුන් වෙත විද්‍යුත් රෝදපුටු 03 ක් සහ උපස්ථායකයින් සඳහා වියළි සලාක මළු 28 ක් පරිත්‍යාග කිරීම ද සිදුකෙරිණ. අභිමංසල III සුවසහන නිකේතනයෙහි සේනාවිධායක බ්‍රිගේඩියර් ජීආර්එස් ධර්මරත්න යූඑස්පී ද එම අවස්ථාවට එක්විය. අනතුරුව, සභාපතිතුමිය සුවසහන නිකේතනයේ නේවාසිකව ප්‍රතිකාර ගනු ලබන රණවිරුවන් සමඟ කතාබහක නිරත වෙමින් ඔවුන්ගේ අවශ්‍යතාවන්, පවුලේ සාමාජිකයින්ගේ පවතින ගැටලු ආදිය පිළිබඳව ද කරුණු විමසනු ලැබූ අතර, එම රණවිරුවන් විසින් නිපදවන අත්කම් නිර්මාණ ද ඇගේ නිරීක්ෂණයට බඳුන් වූවාය.



## සේවා වනිතාවෙන් දිවියට සවියක්

යුද්ධ හමුදාවේ රාජකාරී නියුතු සිවිල් සේවක මහත්ම මහත්මීන් 100 දෙනකු සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළත් වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් මස 16 දින යුද්ධ හමුදා සේවා වනිතා ඒකක කාර්යාලයේදී සිදුකෙරිණ.



තවද, එහිදී අභිමංසල II - කඹුරුපිටියෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ඉදිකර ඇති පිහිනුම් තටාකයට අවශ්‍ය පවිත්‍රතා ද්‍රව්‍ය බෙදාදීමටද කටයුතු කෙරුණි. මෙම අවස්ථාවට යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ප්‍රධානත්වය දැරුවාය.

මාතලේ ප්‍රදේශයේ ඇති දුෂ්කර පාසල් දෙකක් වන මප/ග/නිරංගමුව කනිෂ්ඨ විදයාලය හා මප/ග/නිලන්නොරුව කනිෂ්ඨ විද්‍යාලයේ දූ දරුවන් සඳහා පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනියගේ ප්‍රදානත්වයෙන් ඉකුත් ඔක්තෝබර් මස 11 වන දින මප/ග/නිරංගමුව කනිෂ්ඨ විදයාල පරිශ්‍රයේදී පැවැත්විණ.





# දරු දිරියට විරු සරණක්



# ලෝක ළමා දින සමරා





පසුගිය ඔක්තෝබර් මස 01 වන දිනට යෙදුණු ලෝක ළමා දිනයට සමගාමීව කොළඹ ප්‍රදේශයේ ළදරු සංවර්ධන මධ්‍යස්ථානයක නේවාසික දරු දැරියන් වෙනුවෙන් සංවිධානය කෙරුණු සැමරුම් වැඩසටහනක් පැවැත්විණ. එහිදී, එම මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සඳහා ද අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හා භාණ්ඩ ඇතුළත් ත්‍යාග පාර්සල් බෙදාදෙන ලදී. වැඩසටහන අවසානයේ එම නේවාසික දරු දැරියන් වෙනුවෙන් දිවා ආහාරය ද පිරිනමන ලද අතර, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය මෙම අවස්ථාවන් සඳහා ප්‍රධානත්වය දැරුවාය.







## විරු දිරියෙන් විරුවකුට සෙවනක්

2(සෙවි) යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශුසම්පත් බලකායට අයත් කුලියාපිටියේ පදිංචි සෙ/ඩබ්01012 කෝප්‍රල් රණතුංග ආර්එච්එම්එස් යන කොනොනි ඇතුළු ඔහුගේ පවුලේ සැම වෙනුවෙන් හිසට සෙවනක් සදන්නට කෘෂිකර්ම හා පශුසම්පත් බලකා සේවා වනිතා ශාඛාව මැදිහත් විය. බොහෝ ආර්ථික දුෂ්කරතා අතරේ තමන්ගේම නිවසක සිහිනය දකිමින් සිටි ඔහුට එය යථාර්ථයක් කරලමින් ඉකුත් ඔක්තෝබර් 22 වන දින මෙම නිවස ඉදිවූයේ කෘෂිකර්ම හා පශුසම්පත් බලකාය මගින් ප්‍රථම වරට ඉදිකළ නිවස ලෙස ද සනිටුහන් කරමිනි.

එම රෙජිමේන්තු බලකාධිපති මේජර් ජෙනරාල් එස්ජ් කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පි වීඑස්වී යූඑස්පී පීඑස්සීගේ උපදෙස් මත එහි සේවා වනිතා සභාපතිනි වරුණි කුලතුංග මත්මියගේ අධීක්ෂණයෙන් ඉදිකළ මෙම නිවස එම  කොනොනි වෙත පවරාදීම යුද හමුදා සේවා වනිතා ශාඛා සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි. මෙහි ඉදිකිරීම් සඳහා 2 (සෙවි) කෘෂිකර්ම හා පශුසම්පත් බලකායේ අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් රසික කුමාරගේ අධීක්ෂණයෙන් එහි හටපිරිස් දායක වූහ.





## රණවිරු දිරියට සේවා වනිතාවෙන් අත්වැලක්

සක්‍රිය සේවයේ යෙදී සිටින තම නිවස ඉදිකර ගැනීමේ කටයුතු අවසන් කර නොමැති රණවිරුවන් වෙනුවෙන්  ක්‍රියාත්මක අර්ධ නිවාස වැඩපිළිවෙල යටතේ තෝරාගත් රණවිරුවකු වෙත පසුගිය ඔක්තෝබර් මස 04 වන දින නිවසක් ඉදිකර පරිත්‍යාග කෙරිණ. ඒ යටතේ 5 (සෙවි) ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් සෙ/9ඩී01361 සැරයන් විතානගේ ඩබ්ලිව්එස් යන රණවිරුවා වෙත අදාළ නිවස හිමිවිය. පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ මූල්‍ය දායකත්වයෙන් සහ 5 (සෙවි) ශ්‍රී ලංකා පාබල හමුදාවේ හටපිරිස්හි ශ්‍රමදායකත්වයෙන් නිවසේ ඉදිකිරීම් කටයුතු සිදුකෙරිණ. තවද, 4 ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් සෙ/319087 සැරයන් කුමාරගේ කේඩීආර් යන රණවිරුවාගේ නිවස ද එම සේවා වනිතා ශාඛාවේ මුල්‍ය දායකත්වයෙන් හා 4 ශ්‍රී ලංකා පාබල හමුදාවේ හටපිරිස්හි ශ්‍රමදායකත්වයෙන් ඉදිකිරීම් කටයුතු අවසන් කර ඉකුත් ඔක්තෝබර් මස 05 වන දින ඒකක අණදෙන නිලධාරීන් සහ සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්ගේ ප්‍රධානත්වයෙන් භාරදීමට කටයුතු කෙරිණ.





## ජන දිවියට වාරුවක් ඉගෙනුමට දිරියක්

ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාව මගින් රණවිරු දිරිය විරිය වෙනුවෙන් සංවිධානය කළ සුබසාධක වැඩසටහන් රැසක් ඉකුත් ඔක්තෝබර් මස 19 වන දින 2 (සෙවි) ගැහේබ ඒකකයේ දී ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ වෛද්‍ය ආධාර වෙනුවෙන් රු. 155000.00 ක්ද, ආපොස (සා/පෙළ) විභාගයෙන් විශිෂ්ට සමාර්ථ ලබාගත් දරුවන් දෙදෙනකු වෙනුවෙන් රු.50000.00 බැගින් ද රණවිරු පවුල් දෙකක් සඳහා රු.15,000.00 ක් බැගින් වූ වවුචර්පත් ද, රු.8500.00 ක් වටිනා පාසල් උපකරණ කට්ටල 15 ක්ද පිරිනැමුණි. එම රෙජිමේන්තු සේවා වනිතා සභාපතිනි මනෝරී වෙලගෙදර මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම උත්සවයට එහි සමාජිකාවෝ රැසක් ද එක්වූහ.

# සුභ මොහොතින් නව තනතුරක



ගජබා රෙජිමේන්තු සේවා වනාති ශාඛාවේ නව සභාපතිනිය ලෙස ප්‍රියංගා වික්‍රමසිංහ මහත්මිය පසුගියදා එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සිය ධූරයේ රාජකාරී ආරම්භ කරනු ලැබුවාය.



ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ 26 වන සභාපතිනිය ලෙස චතුරි සුමේධා මහත්මිය ඉකුත් ඔක්තෝබර් මස 23 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සිය ධූරයේ රාජකාරී ආරම්භ කරනු ලැබුවාය.





## ලෝක ළමා දිනය වෙනුවෙන් සත්කාරයක්

විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව මගින් ලෝක ළමා දිනයට සමගාමීව මලියදේව පිරිමි ළමා නිවාසයේ නේවාසික ළමුන්ගේ මානසික සහ අධ්‍යාත්මික සුවතාවය වර්ධනය කිරීම වෙනුවෙන් වැඩසටහනක් පවත්වන ලදී. ඒ අනුව ඉකුත් ඔක්තෝබර් මස 05 වන දින එම දරු දැරියන් හට ජාතික සත්ව උද්‍යානය, නෙළුම් කුළුන සහ ගාලු මුවදොර සංචාරය කිරීමේ අවස්ථාවක් උදාකර දුන්හ. මේ සඳහා විජයබාහු පාබල රෙජිමේන්තු අධිපති මෙන්ම 14 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී සහ එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි දමයන්ති බණ්ඩාරනායක මහත්මිය ඇතුළු සේවා වනිතා සාමාජිකාවෝ පිරිසක් සහභාගී වූහ. එහිදී, තෝරාගත් ළමුන් තිදෙනෙක් සඳහා පාසල් පාවහන් ද පරිත්‍යාග කෙරුණු අතර, ඒ සඳහා මධුවන්ති ගාල්ලගේ මහත්මිය මූල්‍ය දායකත්වය දැරුවාය.





## ළමා සුරැකුම් මධ්‍යස්ථානයේදී වැඩසටහන් රැසක්

දඹුල්ල රජමහා විහාරයෙහි පවත්වා ගෙන යනු ලබන ශ්‍රී ජිනරතන ළමා සුරැකුම් මධ්‍යස්ථානයේ දී ඉකුත් ඔක්තෝබර් මස 12 වන දින ආගමික හා ප්‍රජාසත්කාරක වැඩසටහන් රැසක් සිදුකෙරිණ. මේ සඳහා යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නිලන්ති වනසිංහ මහත්මියගේ මඟපෙන්වීම මත එම සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ රැසක් එක්වූහ. එහිදී, එම මධ්‍යස්ථානය සුද්ධ පවිත්‍ර කිරීම මෙන්ම දානමය පිංකමක් හා පරිත්‍යාග පිරිනැමීමේ වැඩසටහනක් ද පැවැත්විණ. තවද, ළමා සුරැකුම් මධ්‍යස්ථානයේ ළමුන් 30 දෙනෙක් සඳහා විනෝදාස්වාද වැඩසටහනක් ද දිවා ආහාරය පිරිනැමීම ද සිදුකරන ලදී. 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති හා යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්එස්සීකේ වනසිංහ ආර්එස්පී යූඑස්පී සහ යාන්ත්‍රික පාබල රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ඒකේ පීරිස් ආර්එස්පී ගේ මගපෙන්වීමෙන් මෙම මාහැඟි කටයුත්ත සංවිධානය විය.

# විශේෂ බලකායට විශේෂ පරිත්‍යාගයක්



යුද්ධ හමුදා විශේෂ බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි අනෝජා පීරිස් මහත්මියගේ ප්‍රධානත්වයෙන් සංවිධානය කෙරුණු වියළි සලාක සහ පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් මස 06 වන දින විශේෂ බලකා මූලස්ථානයේදී පැවැත්විණ. එහිදී, එම බලකායේ රාජකාරී නියුතු සිවිල් සේවක සමාජිකයින්ට හා ඔවුනගේ දූ දරුවන්ට ප්‍රතිලාභ හිමිවිය.

# විරු පවුල් වෙත දිරියක්



හබරකඩ ඉංජිනේරු සේවා මධ්‍යම වැඩපලෙහි සේවයේ නියුතු සෙබළුන්ගේ අලුත උපන් බිළිඳුන් සහ පවුලේ සාමාජිකයින් වෙත වියළි සලාක පාර්සල් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් මස 16 වන දින සිදුකෙරිණ. ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි අනුපමා රත්නායක මහත්මියගේ මගපෙන්වීමෙන් සිදුකළ මෙම සත්කාරය සඳහා එම බලකා සේවා වනිතා සාමාජිකාවෝ රැසක් ද සහභාගී වූහ.





# ලෝක ළමා දිනය සහ වැඩිහිටි දිනය සමරා


සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි චන්දි රාජපක්ෂ මහත්මියගේ මගපෙන්වීම යටතේ 2(සෙව්) ශ්‍රීලයුසේබ ඒකකයේ වාර්ෂික සේවා වනිතා වැඩසටහන ඉකුත් ඔක්තෝබර් 6 වන දින කටුනායක පිහිටි එම ඒකක මූලස්ථානයේදී පැවැත්විණි. ප්‍රකට කලාකරුවකු සහ වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සෞන්දර්ය අධ්‍යක්ෂ සමන් ගුණවර්ධන මහතා විසින් පවත්වන ලද අර්ථවත් වැඩසටහනකින් මෙම උත්සවය රසවත් විය. 2(සෙව්) ශ්‍රීලයුසේබ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් රෝහණ උඩරටගේ සහ චන්දිමා උඩරටගේ මහත්මියගේ සහභාගීත්වයෙන් පැවති මෙම අවස්ථාවේදී 2(සෙව්) ශ්‍රීලයුසේබ ඒකකයේ රාජකාරී කරනු ලබන නිලධාරී, සෙසුනිල සහ සිවිල් සේවක මහත්වරුන්ගේ ළමුන් සඳහා තෑගි හා අධ්‍යාපන උපකරණ බෙදාදීමට ද කටයුතු කෙරිණ.





# වැඩිහිටි නිවාසයකට සත්කාරයක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි එච්ජී ස්වර්ණලතා මහත්මියගේ මඟපෙන්වීම යටතේ එහි සියලු සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් ඉකුත් ඔක්තෝබර් මස 21 වන දින කළුතර පිහිටි ජාවත්ත වැඩිහිටි නිවාසයේ සිටින පියවරුන් සඳහා ආහාර වේලක් ලබාදෙන ලදී. තවද, එහිදී එම වැඩිහිටියන් හට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හා පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මුදල් ත්‍යාග ද පිරිනැමුණි. මෙම අවස්ථාවට කර්නල් ඒආර්ඩී ද සිල්වා කේඑස්පී (ශ්‍රීලංරබ/ශ්‍රීලයුපුබ සම්බන්ධීකරණ නිලධාරී), එම සේවා වනිතා සාමාජිකාවෝ සමඟ යුද්ධ හමුදා පුරෝගාමී බලකායේ නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් ද සහභාගී වූහ.


කෝප්‍රල් පේමසිරි MPMG අවිය ද සමඟ

# ලෙයට ලෙය වෙනුවෙන් කළ හුදෙකලා සටනක්






■ ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ

**හද දවන සිදුවීම් ද හද තවන සිදුවීම් ද යුද පිටියේ තරම් අන් තැනක සොයාගත නොහැක. ඒවා රණවිරුවන්ගේ හිත් තුළ නිධන්ගතව රුධිරය ද සමඟ මිශ්‍රව ජීවිත කාලය පුරාම පවතී. සමස්තයක් ලෙස සටන්බිම තුළ යුද භටයකු අත්විඳින පොදු අත්දැකීම් සම්භාරයක් ඇතත් ඒ අතර සීමිත පිරිසක් පමණක් මුහුණදෙන අතිශයින්ම විරල ගණයේ සිදුවීම් ද තිබේ. එවන් දේ සමාජයට නිරාවරණය නොවී කාලයත් සමගම වැසීයාම අතිශය කනගාටුදායක වන්නේ එමගින් උගත හැකි පාඩම්, බොහෝ වන හෙයිනි. එසේම, ඒවා මානුෂීය ගුණයෙන් ද පිරුණ ඒවාය.**

ජිනීවා මානව හිමිකම් සැසිවලදී ද දෙමළ ඩයස්පෝරාව ද මෙරට තුළ ක්‍රියාත්මක ඇතැම් ඊනියා මානව හිමිකම් සංවිධාන ද ආරක්ෂක හමුදාවලට එරෙහිව විටින් විට යුධ අපරාධ චෝදනා එල්ල කළ අවස්ථා අතීතයේ කොතෙකුත් තිබිණ. නමුත්, ඒවා නිශේධ කිරීමට නම් ඒවාට විරුද්ධව තර්ක විතර්ක කිරීමට වඩා රණවිරුවන්ගේ මානුෂීය මුහුණුවර උදාහරණ සහිතව ඉදිරිපත් කිරීම වඩා ප්‍රායෝගික වේ. සෑම අවි ගැටුණු බිමකම වැලලී නොගිය මනුස්සකම් ඉතිරි වූ බව ඇති සැටියෙන් පෙන්වාදීමට නම් එය දැන්විය හැකි බලසම්පන්නම අවිය රණවිරුවකුගේම පැන බවට මම තරයේ විශ්වාස කරමි. මේ සංවේදී සත්‍ය සටහන හරහා දිගහැරෙන්නේ ද එවැන්නකි.

2007 දෙසැම්බර් 01 වන දින 15 ස්වේච්ඡා විජයබාහු පාබල රෙජිමේන්තුව මන්නාරම ප්‍රදේශයේ ස්ථාපිත වනුයේ එවක ඇරඹී තිබූ අවසන් මානුෂීය මෙහෙයුමට සම්බන්ධ වෙමිනි. මේජර් නිලන්ත රත්නසිංහගේ අණදීම යටතේ එම ඒකකය මන්නාරමේ සිට පූනරීන් කිලිනොච්චි හරහා මුලතිව් දිනාගැනීම දක්වා වූ 58 වන සේනාංක ගමන් මඟෙහි ඒ වනවිට කැපී පෙනෙන මෙහෙවරක් ඉටු කරමින් සිටියේය. විශේෂයෙන්ම නවතමයෙන් ආරම්භ කොට තිබුණ ද එම ඒකකයට භටපිරිස් එක්ව සිටියේ අනෙකුත් පැරණි විජයබාහු ඒකකවල අත්දැකීම් සහිත සාමාජිකයන්ගෙන් වීම හේතුවෙන් ක්‍රියාන්විත මෙහෙයුම් දියත් කිරීමේ දී ඉමහත් වාසියක් හා පහසුවක් විය.

ක්‍රියාන්විතය ඇරඹී ඒ වනවිට 15 විජයබාහු පාබල රෙජිමේන්තු භට පිරිස් මන්නාරම් මාර්ගයේ සිට අඩම්පන් මුලක්කාවිල් පූනරීන් ප්‍රදේශය දක්වා සිය මෙහෙයුම් දියත් කොට තිබිණ. එහි සිට ඉදිරි ආරක්ෂක වළල්ල පුළුල් කරගැනීම සඳහා තවදුරටත් මෙහෙයුම් දියත් වෙමින් තිබුණු අතර, ඔවුනගේ මීළඟ ඉලක්කය වූයේ යාබදව පිහිටි අර්සපුරකුලම් ගම්මානයේ බලය තහවුරු කරගැනීමය. ඒ වෙනුවෙන් ප්‍රදේශය අවට කුඩා කණ්ඩායම් මෙහෙයුම් විවිධ පැතිවලින් දියත් වූ අතර 15 විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත් කෝප්‍රල් පේමසිරි ද තවත් හත් දෙනකු සමග ඉදිරි ආරක්ෂක වළල්ලෙන් ඔබ්බට පිවිසෙනුයේ අදාළ ගම්මානය නිරීක්ෂණය කිරීම සඳහාය. එහිදී, ඔහු සිය සුපුරුදු MPMG වර්ගයේ අවිය ද රැගෙන පෙරමුණ ගත් අතර, ඔහුගේ එම අවි සහායකයා ලෙස කටයුතු කරන ලද්දේ සෙබළ තිලකරත්න නම් ඔහුගේම ඒකක සගයෙකි.

කෝප්‍රල් පේමසිරි 15 විජයබාහු පාබල ඒකකයේ ක්‍රියාශීලී නිර්භීත සෙබළකු වූ අතර, එම ඒකකය ඇරඹි දා සිටම ඔහුමහත් කැපවීමෙන් ක්‍රියාන්විතයන්හි දායක වෙමින් බොහෝ සමත්කම් පෙන්වා තිබූ අයෙකි. විශේෂයෙන්ම,

MPMG වැනි බර අවියක් ද අතැතිව සටන්බිමේ කටයුතු කිරීම ලේසි පහසු කටයුත්තක් නොවූ මුත් ඔහු සියලු දුෂ්කරතා පසෙකලා වගකීමෙන් සිය මෙහෙවරෙහි නිරත වූයේය. එලෙසින්ම ඔහුගේ MPMG අවි සහායකයා වූ සෙබළ තිලකරත්න ද මුල සිටම කෝප්‍රල් ජේමසිරිට ශක්තියක් වූ නිර්භීත සෙබළෙකි.

මෙලෙස ඉදිරියට ඇදෙන පිරිසට දකින්නට ලැබුණේ ප්‍රදේශයේ දිය සිඳිගිය වැවකි. විවෘත භූමියක් ලෙස පැවති එහි ඒ මොහොතෙහි තවදුරටත් ගමන් ගැනීම දැඩි අවදානම් සහගත විය. ඒ අනුව එහි වූ වඩා ආරක්ෂාකාරී තැනක ස්ථානගත වූ ඔවුහු එහි රැඳී සිට යළි ගමන් අරඹන ලද්දේ පසු දිනට පහන් වනවාත් සමඟය. එලෙස ගමන් අරඹා මඳ දුරක් යත්ම එම විවෘත භූමියේ දී එක්වරම ඔවුන් වෙත එල්ල වූයේ දරුණු ත්‍රස්තවාදී ප්‍රහාරයෙකි. ආවරණ රහිත එම ප්‍රදේශයේ දී එල්ල වූ ප්‍රහාරය හමුවේ සෙබළ පිරිස පත්වූයේ දැඩි අවදානමකටය. එහි වූ වැව කෙළවර විවෘත භූමියේ තැනක සැඟව එල්ල කළ එම ප්‍රහාරය අනුව එහි සැලකිය යුතු ත්‍රස්තවාදීන් පිරිසක් සිටින බවට නිගමනය කළ හැකිවිය. එහිදී, වහා සියලු භූමි උපක්‍රම භාවිතා කරමින් යළි විවෘත භූමියෙන් පසුපසට පැමිණීමට සමත් වූ පිරිස ඒ ආසන්නයේ වූ ඇළකට බැස එහි සිට සතුරාට ප්‍රතිප්‍රහාර දෙන්නට වූහ. එහිදී, සෙබළු එල්ලකළ ප්‍රතිප්‍රහාරය හමුවේ එතෙක් වෙඩි තබමින් සිටි ත්‍රස්තවාදීන්ගෙන් පිරිසක් යාබද වන වදුලකට පැනගත්හ. එම කුඩා කැලෑ කොටසෙන් ඔබ්බෙහි වූ ප්‍රදේශය විවෘත භූමියක් වූ බැවින් එලෙස පැනගත් ත්‍රස්තවාදීන් පිරිසට යළි පහරදීම සඳහා කෝප්‍රල් ජේමසිරි සිය MPMG අවිය රැගෙන වහාම ඒ ආසන්න සීමාවෙහි ස්ථානගත විය.

මඳ වේලාවකින් සිතූ පරිද්දෙන්ම ඒ හරහා පැනයන ත්‍රස්තවාදීනට ඔහුගේ බර අවිය නිසි ඉලක්ක බලා ක්‍රියාත්මක විය. අනතුරුව එහිදී ද දෙපාර්ශ්වය අතර සැලකිය යුතු සටනක් පැවතිය ද අවසානයේ ත්‍රස්තවාදීන්ගේ ගිනි අවි සියල්ල නිහඬ වූ බවක් පෙනෙන්නට තිබිණ. තම ප්‍රහාර හමුවේ එහි ගමන් ගත් ත්‍රස්තවාදීන් මියගොස් හෝ තුවාල ලබා ඇති බව කෝප්‍රල් ජේමසිරිගේ නිගමනය විය. නමුත් ඒ පිළිබඳ නිසැකව තහවුරු කර ගැනීම පිණිස අදාළ ස්ථානය වෙත ළඟා වීම ඒ මොහොතේ කිසිසේත් කළ හැකි නොවිය. පැන ගිය ත්‍රස්තවාදීන්



සැරයන් තිලකරත්න



කෝප්‍රල් ජේමසිරි

කොහේ හෝ සිට යළි ප්‍රහාරයක් එල්ල කිරීමේ අවදානමක් පැවතීම ඊට හේතු විය. ඒ වනවිට සහායක භට පිරිසක් ද ඒ ආසන්න සීමාවට පැමිණ සිටි නමුත් ඔවුන් ද පසෙක වූ කැලෑ රොද තුළ රැඳී සිටියා මිස එම විවෘත භූමියට පය තබන්නට ඉදිරිපත් නොවිය.

මේ අතරතුර කෝප්‍රල් ජේමසිරි තම පිරිස සමඟ කුඩා වන තීරුවක් ඔස්සේ පසෙකින් ගොස් එම විවෘත භූමියට උපක්‍රමශීලීව පිවිස අදාළ ත්‍රස්තවාදීන් වැටී සිටි ස්ථානයට ළඟා වන්නට වූහ. එහිදී, සිදුවූයේ තවත් අනපේක්ෂිත සිදුවීමකි. එනම්, යාබද වන වදුලක සිට තවත් ත්‍රස්ත පිරිසක් යළි දරුණු ප්‍රහාරයක් එල්ල කිරීමය. එහිදී, තම සෙබළු දෙදෙනකුට ද තුවාල සිදුවූ අතර, ජේමසිරි සහ ඔහුගේ සහායක එහි වූ කුඩා වළක වැතිර ප්‍රහාරයෙන් බේරීමට සමත් වූහ. මේ අතර නොනවත්වා එල්ල වෙන ත්‍රස්ත ප්‍රහාරය හමුවේ තුවාලලත් එම සෙබළු දෙදෙනා තව දුරටත් අවදානමකට ලක් වූහ. ඒ වනවිට එම භූමියේ පෙර ඇති වූ සටන්වලදී කාලතුවක්කු උණ්ඩ වැටීම හේතුවෙන් සැදී තිබූ වළවල් සමූහයක් විය. තම තුවාලලත් සෙබළු දෙදෙනාට එම වළවල් තුළට බැස සැඟවෙන ලෙස උපදෙස් දුන් කෝප්‍රල් ජේමසිරි ත්‍රස්තවාදී ප්‍රහාර එල්ල වෙන ස්ථානය පිළිබඳ විමසිලිමත් විය. එහිදී, ඔහු දුටුවේ යාබද වන ලැහැබ

**“**

**ඉදිරියට හෝ පසුපසට යා ගත නොහැකිව විවෘත භූමියේ කොටු වූ ජේමසිරිට උද්ගතව ඇති තත්ත්වය හමුවේ තවදුරටත් හිතන්නට කාලයක් ඉතුරු නොවීය. සටනක් නොදී ජීවිතය රැකගැනීමේ කිසිදු ඉඩක් නොතිබූ තැන තෝරාගත හැකිව තිබුණේ එක විකල්පයක් පමණි. එනම්, ජීවිත අවදානම නොතකා ත්‍රස්තවාදීන්ගේ එම බංකරය වෙත කඩා පැනීමය.**

තුළ භූගත බංකරයක සිට එම ප්‍රහාර එල්ල වන බවය. එහිදී, ඉදිරියට හෝ පසුපසට යා ගත නොහැකිව විවෘත භූමියේ කොටු වූ ජේමසිරිට උද්ගතව ඇති තත්ත්වය හමුවේ තවදුරටත් හිතන්නට කාලයක් ඉතුරු නොවිය. සටනක් නොදී ජීවිතය රැකගැනීමේ කිසිදු ඉඩක් නොතිබූ තැන තෝරාගත හැකිව තිබුණේ එක විකල්පයක් පමණි. එනම්, ජීවිත අවදානම නොතකා ත්‍රස්තවාදීන්ගේ එම බංකරය වෙත කඩා පැනීමය. එහිදී, ඔහු වෙඩි තබමින් බංකරය වෙත ගොස් එහි වහලය මතට ගොඩවන අතරේ ඒ තුළට අත් බෝම්බ දෙකක් එල්ල කිරීමේ වගකීම තිලකරත්නය වෙත පැවරීය.

ඒ වන විට ජේමසිරිගේ MPMG අවියෙහි ඉතිරිව තිබුනේ පතුරම් 50ක ප්‍රමාණයක් පමණි. ඔහු එය ඉවත්කර සහායක සතුව තිබූ පතුරම් 200ක් අමුණා සකස් කරගත වැලක් ඊට සවි

කරගත්තේය. සාමාන්‍යයෙන් MPMG අවි සඳහා භාවිතා කෙරෙනුයේ පතුරම් 100 කින් යුත් පතුරම් වැල් වුවද ක්‍රියාන්විත අවශ්‍යතාවය මත එම ප්‍රමාණය දෙගුණ කර 200ක් ලෙස පතුරම් වැල් සකස් කර ගන්නට ඔවුන් කටයුතු කර තිබුණි. ඒ අනුව සියල්ල සැලසුම් කරගත් පරිදි ක්‍රියාත්මක කරන මොහොත උදාවිය. ඒ වනවිටත් යාබද වලක සැඟව වේදනාවෙන් කෑ ගසන තුවාල ලත් තම සගයින් දෙදෙනාගේ හඬ පසුබිමෙන් ඇසෙන්නට විය. ඉදිරියේ වූ බංකරයේ සිට එල්ල වෙන වෙඩි උණ්ඩ ඒ වනවිට ද ඔවුන්ගේ සිරුරු සමීපයෙන් ඇදී යන්නට වූයේ මරණයට ඇත වනන්නාක් මෙනි. එල්ල වෙන එම වෙඩි ප්‍රහාරවල තරම අනුව අවම වශයෙන් එම බංකරය තුල ත්‍රස්තවාදීන් දස දෙනකුවත් සිටින බව වටහා ගැනීමට පේමසිරිට අපහසු නොවීය. අවසානයේ ලෙයට ලෙය ඉල්ලන සංග්‍රාම භූමියක ජීවිත තෝරා ගැනීමේ අවස්ථාව උදාවිය.

සහායක සෙබළ තිලකරත්න ද ආරක්ෂක ඇණ ඉවත් කළ අත්බෝම්බ දෙකක් දෑතට ගෙන කෝප්‍රල් පේමසිරි පිටුපසින් එම තීරණාත්මක මෙහෙයුමට සූදානම් විය. එසැනින් තම MPMG අවිය ඉන පෙදෙසෙහි තබා වැර යොදා අල්ලාගත් කෝප්‍රල් පේමසිරි ඉදිරියෙන් එල්ල වන සතුරු වෙඩි ප්‍රහාර නොතකා ජීවිතයත් මරණයත් අතර වූ අවසන් තෝරාගැනීම සිදුකරමින් අඛණ්ඩ වෙඩි ප්‍රහාරයක් එල්ල කරමින් බංකරය දෙසට කඩා පනින්නට විය.

(තව කොටසක් ලබන කලාපයෙන්...)

# "වැගනර්ස්" නිවාඩු නිකේතනය

## යලි විවෘත කෙරේ



ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායට අයත් තිසා වැව පිහිටි "වැගනර්ස්" නිවාඩු නිකේතනය ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසු ඉකුත් සැප්තැම්බර් මස 28 වෙනි දින යලි විවෘත කෙරිණ. 3 ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් කේසීකේ ජයසිංහ පීඑස්සී එල්එස්සී ගේ අධීක්ෂණය යටතේ එහි භට පිරිස්වල ශ්‍රම දායකත්වයෙන් ප්‍රතිසංස්කරණය කළ මෙම නිකේතනය විවෘත කිරීමේ අවස්ථාවට යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒකේ රාජපක්ෂ ආර්එස්පී එක්විය.



එසේම, මාලි රාජ්‍යයෙහි එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම අතරතුර අභාවප්‍රාප්ත වූ සෙ/579152 කෝප්‍රල් දේශප්‍රිය එම්ජීඑල් යන කොනොනිගේ පවුලේ සාමාජිකයින් වෙත DAG HAMMARSK JOID පදක්කම පිරිනැම්මේ උත්සවය ද මීට සමගාමීව සිදුකෙරිණ. එහිදී, එම රෙජිමේන්තු බලකාධිපති ගේ සුරතින් පදක්කම පිරිනැමීම සිදු කරන ලද අතර, ශ්‍රීලයුසේබ සේවා වනිතා ශාඛාවේ සභාපතිනි චන්දි රාජපක්ෂ මහත්මිය විසින් ඔහුගේ පවුලේ සාමාජිකයින් වෙත වියලි සලාක මල්ලක් සහ පාසල් උපකරණ ප්‍රධානය කිරීමක් ද මෙහිදී සිදුකරනු ලැබුවාය.



# ගණන් පරීක්ෂණය




විසණනය හෙවත් ඔඩිට් කිරීම යනු යුද හමුදාවේ කිරීමට ඇති ඉතාමත් දුෂ්කර අන්දමේ රාජකාරියකි. එයට හේතුව මෙම කාර්යයෙහි ඇති භාරදූරකම පමණක්ම නොවේ. මෙම කාර්ය හරිහැටි ඉටුකලහොත් ගිණුම අයත් පාර්ශ්වයේ අය පරීක්ෂණ පාර්ශ්වයේ අය හා උරණ වෙයි. පරීක්ෂණ පාර්ශ්වයේ අය ගිණුම් පාර්ශ්වයේ සතුටට පත්වන අන්දමින් ගිණුම් පරීක්ෂණ කලහොත් පාලක පක්ෂයේ අය ඔවුන් හා උරණවෙති. මේවායින් කෙසේ හෝ බේරී කොයියම් අන්දමකට හෝ ගිණුම් පරීක්ෂාකර පසුව කිසියම් දිනක එම ගිණුමේ විෂමතාවයක් නිරීක්ෂණය වුවහොත් එම මුදලින් කොටසක් ද ගෙවා විනයානුකූලව දඬුවම් ලැබීමටත් ගිණුම් පරීක්ෂණ පාර්ශ්වයේ අය සුදුසුකම් ලබති. මෙම තත්වය මත සෑම විටම අවාසිය හැරී ඇත්තේ ගිණුම පරීක්ෂණ පාර්ශ්වය කෙරෙහිය. මේ සියල්ල සැලකිල්ලට ගතහොත් කළයුතු හොදම දේ වනුයේ ගිණුම් පරීක්ෂණ පාර්ශ්වය තම රාජකාරිය අකුරටම ඉටුකිරීම බවද පැහැදිලිය.

උතුරුකරයේ පිහිටි එක් කඳවුරකි. එහි ගොවිපළක් ද වූ අතර, ඒ නිසාම ඒ වෙනුවෙන් ගිණුමක් ද ක්‍රියාත්මක වෙමින් පැවතිණ. මෙම ගිණුම පරීක්ෂා කිරීම සඳහා ත්‍රෛයි මාසිකව මණ්ඩලයක් පත්කරන අතර වරක් ඒ සඳහා පත්කර තිබූ එක් නිලයෙක් එම රාජකාරිය අකුරටම ඉටුකරන්නෙක් විය. මේ නිසා මණ්ඩලයේ නාම ලේඛණය දුටු සැනින් ගිණුම භාර නිලධාරියාගේ සිතෙහි සුළු තිගැස්මක් ද ඇතිවිණ. එහෙයින් වෙනදාටත් වැඩිය හොඳින් ගිණුම පරීක්ෂාකර සැකසීමට ඔහු යුහුසුළු විය.

ගිණුම් පරීක්ෂණය සඳහා මණ්ඩලය පැමිණෙන දිනය එළැඹිණි. එදින වූ පළමු ගුවන් යානයෙන්ම පැමිණි ඔවුහු ගොවිපළ වෙත පැමිණෙන විට පෙරවරු 09.30 පමණවී තිබිණ. උදය ආහාරය ගෙනසිටි ගොවිපළ භාර නිලධාරියා ඒ වනවිට සිය සුපුරුදු ගොවිපළ සංචාරය සඳහා සූදානම්ව සිටියේය. පරීක්ෂණ කණ්ඩායම සුහදව පිළිගත් ඔහු උදය ආහාරය ඔවුනට සූදානම් කර දී තම රාජකාරිය සඳහා යාමට සිතීය. පරීක්ෂකයාගේ තරම දන්නා නිසා නිලධාරියා ඔහු අමතා තමන් ගොවිපළ පරීක්ෂාකර ඉක්මණින් ආපසු පැමිණෙන බවත් එසේ පැමිණෙන තුරු කාර්යයෙහි නියැලෙන ලෙසත්, කිසියම් දෝෂයක් නිරීක්ෂණය වුවහොත් ඒ ගැන කලබල නොකර තමන් ආපසු පැමිණි පසු ඒ බැව් දන්වන ලෙසත් ඉල්ලා කාර්යාලයෙන් පිටවී ගියේය.

පැය දෙකක පමණ කාලයක් ගොවිපළ පරීක්ෂාකළ නිලධාරියා තම කාර්යාලය වෙත ආපසු පැමිණෙමින් සිටියේය. දුරසිටම ඔහු දුටුවේ ගිණුම් පොත්පත් දැඩි විමසිල්ලෙන් පිරික්සමින් ඒ හා සමඟම තම ගිණුම් ලිපිකරුවන්ට හඬනගා දෝෂාරෝපණය කරන පරීක්ෂණ නිලධාරියාගේ ගොරෝසු කටහඬයි. නිශ්ශබ්දව ඒ දෙසට ඇදුණු ඔහු කුමක් නිසා බැණ වදින්නේදැයි ඊට හොඳින් සවන් දී කෝ උඹල ගත්ත කඹ. මට පුළුවන් නම් පෙන්නපල්ලා එක අඩි 10ක කෑල්ලක්. මිනිහෝ රුපියල් හයදාහක කඹ කියන්නේ ලේසිපාසු ගානක් නෙමේ. ඒ තරම් කඹවලින් රුවන්වැලිසෑය වටේ විසිපාරක් විතර ඔතන්න පුලුවන්. උඹලගෙ මේ හොර වැඩ හින්දා අර අහිංසක සර්වත් අමාරුවේ වැටෙනවා යනුවෙන් පරීක්ෂණ නිලධාරියා පවසනු නිලධාරියාට ඇසිණ.

තත්වය භයානක බව දැනගත් නිලධාරියා බියට පත්විය. කෙලින්ම කාර්යාලය තුළට ගිය ඔහු ශබ්ද නගා කථා නොකරන මෙන් පරීක්ෂක නිලධාරියාගේ කාරුණිකව ඉල්ලා සිදුවී ඇත්තේ කුමක්දැයි විමසීය. ගෙවීමේ ලිපිගොණුවේ කඹ මිළදී ගත් රුඃ 6000.00 ක බිල්පතක් ඇතත් එය කඹ තොගයේ නොමැති බව ඔහු නිලධාරියාට පැවසීය. එවැනි බිල්පතක් ගොණුවේ නොතිබූ බව හොඳින් දත් නිලධාරියා තමනට එය පෙන්වන මෙන් පරීක්ෂක නිලධාරියාගෙන් ඉල්ලා සිටියේය. නිලධාරියා වෙතට ඉංග්‍රීසියෙන් ලියූ බිල්පතක් උජාරුවෙන් දික්කළ ඔහු තම නිරීක්ෂණය ගැන උදම් වී ජයග්‍රාහී බැල්මක් හෙලීය. බිල්පත් කියවූ විගස ගොවිපල භාර නිලධාරියාගේ මුවඟට නැගුණේ උපහාසාත්මක සිනාවකි. කරුණු වටහාගත් ඔහු තම ගිණුම් ලිපිකරුවනට පිටතට යන මෙන් අණකළ ඔහු ගිණුම් පරීක්ෂක වෙත නැඹුරු විය. "මේ ඉංග්‍රීසියෙන් තියෙන්නේ කඹ නෙවෙයි කිුකම්බ ඒ කියන්නේ පිපිඤ්ඤා. මේක පිපිඤ්ඤා ඇට මිලදී ගත්ත බිල්පතක්, මේකේ අකුරු මැකිලා තියෙන්නේ " යැයි ඔහු පැවසීය."එහෙම නම් කමක් නෑ. බලන්කො මම දැක්කේ කඹ කියලනේ සර්" කී පරීක්ෂකවරයා රතු වූ මුහුණින් යුතුව කාමරයෙන් එළියට ඇදිනි.

*- කපිතාන් (උපා) එන්පී පෙරේරා ශ්‍රුඑස්වී ශ්‍රීලශ්‍රුපොදුසේබ*



# අනේ අසවේදු

**සිනමාවේදී තිස්ස අබේසේකර ශූරීන් ජීවත්ව සිටි කාළයේ වරක් මා ඔහුව මුනගැසුනු අවස්ථාවක් පිළිබඳ අපූරු මතකයක් අදටද මා සතුව පවතී. කාලය ඉකුත් වුවද එය මෙහි සටහන් කරනුයේ එය එතරම්ම රසාලිප්ත සොඳුරු හෝරාවක් වූ බැවැනි...**

ඒ රසාලිප්ත පැය කිහිපය මෙසේ ස්මරණය කොට පාඨක ඔබ වෙත තිළිණ කරන්නේ එදා හෙළදිව රණශූරයන්ට උපහාරයක් ලෙසටය.

පසුගිය දිනක මම රාජකාරි කටයුත්තක් සඳහා ලංකාවේ ප්‍රවීන චිත්‍රපට හා ටෙලිනාට්‍ය අධ්‍යක්ෂක වරයෙකු වූ තිස්ස අබේසේකර මහතා හමුවීමට ඔහුගේ නිවසට ගියෙමි. ඔහු ඉතා ප්‍රීතියෙන් මා පිළිගැනීමෙන් අනතුරුව අපි කථා බහේ යෙදෙන්නට වූයෙමු. කෙසේ හෝ අපගේ කථාව යොමු වුනේ ආදි සිංහලයන්ගේ වීරත්වය හා යුධ උපායන් වෙතටයි.

ඔහුගේ මුහුකුරාගිය දැනුම ඉතා ප්‍රියජනක ආස්වාදයක් ලබාදෙන්නට විය. හේවාගම් කෝරලේ, සියනෑ කෝරලේ, සල්පිට කෝරලේ කියන මේ කෝරළ එකකට එකක් යාබදව පිහිටලා තියෙන්නේ. ඉස්සර කාලේ ලංකාවේ හිටපු දක්ෂ රණකාමියො, එඩිතර පුද්ගලයො බිහිවෙලා තියෙන්නෙ මේ කෝරළ මගින්.

ඔහුගේ එම ප්‍රකාශයෙන් අනතුරුව මට සිහියට නැගුනේ ගම්පහ, බියගම, කඩුවෙල, පන්නිපිටිය, මුල්ලේරියාව, හංවැල්ල, හොරණ, දොම්පෙ, පාදුක්ක, ආදී ප්‍රධාන ගම්දනව් හා කැළණි ගම් මිටියාවතෙත්, කළුගම් මිටියාවතෙත් ජීවත් වූ අපගේ මුතුන් මිත්තෝයි.

ඒ වගේ මිනිසුන්ට අද මොකද වුනේ.... එක අතකට බලන කොට දුකක් හිතෙනවා නේද ?

අප මොහොතක් නිශ්ශබ්දතාවයේ වෙළුනෙමු. ඔහු යලිත් කටහඬ අවදි කළේය. අතීත ලංකාවේ සිදුවෙච්ච දරුණුම සටනක් තමයි පෘතුග්‍රීසීන් ට විරුද්ධව මුල්ලේරියා වෙලේ පැවති සටන. මේ සංග්‍රාමයේ දී කඩු, දුනුහි පමණක් නොවෙයි. වෙඩිබෙහෙත් තාක්ෂණයත් බොහෝම දරුණු විධියට සිංහලයො යොදාගෙන තියෙනවා. එතකොට ටිකිරි කුමාරයාගෙ වටස අවුරුදු 16 යි.

"වයස අවුරුදු 16 ය" මම විමතියට පත්විමි. ඒ පාසල් යන වයස නොවේදැයි මට සිතුනි.

මුල්ලේරියා වෙලේ සටන ඇහින් දැකපු පෘතුගිසි කාරයෙක් තමන්ගේ රටට ගියාට පස්සේ ලියපු පොතක් මම කියවලා තියෙනවා හෙතෙම පොතේ නමත් එහි රචකයාගේ නමත් පැවසීය. අවාසනාවක මහත එය මගෙ මතකයෙන් ගිලිහි ඇත.

ඔහු කියලා තියෙනවා මුල්ලේරියාවේ දී පෘතුගීසීන් ලැබුවේ ඉතා දරුනු පරාජයක් බව. ඒ පරාජයට ඔහු දක්වලා තියෙන එක හේතුවක් තමයි සිංහලයන් ගැනත් ඔවුන්ගේ යුධ උපක්‍රම ගැනත් පෘතුගීසීන් දක්වලා තියෙන අඩු තක්සේරුව.

මට අසවේදු සෙනෙවියා සිහිපත් විය. පෘතුගාලය හොල්ලගෙන වීර පදක්කම්, නම්බුනාම ඇඟපුරා එල්ලාගෙන සිටි අසවේදු ඔහුගේ වීරත්වය හා දක්ෂතාවය ගැන සලකා විශේෂයෙන්ම ලංකාවට එවනු ලැබූ අසවේදු හංවැල්ලේ මල්වානේ බලකොටු තනාගෙන කිරිදරුවන් උඩ දමා කඩු තුඩින් මරා දැමූ අසවේදු කැළණිගම් මිටියාවතේ වෙහෙර විහාර බුදුපිලිම ගංපතුලට ගිල්ල වූ අසවේදු...

මුල්ලේරියාවේදී සිංහලයෝ යොදාගත් යුධ උපක්‍රම ගැන පෘතුගීසීන් මවිතයට පත්වෙලා. ඔවුන්ට අදහගන්න බැරිව ගියාලු සිංහලයන්ට මෙවැනි උපක්‍රම හා තාක්ෂණය ලැබුණේ කොහෙන්ද කියලා? එහිදී, සිදුවෙච්ච එක් දෙයක් මෙහෙමයි. පෘතුගීසි හමුදාව එනකොට සිංහල හමුදාව රැකගෙන හිටියලු. වෙඩි තියන්න පටන් ගත්තම සිංහල හමුදාව එල්ල කරල තියෙන්නේ නොනවතින වෙඩි වරුසාවක් පෘතුගිසින්ට අදහාගන්න බැරිවෙලා තියෙනවා මේ විදියට වෙඩිවරුසාවක් එල්ල කරන්නේ කොහොමද කියලා. ඒ මොකද දන්නවාද ? ඒ කාලේ තිබුණේ බෙහෙත් කොටන තුවක්කු සාමාන්‍යයන් කොටන තුවක්කුවෙන් එක වෙඩිල්ලක් තිබ්බට පස්සේ අනිත් උණ්ඩය කොටන්න විනාඩි දෙකක් විතර යනවා. ඉතින් ඔවුන් බයවෙලා පසුබසින කොට කොටුකරගෙන තියෙන්නෙ මඩ එරෙන මුල්ලේරියා වෙලේ.

"ඉතින් කොහොමද බෙහෙත් කොටන තුවක්කුවලින් ඔය විදියට වෙඩි තියලා තියෙන්නේ" මම කුතුහලයෙන් ඇසුවෙමි.

ඒක ඔවුන්ගේ උපක්‍රමයක් සිදුවෙලා තියෙන්නෙ මෙහෙමලු. ටිකිරි කුමාරයාගෙ සේනාව තුවක්කුවලට බෙහෙත් කොටාගෙන පෙළවල් කිහිපයක් ගහගෙන ඉදලා තියෙනවා එක පෙලක් පිටුපසින් තවත් පෙලක්. අපි හිතමු මුළු ගණන පන්සියයි කියලා. සීය ගානේ පෙළවල් පහක් මුල්පෙල වෙඩි තියලා පිටිපස්සට දුවලා යනවා ඊළගට දෙවෙනි පෙල වෙඩි තියනවා. ඔවුනුත් පිටිපස්සට යනවා තුන්වෙනි පෙළ වෙඩි තියනව ඔය විදියට හතරවෙනි පෙළ ඊටපස්සේ පස්වෙනි පෙළ ඒ වෙනකොට මුලින්ම පස්සට ගිය පලවෙනි පෙළ බෙහෙත් කොටාගෙන සූදානම් වෙලා ඉවරයි. ඔය විදියට නොනවත්වා වෙඩි තියලා.

තවත් ටික වේලාවකින් ඒ සොදුරු පැය කිහිපය ගෙවී ගියේය. මම ආපසු ඒමට සමුගතිමි. එහෙත් ආපසු එන අතර වාරයේ මට නිරතුරුව ටිකිරි කුමාරය සිහිවිය.

කටේ කිරි සුවද යන්නට පවා බැරි වුණා
යුදට උපන් කුමරා යයි නමක් ඇති වුණා
මුල්ලේරියා වෙලෙහි වතුර ලෙයට හැරවුණා
ටිකිරි කුමරු රාජසිංහ නමින් රජවුණා

නිතර නිතර සීතාවක රණබෙර නැගුණා
කොළඹ කොටුවෙ බළල් මසුත් ගිනි ගණන් වුණා
පරංගි දේසේ රජුටත් මර උණ ගැණුනා
රාජසිංහ දෙව් නාමේ ලොවේ රජවුණා

■ කර්නල් එම්පීපී පෙරේරා (විශ්‍රාමික)



# පන්දම...

පන්දමට ඇත්තේ දීර්ඝ ඉතිහාසයකි. ඉන්දන හා විදුලිය සොයාගැනීමට පෙර රාත්‍රියට අලෝකය ලබා ගන්නේ යමක් දැල්වීමෙනි. ඉන් පෙර රාත්‍රී කාලවල ඔවුහු එක්තැන්වී විවේක ගත්හ. ඒ විවේකයෙන්ම එළිය වැටෙනතුරු නිදාගත්හ. එසේත්, නොමැතිනම් ආලෝකය ලබා ගත්තේ හඳ එළියෙනි. මෙයට හඳපාන කියාද කියති. ඒ කාලවල අනුමැතිය නොලත් පෙම්වතුන් ලොවට හොරා පැනගියේ හඳපානේය. මැතක් වනතුරු මේ හඳපානේ පැනයාම ඉතාම ජනප්‍රියව පැවතිණ. එහෙත් දැන්නම් රෑ දවල් කියා වෙනසක් නැත. පැනයාමට බයක් ද නැත. එකල, මෙකල මෙන් විවාහ ලේකම්ලා නොසිටි නිසාත්, විවාහය රජයේ ලියාපදිංචි කිරීමක් නොකල නිසාත් කිසිම ප්‍රශ්ණයක් නොවීය. එහෙත් හුදු ආදරයෙන් බැඳුණු ඔවුන් මියයන තුරුම සතුටින් දීග කෑහ. එහෙත් දැන් කවුරු කොයිවේලේ මාරු වෙයිද කියා නොදන්නා බැවින් ආණ්ඩුවේ ලියාපදිංචිව විවාහ සහතිකයක් ගැනීම දෙපාර්ශ්වයටම ගුණදායකය. ලොව මොන අතින් දියුණු වුවත් එන්න එන්නම විශ්වාසය හා ගුණධර්ම නැතිවෙගෙන යන එකයි මෙයින් පැහැදිලි වන්නේ.

දර වර්ග දැවීමේදී එහි අන්තර්ගත ලාටු ඉටි වශයෙන් මනාව දැල්විණ. එසේම එය දීප්තිමත් විය. එය දුටු මිනිසා දර වලින් සෙයාගත් ඉටි වර්ග දල්වා ආලෝකය ලබාගත්තේය. ඇතැම් ඉටි වර්ග දැවීමේදී සුවඳවත් වූ හෙයින් ඔවුන් ඒවා දේවස්ථානවල හා විශේෂ අවස්ථාවල දැල්වීමටත්, සාමාන්‍ය ඉටි නිතර දැල්වීමටත් ඉගෙන ගත්හ. ක්‍රමයෙන් ජනාවාසවල ජීවිතයට පුරුදු වූ ඔවුන් නිවෙස්වලට ද මෙම ක්‍රමයෙන් ඉටිපහන් දල්වා ආලෝකය ලබා ගත්හ. මෙම ඉටි දැල්වීමේදී ගලා යන බැවින් එය රඳවා තැබීමට භාජනත්, එම රත්වූ භාජන එහා මෙහා කිරීමට ලී මිටකුත් යොදා නිපැයූ උපකරණයට පන්දම යයි නම් කළහ. ඉන්පසු ගමන් බිමන්වලදී රාත්‍රියට මෙම පන්දම රැගෙන ගිය අතර, ප්‍රභූ පන්තිය සිට අතවැසියන් මගින් මෙම පන්දම රැගෙන යාමට හුරුකරගත්හ. පන්දම් ඇල්ලීම ආරම්භ වූයේ එතැන් සිටය. පන්දම රැගෙන යන තැනැත්තා "පන්දමා" විය. ගමන් බිමන්වලදී ඔවුන් නොයෙක් දේ දොඩමින් ගිය අතර, ප්‍රභූගේ වඩාත් සිත්ගන්නා අටියෙන් අවශ්‍ය දේත්, අනවශ්‍ය දේත් කථා කළහ. එසේම, ගමනේ දිග අනුව කතාව ද දිගු විය. අඳුරේ ප්‍රවේශමෙන් යා යුතු පන්දමා තමා අසලින්ම තබා ගැනීමටත්, වෙහෙස මහන්සියට කථාව නිසා සහනයක් ලත් ප්‍රභූට පන්දමා හිතවතා විය. ඇතැම් විට බොහෝ අය හොර ගමන් යන්නේද අඳුරේම බැවින් එළිය අවශ්‍යම විය. එවිට පන්දමා අවශ්‍යම විය. එසේම, එම රහස් ගමන් බිමන් දන්නේ ඔහු බැවින් ඔහුට විශේෂ ලැදි කමක් ලැබිණ. පන්දමා මේ අනගි අවස්ථාවෙන් තමාගේ යම් යම් අවශ්‍යතා ප්‍රභූන් මගින් කරවා ගත්තේ වැඩි වෙහෙසක් නැතිවමය. පසුව මේ පන්දම් සේවාව අත්‍යවශ්‍ය සේවාවක් බවට පත්විය.

විද්‍යාවේ දියුණුවත් සමගම විදුලි පන්දම අපට ලැබුණු අතර එය විකාශනය වී රාත්‍රී කාලයේ අහස් යානා බැලීමටත්, නැව්වලට මුහුදේදී ගමන්මග පෙන්වීමටත් බොහෝ සේ මෙම විදුලි පන්දම් උපකාරී විය. අහස් යානාවලට හා නැව්වලට පන්දම් ඇල්ලීම වෘත්තියක් නිසා එම පන්දමාට ලැබුනේ මාසික වේතනයකි. එහෙත් රට රටවලටත්, පුද්ගලයින්ටත් පන්දම් ඇල්ලීමෙන් ලැබෙන සුවිශේෂී වරප්‍රසාද විශාල විය. මෙයට වියදමක් හෝ උපකරණයක් හෝ අවශ්‍ය නොවේ. එසේම මහාචාර්යවරුන්ටත් ඇතැම්විට මෙම සේවාව අපහසු වුවද මලපොතේ අකුරක්වත් නොදත් අයට ද ඉතා දක්ෂ ලෙස පන්දම් ඇල්ලීම කදිමට කරගෙන යාමට පුලුවන. අවශ්‍යව ඇත්තේ ගැඩවිලකු ලෙස නැවෙන ශරීරයක් තිබීමත්, පුද්ගලයාට එහෙයි කීමේ හැකියාවත්, ගතු කේලම් සහ බොරුකීමේ හැකියාවත්, ලැජ්ජා නැති කමත්ය. පුද්ගලයින්ට පන්දම් අල්ලනවා සේම රට රටවලටද පන්දම් ඇල්ලිය යුත්තේ මෙම මූලාශ්‍ර ඇසුරින්ය.

පන්දමකින් කෙරෙන්නේ එළියක් ලබා දීමය. එසේනම්, එළිය අවශ්‍ය අඳුර තැනකට හෝ එළියක් නැති පුද්ගලයකුට ඔහු බොහෝ විට එළිය ගන්නේ ඉහත සඳහන් පන්දමා මගින්ය. එහෙත්, පුද්ගලයකුට එළිය ලැබෙන්නේ ඔහු තුළ ඇති යහපත් ගතිගුණ හා දක්ෂ ක්‍රියාවලිනි. දැන් මෙයින් කාටත් වැටහිය යුත්තේ පන්දම් අවශ්‍ය කිනම් පුද්ගලයකුට ද කියාය. නමුත්, පන්දමේ ඉන්දන හිඟ වූ දිනට දෙදෙනාම කරුවලේ වලක වැටෙති. නැතිනම් පන්දම අවසන් වූ දා පන්දමා ඉවරය. පන්දමේ යතාර්ථය එයයි. මෙය නොදත් පුහුදුන් මිනිසා මෙම චපල ක්‍රියාව වැදගත් දෙයක් ලෙස සැලකුව ද එය ලොවක්, රටක්, සමාජයක්, පුද්ගලයෙක් නැසීමට හැකි විනාශකාරී දෙයක් ලෙස සැලකිය හැකිය. වත්මන් සමාජයෙහි මෙය බොහෝ සේ මනරම් ලෙසින් ව්‍යාප්තව ඇතත් ඉන් ඇත්ත බොරුවක් ලෙසත්, නිවැරදිකරු වැරදිකරුවකු ලෙසත්, හොඳ නරක ලෙසත් කනපිටට හැරවිය හැක. මේ අනුව බලන කළ මෙම අනර්ථකාරී පාපකර්මය හැකි පමණ අඩුකිරීමට එක් අයෙක් හෝ වෙර දරන්නේනම් ඔහු දෙවියෙකි.

*- මාණ්ඩලික සැරයන් බණ්ඩාර ඩබ්ලිව්එම්එම්*



# විද්‍යුත් චුම්බක යුද්ධයෙන්

## රුසියාව ඇමෙරිකාවට වඩා ඉදිරියෙන්



■ ලුතිනන් කර්නල් යූආර් ගාල්ලගේ ගැහේබ

**යුද්ධය** මානව ඉතිහාසයේ ආරම්භයේ සිටම පැවත එන්නක් බවත්, මානව සංහතියේ අවසානය දක්වාම එය අඩු වැඩි වශයෙන් ලෝකයේ කොතනක හෝ පැවතිය හැකි බවත් පිළිගැනීමට සිදුව තිබේ. යුද මූලධර්ම නොවෙනස්ව පැවතිය ද වත්මන් ලෝකය ලබා ඇති තාක්ෂණික දියුණුව යුධ උපක්‍රම සඳහා වැඩි වශයෙන් යොදා ගැනීම මත යුද්ධයේ බිහිසුණු බවට වෙන කවරදාටත් වඩා අද ලෝක ජනතාව මුහුණ දෙමින් සිටී. එවන් බිහිසුණු යුද්ධයක නිරත වී සිටින රුසියාව සහ යුක්‍රේනය පිළිබඳව කෙටි සමාලෝචනයක් සිදුකිරීම මෙම ලිපියේ අරමුණයි.

2022 පෙබරවාරි මස 24 වන දින රුසියාව විසින් යුක්‍රේනය ආක්‍රමණය කරන විටදී යුක්‍රේනයේ කිව් අගනුවර පවා කිසියම් කාලයකට තමන් සතු කරගැනීමට රුසියාවට හැකියාව ලැබෙනවා. ඒ සඳහා හේතු වූ කාරණාව නම් රුසියාව සතු විද්‍යුත් චුම්බක පරාස යුධවේදික හැකියාවයි (Electromagnetic warfare system). රුසියාව භාවිතා කළ ක්‍රසූකා - 4 (Krasukha-4) පද්ධතිය ආධාරයෙන් රුසියාවට හැකිවෙනවා එම අවස්ථාවේදී යුක්රේනයේ ගුවන් ආරක්ෂක පද්ධතිය සම්පූර්ණයෙන්ම අක්‍රිය කොට තමන් යටතට ගැනීමට. නමුත්, අවාසනාවට මෙම පද්ධතිය තුළ තිබූ දුර්වලතාවයක් හේතුවෙන් රුසියාවට නැවත පසු බසින්න සිදුවුනා. ඒක හරියට මහායාන සෙන් කථාවක සඳහන් වෙන පරිදි භික්ෂුවක් විසින් තම සෘධි බලය භාවිතා කොට කොටියකු මැවීමක් සිදුකරන අතර, එහිදී, නිමේෂයකින් කොටියා විසින් භික්ෂුව මරා අනුභව කිරීමක් හා සමාන වේ. එහිදී, ක්‍රසූකා 4 දරණ අධි තාක්ෂණික උපකරණය පසුව රුසියානු පද්ධතියට පවා මැදිහත් වීමට පෙළඹුණු අතර, පසුව රුසියානු ගුවන් ආරක්ෂක ක්‍රම පවා අක්‍රියවන්නට පටන් ගන්නවා. මෙය ඔවුන්ගේ පද්ධතියට මැදිහත් වීමට පටන් ගැනීමත් සමඟ රුසියාව එහි සැර බාල (Scale back) කරන්නට කටයුතු කළා. එසැනින් යුක්‍රේනයේ ගුවන් ආරක්ෂක ක්‍රමය නැවත සක්‍රීය වන්නට පටන් ගන්නවා. ඒ අනුව රුසියාවට ගුවන් ආරක්ෂණ ආධිපත්‍යය (Air dominance) අහිමි වීමක් සිදුවනවා. රුසියානු





යානාවලට කිව් අගනුවරදී පහරදීමට පටන් ගන්නවා.

ඉන්පසු රුසියාව දැනට සිටින ඩිෆෙන්ස් ලයින් එකට පසුබසිනවා. මේ සිදුවීම හරහා බලගතු රටවල් විසින් අද සිදුකරමින් සිටින අලුත්ම යුධ වේදය පිලිබඳව ඉගෙන ගැනීමට හැකි වෙනවා. ලෝකයට රහසින්, අදෘශ්‍යමානව ක්‍රියාත්මක වූ මෙම ක්‍රමවේදය තවදුරටත් ලෝකයාට රහසක් නොවේ. අලුත් ක්‍රමය කොහොමද ලෝක බලතුලනයට හේතුවන්නේ යනාදී කරුණු පිලිබඳව විවිධ කාරණා පිලිබඳව ඔබව දැනුම්වත් කිරීමට කැමතියි. පලමුවෙන්ම ලෝකයේ සිදුවුණු සිදුවීම් 03 ක් පිලිබඳව ඔබගේ අවධානය යොමු කරන්න අවශ්‍යයි.

2011 දී ඉරානය විසින් ඇමරිකාවේ අති නවීන RQ 170 Sentinel නමැති ඔත්තුකාර ඩ්‍රෝන යානාව තමන් වෙතට ගෙන්වා ගන්නවා. ඔබට සිතාගන්න පුලුවන් ද ඇමෙරිකාවට අයත් මෙම අති නවීන යානාව තමන්ගේ ගුවන් පථය වෙත ගෙන්වා ගන්න ඉරානයට හැකිවෙනවා. මෙම යානාව තමයි ඔසාමා බින් ලාඩන් ඝාතනය සඳහා ඔත්තු බැලීම සඳහා යොදාගත්තේ. ඇමරිකාවට අතිශය විශ්වාසයක් තිබුනා මෙම පද්ධතිය පිලිබඳව. ඇමරිකානු යුධ විශේෂඥයින්ගේ මතය වූයේ රුසියාව විසින් ඉරානයට දෙන ලද 1L222 Autobaza නමැති පද්ධතිය විසින් මෙම යානයේ බලය ඔවුන් සතුකරගෙන මෙහි අවුල් කිරීම හා නොමග යැවීමේ ක්‍රමවේද ඔස්සේ (Jamming and deception) මෙම යානාව තුළට රිංගා මෙම යානයේ ක්‍රියාකරු (Operator) බවට ඉරානය පත්වී, තමන් වෙතට ගෙන්වා ගත් බවට. පසුව මෙම යානාව ඉරානයේ විවිධ ස්ථානයන්හි ප්‍රදර්ශණය කරනු ලැබුවා.

දෙවැනි සිදුවීම නම් 2014 වර්ෂයේදී USS Donald Cook නමැති අති නවීන ඇමරිකානු යුධ නැව කළු මුහුදේදී රුසියානු සුකෝයි (Sukhoi) SU - 24 වර්ගයේ යානාවක් මගින් අක්‍රිය කරනු ලැබීම. මෙම යුධ නැව තුළ සිටි නාවිකයකු විසින් පසුව සමාජ මාධ්‍යයන් වෙත හෙලිකර සිටියේ "අපේ නාවික යත්‍රාවට මෙම යානාව නිසා කිසිම දෙයක් කරගැනීමට නොහැකි වූ බවත්, අපේ ගෞරවය සම්පුර්ණයෙන්ම අවමානයකට, ලැජ්ජාවකට පත් කළ බවත්, විනාඩි 90 කට පමණ වඩා වැඩි කාලයක් අපිව අක්‍රිය කර තැබූ බවත්, මෙම යානාව සමහර අවස්ථාවලදී අපේ යුධ නැවේ ගෑවී නොගෑවී යන මට්ටමෙන් ඉතා ආසන්නයෙන් පියාසර කළ බවත් යානය අඩි 30 ක් තරම් ආසන්නයෙන් පියාසර කළ බවත්" ප්‍රකාශ කර සිටියා. ඇමරිකාව විසින් මේ පිලිබඳව විරෝධය රුසියාව වෙත එල්ල කරනු ලැබුවා.

3 වෙනි සිදුවීම තමයි 2018 දී AH 64 Apache වර්ගයේ හෙලිකොප්ටරය සිරියාවේදී බිමට බාන්නට ගුවන් නියමුවන්ට සිදුවීමයි. එහිදී, ඔවුන්ට දැනගැනීමට ලැබෙන්නේ සිරියාවේ ක්‍රියාත්මක රුසියාවට අයත් ක්‍රසුකා 4 වර්ගයේ පද්ධතියක් විසින් මෙම යානාවට Micro Wave Canon ප්‍රහාරයක් එල්ලකොට එය අක්‍රිය කළ බවය. මෙම සිදුවීම මගින් ඔබට යුද්ධයකදී විද්‍යුත් චුම්භක පරාස ආධිපත්‍ය (Electromagnetic Spectrum dominance) කොතරම් වැදගත් ද යන්න තේරෙනවා ඇත.

මම මුලින්ම ඔබට මතක් කර සිටියා රුසියාවට කිව් අගනුවර දී තමන්ට මෙම නව යුධ ක්‍රමවේදයේ සැර බාල කිරීමට සිදු වූ බවත් තම ගුවන් ආධිපත්‍යය අහිමි වී ගිය බවත්, තවද එහිදී, රුසියාවට සිදුවෙනවා තම අති නවීන පද්ධතියක කොටසක් කිව් අගනුවර දමා එන්නට. ඇමරිකාව විසින් එම කොටස තම රටට ගෙන්වා ගනු ලබනවා. රුසියානු හමුදාවට හදිසියේම පසු බැසීමට සිදුවීම මත කිසියම් අත්වැරදීමක් හේතු කොටගෙන මෙම අහිමිවීම සිදුවී තිබේ. මෙම රුසියානු යුධ තාක්ෂණය පිලිබඳව ඇමරිකාව සිටිනුයේ පුදුමයෙනි. යුක්‍රේනය විසින් විශේෂ වාර්ථාවක් මගින් ඇමරිකාව ඇතුළු බටහිර ජාතින් වෙත දන්වා සිටියේ අපට මෙම මෙහෙයුම මගින් ඉදිරියට පැමිණීමට නොහැකි වී ඇත්තේ රුසියාව විසින් භාවිතා කරනු ලබන අති නවීන විද්‍යුත් චුම්භක පරාස ආධිපත්‍ය නිසා බවයි.

රුසියානු ඉදිරි ආරක්ෂක වළල්ලේ කිලෝ මීටර් 6න් 6ට මෙම පද්ධති සවිකර ඇති බැවින් අපගේ සියලු ඩ්‍රෝන යානා පද්ධති ඒ අසලට ගොස් කිසිදු ඉලක්කයක් නොගෙන කඩා වැටීමට ලක්වන බවත්ය. එපමණක් නොව ඇමරිකාව විසින් යුක්‍රේනයට දෙන ලද හිමාස් වර්ගයේ මිසයිල JDM නමැති අති නවීන GPS Guided මිසයිල හා 155 වර්ගයේ GPS Guided කාලතුවක්කු උණ්ඩ රුසියානු ඉලක්ක වෙත එල්ල කිරිමට යුක්‍රේනයට අද වනවිට නොහැකි වී තිබෙනවා. මෙම පද්ධතිය නිසා යුක්‍රේනයට අයත් ඩ්‍රෝන යානා 10000 ක් පමණ 2023 මැයි මස වනවිට අහිමිවීමක් සිදු වී තිබෙනවා. එයට ප්‍රධාන හේතුව වශයෙන් දක්වා ඇත්තේ රුසියානු



ඉදිරි ආරක්ෂක වළල්ලේ සවිකර ඇති මෙම විද්‍යුත් චුම්බක උපකරණයක් මගින් තමන් අසලින් ගමන් කරනු ලබන ඩ්‍රෝන යානා තමන් සතු කරගැනීමක් මගින් අහසේ පියාසර කරවීමට සැලැස්සවීම මගින් බැටරි ආයුකාලය නිමාවත් සමග කඩා වැටීමට සැලැස්වීමයි.

ඔබට දැන් වැටහෙනවා ඇති අළුත් යුධවේදය මගින් කොතරම් බලපෑමක් යුද්ධයකදී සිදුකරලීමට හැකිද යන්න. එම නිසා ඉදිරි යුධ ගැටුම් සිදුවීම භූමිය තුළදී නොව විද්‍යුත් චුම්භක පරාස හරහා සිදුවන බවට නොඅනුමානයි. විද්‍යුත් චුම්භක පරාස යුධවේදය කියන්නේ රේඩියෝ තරංග, රේඩාර් හා අධෝරක්ත කිරණ සෑම පරාසයක්ම මෙම ක්‍රමය තුළ ක්‍රියාත්මක වීමයි. විශේෂයෙන් රේඩියෝ, රේඩාර් සහ අධෝරක්ත තමයි යුධ මෙහෙයුම් වලදී වැඩියෙන් යොදාගන්නේ. මෙහිදී, සිදුවන්නේ තමන්ගේ පද්ධතිය හරහා සතුරු පද්ධතියක් තුළට රිංගා යාම හා එහි පාලනය තමා යටතට ගැනීම. මෙමගින් සිදුකරනුයේ අවුල් කිරීම හා නොමග යැවීම මගින් ප්‍රධාන වශයෙන්ම සතුරු පද්ධතියක පාලනය තමන් යටතට ගැනීමත් ඊට අමතරව තමන්ගේ පද්ධතියට සතුරාගෙන් අවුල්කිරීමකට ලක්නොකර තබාගැනීමත් මෙම පද්ධතියකට හැකියාව තිබෙන්න අවශ්‍යයි. එමනිසා මෙම ක්‍රමවේදය ඉතා පරිස්සමින් කලයුතු දෙයක් බව මතක තබා ගත යුතුයි.

අපිට රුසියානු උදාහරණයෙන් ගත හැකි අත්දැකීමක් නම් ඔවුන් පලමුවරට මෙම නව යුධවේදය භූමියේ භාවිතා කිරිම සිදුකරනතෙක් තමන්ගේ පද්ධතියට බලපෑම් එල්ල වන බව දැන නොසිටීමයි. තවද, ක්‍රුසුකා පද්ධතියට අමතරව රුසියාවේ තිබෙන R330ZH සිටෙල් (Zhitel) පද්ධතියට කිලෝමීටර් 10ක් දක්වා විෂ්කම්භයක් තුළ පිහිටි සියලුම චන්ද්‍රිකා මගින් ක්‍රියාත්මක දූරකථන රේඩියෝ අක්‍රීය කරල දාන්න හැකියාව තිබෙනවා.

මෙම රුසියානු පද්ධතිවලට හැකියාවක් තියෙනවා තමන්ගේ උපකරණ හරහා සතුරාගේ උපකරණ තියෙන තැන් හඳුනාගෙන එහි පිහිටීම කෙටිම මාර්ගයෙන් කාලතුවක්කු අංශ වෙත ලබාදීමට. යුක්‍රේනයේ ඩ්‍රෝන යානා මෙහෙයුම් කරුවන් විශාල ප්‍රමාණයක් මියගොස් තිබෙනවා කාලතුවක්කු ප්‍රහාර එල්ලවීම මගින්. මෙම යුධවේදය රුසියාව පමණක් නොව මේ වනවිට චීනය ද අති විශාල දියුණුවක් ලබා තිබෙනවා. ඇත්තටම චීනය රුසියාවටත් වඩා ඉදිරියෙන් සිටින බව තමයි දැනගැනීමට තිබෙන්නේ. ඇමරිකානු ආරක්ෂණ නිලධාරීන් පිලිගන්නා ආකාරයට ඔවුන් ප්‍රකාශ කිරීමක් සිදුකර තිබෙනවා තමන් ඉරාකය හා ඇෆ්ගනිස්ථානය වැනි තාක්ෂණය අතින් නොදියුනු සතුරන් සමඟ යුද්ධ කරමින් සිටි නිසා අනික් රටවල් සමඟ එකට යාමට නොහැකි වූ බවට. ඇමරිකාන කොංග්‍රසය හමුවේ අපට මෙම හැකියාව අහිමි වීමක් සිදුවූ බවත් ඉරාකයේ 1S1S සමඟ හා ඇෆ්ගනිස්ථානයේ තලේබාන් සමගින් යුද්ධ කිරීමේ දී ඔවුන්ගේ ක්‍රමයට යුද්ධ කිරීමට සිදුවීම මේ සඳහා බලපෑ බවටත් එබැවින්  උසස් තාක්ෂණය භාවිතා කරන සතුරකු සමඟ යුද්ධ නොකරපු නිසා අපිට මෙම හැකියාව අහිමිවී තිබෙන බවත්, එම නිසා ඇමරිකාව චීනයට හා රුසියාවට වඩා ගොඩක් පිටුපසින් සිටින බවට ඇමරිකානු ජනපතිවරයාද පිළිගෙන තියෙනවා. එමනිසා ඔවුන් 2020 සිට නව බලකායක් මේ සඳහා පිහිටුවා තිබෙනවා. ඇමරිකානු යුධ විශේෂඥයින් ප්‍රකාශ කර සිටිනවා ඉදිරි යුධවේදය මෙම තරංග මාලාව තුළ සිදුවන බැවින් වහාම රුසියාව, චීනය හා ඉරානයට සමගාමීව එම රටවල් පසුකරමින් තම හැකියාවන් වර්ධනය කරගත යුතු බව.

අද මේ නිසාම ඇමරිකාව විසින් යුක්‍රේනයේ සිදුවන යුද්ධය පිළිබඳව අඟලෙන් අඟලට විමසිලිමත්වන අතර, සියලුම සිදුවිම්වල දත්ත ඇමරිකාවට ගෙන්වා ගනු ලබනවා. යුක්‍රේනය මෙම යුද්ධය ජයගන්නවා ද යන්න නොව මෙම යුද්ධයේ අත්දැකීම් පිලිබඳව ඇමරිකාව ඉතා උනන්දු වන බව පෙනී යනවා. ඔවුන්ට මෙම යුද්ධය තමන්ගේ යුධවේදයන්, යුධ ක්‍රමයන් අලුත් කර ගැනීමට අත්දැකීමක් සඳහා මහඟු අවස්ථාවක් වී ඇත.





# සෙබළ සිතුවිලි

## අහස...

ඇල දොල ගලා දැක ගහකොළ සුව    පහස
දින සති ගෙවී හඳුනා හිරු සඳු    රහස
යන විට ඉදිරියට සත්වග දස    දහස
මුළු ලොව වසා පැතිරෙයි ගන නිල    අහස

විදුලිය අකුණු මැද වැසි ඇද හැළෙන    විට
බියකරු බවක් උපදින මුත් හතර    වට
පුන් පොහො දිනේ සුදු සඳරැස් ඇසුරු    කොට
පිබිදෙයි කුමුදු විල පැහැබර අහස    යට

පත්වූ විටෙක හිරු සඳු රාහුගෙ    මුවට
මොහොතක් හැරෙනමුත් ලොව ගැහැටක්    මුවට
බිඳගෙන අඳුර යළි එන සුපුරුදු    ලොවට
වෙනසක් කරනු බැහැ අහසෙහි හැඩ    රුවට

සඳු බුද ගුරු සිකුරු වැනි ගහතරු    වැළට
පිවිසිය හැකිය දෝසත ඉරණම    තුළට
ගෙන එන සුබාසුබ පල මානව    කැළට
මුසුවී ඇත අහස ජීවන රළ    පෙළට

බෝසත් සිරිත දෙයි හඳ හාවගෙ    පැත්ත
විමසති තව කෙනෙක් සඳ ගමනෙහි    දත්ත
එසමඟ අහස් තලයේ රන්තරු    රොත්ත
මල් වියනක්ය කවියකුගේ සිත්    ගත්ත

දගලන රිදී කඳු වැනි වෙළපෙති    රහසේ
එක්තැන් නොවී පාවී යන්නට    සැරසේ
දැඩි උණුසුම ඇතත් හිරු නැග එන    දවසේ
ගැබ්බර අහස වැහිදිය දෙන්නට    වෙහෙසේ

කවියන් සිත්තරුන් රසවත් කළ    දෙඇස
කුතුහල විමසුමට යොමු වුණු විදු    මනස
දෙවියන් ඉසිවරුන් සැරිසැරු පෙර    දවස
සුන්දර ගැඹුරු අබිද්හමකි මේ    අහස

හිරු සඳු කිරණ ඇසුරෙන් ගන අඳුර    කැපී
ගොස් ඉදිරියට බාධක පර සමඟ    හැපී
දකිමින් හරිත ලොව නවමල් පොකුරු    පිපී
අහසින් වැටෙන ලද මිනිසුන් නොවෙමු    අපි

කොස්කඳවල නන්දසේන වීරසිංහ


## දියමන්ති ජුබිලිය සමරමින්...

පීඩනයන් දරා විඳ
පොළොවේ මිහිදන් වූ
දියමන්ති කැට...

විඳ දරා අවි දරා
මඟ තනා හෙට ලොවට
හුස්ම දී මව්බිමට...

නික්ම ගිය විරුවාණෙනි,
ඔබට අපගේ උත්තමාචාරය...

කපිතාන් භවන්ති
1 ශ්‍රීලයුකාබ



## අම්මා...

රිදෙන දැවෙන ඉකි බිඳින කඳුලැල් අතරින්
හිනැහුනා මං නුඹේ සිනහව හදේ රන්දා...
ලැමැද උතුරන දරු සෙනෙහෙ පොදි බැඳ
නික්මුනා වැඩ මල්ල කරලා...

හොඳට මැදලා පිහිදලා මිරිවැඩි
සුරසුනා නිල ඇඳුම අඟලා...
නමුදු මගෙ සිත සිතුවෙ නුඹ ගැන
කෑවදෝ උදේ අහර කියලා...

නොමැත අද මට යුද වදින්නට වනමැද
යුද කළා ලිපි ගොනුව පෙරලා...
මවක් වුවට නුඹ උපන් දා සිට
පැතුවෙ නිති ජය මව්බිමට සැමදා...

රාජකාරිය දේව කාරිය කර
වැඩ කරලා මුළු දවස තිස්සෙම...
හිටියෙ බලන්නට දොර කඩුල්ල අසලින්
ගොම්මනට පුන් සඳකි නුඹ මට...


සෙ/725512
ලා/කෝ ජයරත්න පීකේඅයිඑච්
"ප්‍ර" ශාඛාව, ආසේමු (බටහිර)





# රට ජාතිය ආගම සුරැකීමෙහිලා

## රණවිරුවාගේ සහ භික්ෂුවගේ කාර්යභාරය



■ පූජ්‍ය
උණුවතුරබුබුලේ පියදස්සී හිමි
බොරැල්ල ශ්‍රී ලංකාරාම මහා විහාරය

නමෝ බුද්ධාය !

### භික්ෂුවගේ සහ රණවිරුවාගේ මෙහෙවර

මේ උතුම් ශ්‍රී ලංකාද්වීපය නමැති පුණ්‍ය භූමියේ උපන් අප කවුරුත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ දේශනාවට අනුව ගමන් කරන්නවුන් විය යුතුය. මේ උතුම් පින් බිමේ ඉපිද, යම් පුද්ගලයෙක් තමන්ට ආවේණික ජීවනෝපාය මාර්ගයයන් තෝරාගන්නා අතර රණවිරුවෙක් විසින් සිදුකරනු ලබන්නේ හුදෙක් ජීවනෝපාය මාර්ගය සරිකරගන්නා රැකියාවක් ම නොවේ. එක් පසෙකින් එය සමාජ සේවයක් යැයි කිවහොත් නිවැරැදිය. තමන්ගේ ජීවිතය පරදුවට තබා රට, ජාතිය ආගම සුරැකීමෙහිලා රණවිරුවකු විසින් සිදුකරන මෙහෙය අපමණය. රට ජාතිය ආගම සුරැකීම යන තේමාව රණවිරුවකුට මූලික පුහුණුවෙන්ම ලබාදෙන අතර එය ඔහුගේ හදවතටම ස්පර්ශ කරවනු ඇත. අප රටේ අදින් වසර 15 කට පමණ පෙර තිබූ කුරිරු ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමෙහිලා අපගේ වීරෝදාර රණවිරුවන් විසින් ඉටුකළ කාර්යභාරය එකල අපි අපගේ දෑසින් දුටුවෙමු. එහි අරමුණ අන් කිසිවකුත් නොව, අපගේ උතුම් ශ්‍රී ලංකාද්වීපය එක්සේසත් කිරීමයි. රටේ යම්කිසි ස්ථානයක දරුණු ලෙස කලකෝලාහල ඇතිවූ විට ඒවා මැඩලීම සඳහා ඉදිරිපත් වන්නේ ද අපගේ වීරෝදාර රණවිරුවන්ය. හදිසි ආපදා විපත් වැනි දේවල් ඇති වූ විට රණවිරුවන්ගේ කැපවීම හදවතින් ම අගය කළ යුතුය. එසේනම්, මේ සියල්ලම රණවිරුවන් විසින් සිදුකරනු ලබන්නේ රටේ මහජනතාවගේ යහපත සහ සුභ සිද්ධිය සඳහාය.

### භික්ෂුවකගේ සහ රණවිරුවාගේ අවශ්‍යතාවය

භික්ෂුව ද එසේමය. ලෞකික සැප සම්පත් අතහැරදමා ගිහිගෙදරින් නික්ම උතුම් පබ්බජ්ජාව හෙවත් ගෞතම බුදු සසුනේ පැවිද්ද ලබාගන්නේ තමනුත් සසර දුකින් එතෙර වී අන් ජනයාත් සසර දුකින් එතෙර කරවීම පිණිසය. එසේම, මිනිසුන්ගේ මෙලොව ජීවිතයේ දෝලනය වන දුක සැප දෙකෙහි ම අවශ්‍ය වූ මොහොතක භික්ෂුව විසින් ඉටුකරනු ලබන්නේ අනුපමේය කාර්යභාරයකි. ලෙඩ දුක් කරදර බාධක පැමිණෙන විට මිනිසුන්

**පුහුණුව අවසානයේ දී රණවිරුවකු ප්‍රතිඥා දෙන්නේ තම දිවි දෙවැනිකොට පණ මෙන් අප මාතෘ භූමිය සුරකින බවයි. භික්ෂු පුහුණුව අවසානයේ භික්ෂුව ද දිවුරුමක් දෙති. එනම්, "නත්ථි මෙ සරණං අඤ්ඤං - බුද්ධෝ මෙ සරණං වරං" යන ආකාරයට තමාගේ දිවි දෙවැනි කොට බුදුන් සරණ යන බවත්, ශ්‍රී සද්ධර්මය ආරක්ෂා කරගන්නා බවත්ය. මෙසේ බලන කළ භික්ෂුන් වහන්සේත්, වීරෝදාර රණවිරුවාත් දෙදෙනා ම එකම සමාන ආකාරයේ පුහුණුවක් ලබති.**

පැමිණෙන්නේ විහාරස්ථානවලටයි. හිතේ තිබෙන දුක් කරදර දුරු කරගැනීමට විහාරස්ථානයේ වැඩසිටින බෝධි රාජයාණන් වහන්සේ, චෛත්‍ය රාජයාණන් වහන්සේ, සම්බුද්ධ ප්‍රතිමා වහන්සේ වගේ ම සිවුරු දරා වැඩ සිටින භික්ෂූන් වහන්සේ ද මිනිසුන්ට මහත් අස්වැසිල්ලක් වන්නේය. රණවිරුවකු අවිය අතදරා රට ජාතිය පණ මෙන් සුරකින විට භික්ෂුව වටාපත අතදරා ආගම ධර්මය රැකගනිති.

## භික්ෂුවගේ සහ රණවිරුවාගේ කාර්යභාරය වෙනුවෙන් ලබාදී ඇති පුහුණුව

නිවැරදි හික්මුණු භික්ෂුවක් සහ විරෝදාර රණවිරුවෙක් නිර්මාණය කිරීමට මූලිකවම පුහුණුවක් අවශ්‍ය වේ. ඒ සඳහා ගත සහ සිත දෙක ම පුහුණු කළ යුතුය. මේ සඳහා රණවිරුවන් පුහුණු කරන්නේ කඳවුරුවලය. භික්ෂූන් වහන්සේ පුහුණු කරන්නේ භික්ෂු පුහුණු මධ්‍යස්ථානයකය. බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ සිත තුළ ඇතිවන කුසීතකමත් හීන වූ වීර්යයත් නිසා තමන්ගේ මෙලොව සහ පරලොව යන දෙලොවම පිරිහී යන බවය. භික්ෂු පුහුණුවේදී ප්‍රධාන වශයෙන් විනය පුහුණු කරවයි. ගත පාලනය වන්නේ විනය තුළිනි. සංවර ගමන, යහපත් කථා විලාශය භික්ෂුවගේ ජීවිතය මිණි කැටයක් මෙන් ඔපවත් කරයි.

රණවිරුවකු ද නිර්මාණය වන්නේ හමුදා විනය නීති රීතිවලට අනුවයි. ඍජු තීරණ ගැනීම, හෘද සාක්ෂියට අවංකව කටයුතු කිරීම, එකිනෙකා පරයා නොයෑම වැනි ගුණයන්ගෙන් යුත් පුහුණුවකින් නිර්මාණය වන රණවිරුවා තම රටට ජාතියට ආගමට මනා හිතැතිව දිවි පරදුවට පවා තබමින් කටයුතු කරන ආකාරය දැකගත හැකිය. භික්ෂූන් වහන්සේට ද එසේමය. පෙර සඳහන් කළ පරිදි ඒ ලබාදෙන භික්ෂු පුහුණුවෙන් කවරදාවත් තම සිරුරට දරාගත් උතුම් බුද්ධ චීවරයට නිගාවන ලෙස එම භික්ෂුව හැසිරෙන්නේ නැත. කායික සංවරය සහ වාචසික සංවරය ඇතිව ගම් නියම්ගම් සිසාරා තථාගත බුද්ධ දේශනාව තුළින් මිනිසුන්ගේ සිත් සතන් සුවපත් කරමින් භික්ෂුව හුදී ජනීජනයාට පිහිට වනු ඇත.

පුහුණුව අවසානයේ දී රණවිරුවකු ප්‍රතිඥා දෙන්නේ තම දිවි දෙවැනිකොට පණ මෙන් අප මාතෘ භූමිය සුරකින බවයි. භික්ෂු පුහුණුව අවසානයේ භික්ෂුව ද දිවුරුමක් දෙති. එනම්, නත්ථි මෙ සරණං අඤ්ඤං - බුද්ධෝ මෙ සරණං වරං යන ආකාරයට තමාගේ දිවි දෙවැනි කොට බුදුන් සරණ යන බවත්, ශ්‍රී සද්ධර්මය ආරක්ෂා කරගන්නා බවත් ය. මෙසේ බලන කළ භික්ෂුන් වහන්සේත්, විරෝදාර රණවිරුවාත් දෙදෙනා ම එකම සමාන ආකාරයේ පුහුණුවක් ලබති. වෙනස නම් චීවරය සහ නිළ ඇඳුමයි. නමුත්, මේ ඇඳුම් දෙකට ම සිවිල් සමාජයේ මිනිසුන් ගරු කරති. ආදරය කරති. ඒ මන්දයත්, ඔවුන්ගේ ගැලවුම්කාරයන් අප වන බැවිනි.

## චීවරයේ සහ නිල ඇඳුමේ ඇති වටිනාකම

අප කළ යුත්තේ එම නිල ඇඳුමේ ගරුත්වය රැකගෙන රට, ජාතිය සමය හෙවත් ආගම සුරැකීමත්, රට වැසියා ආරක්ෂා කරගැනීමත්ය. යුධ බිය ඇති වූ තැන රට වැසියා සොයා එන්නේ වීරෝදාර රණවිරුවන්වය. යුධ බියක් දැන් නොමැති නිසා රට වැසියාට එය එතරම් ගාණක් නැත. රණවිරුවාගේ අගය ද රටවැසියාට තරමක් නොවටිනා බව ද සමාජය දෙස බලන විට පෙනේ. අපගේ වීරෝදාර රණවිරුවන්ට නොයෙක් ආකාරයේ අපහාස වැනි දෑ සමාජ මාධ්‍ය ඔස්සේ පසුගිය කාල වකවානුව මුළුල්ලේ ම දක්නට ලැබුණු බව නොරහසකි. යුධ හෝ හදිසි ආපදාවක දී මිනිසුන් රණවිරුවාව දෙවියකු ලෙසත්, යුධ හෝ ආපදා නොමැති තැන අටපාස් අයවළුන් ලෙසත් අතලොස්සක් වූ ආත්මාර්ථකාමී පුහු මිනිසුන් හඳුන්වති. භික්ෂුවට ද මේ ආකාරයට සමානය.

මිනිස්සුන්ට පැමිණෙන ලෙඩ දුක් විපත්ති කරදර බාධකවලදී හාමුදුරුවන්ව සිහිපත් වූවාට, සමහර තැනකදී මේ උතුම් අරිහත් ධජය හෙවත් බුද්ධ චීවරයට නොයෙකුත් අපහාස උපහාස සිදුකරන ආකාරය පව්ටු මිනිසුන්ගෙන් පිරි සමාජයෙන් දක්නට ලැබේ. සමහර විටෙක මේ ආකාරයට රණවිරුවාට සහ භික්ෂුවට අපහාස උපහාස කිරීමට හේතුව ලෙස අප දකින්නේ, අපගේ කාර්යභාරය තුළම නියැළී සිටින කෙනකු හෝ දෙදෙනකුගේ වරද නිසා සමස්ත සංඝ සමාජයටත් රණවිරුවන්ටත් සිදුකරන අපහාසයන් ලෙසයි. විටෙක පාලකයන්ගේ හෝ යම් අයකුගේ වරප්‍රසාද වලට ගිජුව මේ වටිනා නිල ඇඳුම සහ බුද්ධ චීවරය පාවා දෙන අයවළුන් නැතුවා ම නොවේ.

## නින්දා අපහාස ඉවසීම සහ කළගුණ සැළකීම

කෙසේ නමුත් හයක් හතරක් නොදන්නා අයවළුන් විසින් අප වෙත එල්ල කරන නින්දා අපහාස නොතකමින් අපහට පුහුණුවෙන් ලබාදුන් කාර්යභාරය මනාකොට ඉටුකරමු. එනම්, කොපමණ ගැරහුම් වින්දත් අප විසින් සිදුකරන යහපත් කටයුතු අත් නොහැර සිදුකළ යුතුය. සිවිල් සමාජයේ මිනිසුන්ට ජාති ආගම් කුල භේද පසෙකලා ඔවුන් අසරණ වූ සෑම මොහොතකම උපකාර කළ යුතුය. භික්ෂුව වනාහි ද ගිහි සමාජයේ මිනිසුන් තමන් වහන්සේට කොපමණ නින්දා අපහාස කළත් ඔවුන් කෙරෙහි මෛත්‍රියෙන් සහ අනුකම්පාවෙන් බැලිය යුතුය. කළගුණ නොදත් අසත්පුරුෂයන්ට සත්පුරුෂ භාවයෙන් කටයුතු කළ යුතුය. සම්බුදු සිරිතේ එන ජාතක කතා ඇසුරින් පවා භික්ෂුවකට සහ රණවිරුවකු යන අප දෙපිරිසටම උගත හැකිය.

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ ආකාරයට අප සියලු දෙනාම මේ ගමන් කරන්නේ ඝෝර කටුක භයානක සංසාර ගමනකයි. එම සංසාර ගමන නිමා කරගැනීමට අපවිසින් සිදුකරනු ලබන සෑම යහපත් කටයුත්තක්ම ඉවහල් වේ. රට ජාතිය සුරැකි රණවිරුවකු කවදාවත් මියයන්නේ නැත. ඔවුන් මේ මහපොළොව මත සදා නොමැකෙන නාමයන් ලෙස ජීවමාන වේ. මතු ආත්මභවයේ ඔවුන් මේ පුණ්‍ය භූමියේම ආරක්ෂක දෙවි දේවතාවුන් වහන්සේලා ලෙස දෙව් තලවල උපදින අතර, බුදුන් දැක නිවන් දැකීමට අපගේ වීරෝදාර සෙබළුන් සිදුකරන මහා කර්තව්‍යය උපකාරී වන බව දතයුතුය.

## දෙපිරිසගෙන්ම ඉටුවන ජාතික සාසනික කාර්යභාරය

ආගම ධර්මය වෙනුවෙන් රණවිරුවාගේ සිදුවන දායකත්වය වනාහි, වර්තමානයේ ලක්දිව වෙහෙර විහාරස්ථාන බොහොමයක සෑ රදුන් වහන්සේලා, බුද්ධ මන්දිර, ධර්මශාලා ආදිය ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අපේ වීරෝදාර සෙබළුන් අනුයුක්ත කර ඇති බව අප කවුරුත් හොඳින් දන්නා කරුණකි. සමහරවිට පටු අදහස් ඇති විවේචකයෙක්ට මෙය විවේචනය කිරීමට කදිම මාතෘකාවකි. නමුත්,

අනෙකුත් ආගමික වශයෙන් වැදගත් පූජනීය ස්ථානවලටත් අපගේ වීරෝදාර රණවිරුවන් අනුයුක්ත කර ඇති ආකාරය රටේ තොටේ වැඩම කරන භික්ෂූන් වහන්සේ නමක් ලෙස මා හොඳින් නිරීක්ෂණය කර ඇත. මෙය කිසිවකුට විවේචනය කිරීමට මාතෘකාවක් නොවේ. කවදත් අපේ රටේ ආගමට ධර්මයට මුල් තැන දුන්නේ අපගේ වීරෝදාර රණවිරුවන්ය. පෙර රජදරුවන්ගේ දවස පටන් යුධ කළකෝලාහල ඇතිවූ අවස්ථාවල රට එක්සේසත් කොට ගමයි, පංසලයි, වැවයි, දාගැබයි තැනුවෝ භික්ෂූන් වහන්සේලා සහ රණවිරුවන්ය. උදාහරණයක් ලෙස දුටුගැමුණු රජතුමාගේ යුධ සේනාවේ ඉදිරියෙන්ම වැඩ සිටියේ මහා සංඝරත්නයයි. යුද්ධය අවසන් කොට, අනුරාධපුරය අග නගරය කොට අනුරාධපුරයේ මොනතරම් සෑරදූන් වහන්සේලා බැදෙව්වාද, ඒ සියල්ලම සිදුකලේ එකල රාජපුරුෂයන් නමින් හඳුන්වන වීරෝදාර රණවිරුවන්ය. එකල ඔවුන් විසින් සිදුකළ වීර වික්‍රමාන්විත ක්‍රියා අදටත් අනුරාධපුර පිංබිමට ගිය කල්හි අපගේ ඇස්වලින් ඒවා දැකගත හැකිය. එබැවින් වර්තමානයේ ද අප රටේ පැවති කුරිරු ත්‍රස්ත්‍රවාදය අවසන්කොට අපගේ වීරෝදාර රණවිරුවන් විසින් ආගමික ස්ථාන මුල් කොටගෙන සිදුකරනු ලබන මේ සාසනික සේවාව හදවතින්ම  අප අගය කළ යුතුය.

## භික්ෂුවට සහ රණවිරුවාට සමාජයෙන් ලැබෙන ගරුත්වය

එබැවින්, භික්ෂුවගෙන් සහ රණවිරුවාගෙන් යන දෙපිරිසගෙන්ම රටට ජාතියට ආගම ධර්මයට ඉටුවන්නේ වචනයෙන් කියා නිමකළ නොහැකි ඉමහත් කාර්යභාරයකි. තවද, මේ දෙදෙනා ම නිර්මාණය වන්නේ අපේ ම සිවිල් සමාජයෙනි. එබැවින් අප ඔවුනොවුන්ට ගරු කළ යුතුය. ගුණය දී කථා කළ යුතුය. උපනූපන් දරුවන්ට පවා ජීවත් වීමට අයිතිය දුන්නේ රණවිරුවාය, සහ සංසාර දුකින් එතෙර වීමට උපකාර කළේ භික්ෂුවය. ඒ දෙපිරිසට ම හිස නමා දෙදණ නමා දොහොත් තබා ආචාර සමාචාර වැඳුම් පිදුම් සිදුකළ යුතුය. අප කළගුණ දන්නා සමාජයක් වන්නේ එවිටයි.

## අපගේ උදාර කාර්යභාරය

ගිහි සමාජය හෙවත් සිවිල් සමාජය භික්ෂුවකට සහ රණවිරුවකුට කළගුණ සළකන්නේ ඔවුන් සතුව අත්‍යුදාර ගුණයන් තිබෙන විටයි. ඔබ භික්ෂුවක් නම් මා ඉහත සඳහන් කළ පරිදි සෑම මොහොතක ම ගිහි සමාජයේ මිනිසුන්ට ඔබව අවශ්‍ය සෑම මොහොතකම, විශේෂයෙන් පිරිත, බණ, දානය වැනි අවස්ථාවලදී පෙනී සිටීමත්, අසරණ වූ මොහොතේ පිහිට වීමත්, ආගම ධර්මය තම දිවි දෙවැනි කොට ආරක්ෂා කර ගැනීමත් එම උතුම් ගුණාංග අතරට ගැනේ. එය වනාහි සෘජු භික්ෂුවකගේ කාර්යභාරය එයයි. තවද, ඔබ රණවිරුවකු නම් මා පෙර සඳහන් කළ ආකාරයට සිවිල් සමාජයේ මිනිසුන්ට ඔබගේ උපකාරය අවැසි සෑම මොහොතක ම ජාති ආගම්භේද නොතකා උදව් උපකාර කිරීමත්, අපගේ මාතෘ භූමිය තම දිවි දෙවැනි කොට ආරක්ෂා කරගැනීමත් වනාහි වීරෝදාර රණවිරුවකුගේ කාර්යභාරයයි.

තෙරුවන් සරණයි!!!

# 143 වන අභිමානය සමරන ශ්‍රී ලංකා පාබල හමුදාව








ශ්‍රී ලංකා පාබල හමුදාවේ 143 වන අභිමානවත් සංවත්සරය ඉකුත් ඔක්තෝබර් මස 23 වන දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් සංවිධානය කෙරුණු උත්සව මාලාවක් ආරක්ෂක සේනා ආඥාපති -මධ්‍යම සහ ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් වයිඑච්බීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. එහිදී, එම රෙජිමේන්තු සරඹ භූමියේදී හමුදා සම්ප්‍රදායානුකූල රෙජිමේන්තු අධිපති වෙත පිනැමුණු සම්මාන පෙළපාලිය, භටපිරිස් ආමන්ත්‍රණය,  සියලු නිල දිවා භෝජන සංග්‍රහය ඒ අතර කැපීපෙනුණි.

එසේම, පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ස්ථාපිත "අබිමන් මුදුනත" රණවිරු ස්මාරකය අභියසදී රට වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන්ට ගෞරවාචාරය පිරිනැමීම ද සර්වරාත්‍රික පිරිත් සජ්ඣායනාව හා මහා සංඝරත්නය උදෙසා හීල් දානය පිරිනැමීම ද සංවත්සර කටයුතු අතරට එක්ව තිබිණ. මෙම අවස්ථාවන් සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා පාබල හමුදාවේ හිටපු හමුදාධිපතිවරු, හිටපු රෙජිමේන්තු අධිපතිවරු, නිලධාරීන්, සෙබළුන් සහ රට වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන්ගේ ඥාතීහු ඇතුළු විශාල පිරිසක් එක්ව සිටියහ.

# සුරාවේ අගය ගැන කියවෙන සුරා මාලය



ලංකාව තුළ අප්‍රකට සාහිත්‍යය පොත් විශේෂයෙන්ම කවි පොත් රාශියක් දකින්න ලැබෙනවා. හැබැයි මේ ගොඩක් කවි පොත් දැනට අපිට මුද්‍රණයෙන් දකින්න නෑ. ඒ අතරින් එක් කවි පොත් වර්ගයක් තමයි මාල කවි කියන්නේ. යම්කිසි මාතෘකාවක් හෝ යම්කිසි සිදුවීමක් පාදක කරගෙන මල් මාලාවක් ආකාරයට කවි ගොතන ලද පොතක් මාල කවි පොතක් ලෙස හඳුන්වනවා. අපවත් වී වදාළ තෙරිපැහැ සෝමානන්ද මහනායක හාමුදුරුවෝ යුනෙස්කෝ ආධාර යටතේ මේ මාල කවි පොත් ගණනාවක් එකතු කරලා වෙළුම් දෙකකින් යුත් මාල කවි සංග්‍රහය පළ කළා.

මේ මාල කවි අතර සුරාවේ අගය වර්ණනා කරමින් ලියැවුණු සුරා මාලය නම් කෙටි කවි පොතක් තියනවා. කොයි තරම් කෙටි ද කියනවා නම් මේ කවි පොතේ තියෙන්නෙ කවි 25 යි. සාමාන්‍යයෙන් බෞද්ධ සමාජයේ සුරාව පිළිකුල් කෙරෙනවා. හැබැයි මේ  කෘතිය රචනා කරපු ජන කවියා ඉතා විනෝදකාමී පුද්ගලයෙක් කියන එක මේ කවි කියවද්දි අපිට පැහැදිලි වෙනවා. අපි එහෙනම් දැන් සුරා මාලය රස විඳිමු.

1. කිතුල් පොල් සහ තල් - ඈ සුරා දෙන ගස් දුල්
නැමද කර සිතු ලොල් - මඳක් පවසමි සුරා ගුණ පුල්

2. සුරාවෙහි රසයත් - සරා එහි ඇති ගුණයත්
බොන අය මිස වෙනත් - නොබොන අනුවණ දනෝ නොදනිත්

3. කට පුරා බීලා - ගව කුකුළු මස් කාලා
ඉන්ට බැරි ඌලා - කුමට මැව්වද දේව මෝලා

4. අසුර යුද වන් කල - සුරනගෙ ලැබුව පණ නල
සුරාවෙහි තෙද බල - නිසා බැව් එය පෙනෙති පොත් වල

5. නරලොව රජුන් හට - යුදයක් පැමිණ වූ විට
සුරා දී මත් කොට - මිසක් සෙබලෝ නොයති කිසි විට

6. දෙවියන් රජුන්ටත් - පෙර විසූ උතුම් සතටත්
පිහිට වූ යහපත් - සුරා බීමෙන් දොසක් නම් නැත්

7. දවාලට කාලක් - සවස් කල බෝතලයක්
බීවොත් දැන පමණක් - සුරාවට වෙන නොමැත බෙහෙතක්

8. ගතෙහි සැම කැක්කුම් - සිතපත් තක්කු මුක්කුම්
නසා බොරු රැක්කුම් - සුරති හළ රඟ කෙරෙයි දැක්කුම්

9. කරනට මෙදෙය මට - බැරියයි යමෙකු කීවිට
දුනහොත් සුරා තුට - මරු ළඟට මුත් යේ ඉදිරියට

10. යක් පිසස් බියටත් - නුරා සැප බැරි ලෙඩටත්
සුරා වැනි හිතවත් - උතුම් බෙහෙතක් ලොවෙහි කිසි නැත්

11. මෙකප මුලදී එක් - සුරා නම් පසිඳු වැද්දෙක්
සොයාගත් විඳ දුක් - හෙයින් නම් වී සුරා යයි නෙක්

12. එදා සිට සැම දෙස - පතළ වී සුරා නිසි ලෙස
සත් දනෝ ලොව කුස - බොන්ට වනි බඩපුරා සහතොස

13. කුඹුරු ගොවිතැන් වැඩ - කරනා සඳෙහි ගිම් මැඩ
ගන්ට නම් නුඹෙ බඩ - පුරා බීපන් සුරා හැර තුඩ

14. වැඩක් වුව සේනක - මිතුරන් සමඟ වීමෙක
වැනි අන් සැප කිමෙක - එයින් මැදපන් සුරා ගස් නෙක

15. රත් පිත ද ගිනියම් - සහයෝනි සුද බින්දුම්
හැරලන කොඳු රිඳුම් - කිතුල් රා හැර නොමැති වෙන යම්

16. ඉදිමුමද බරවා - කැසි රිඳුම් බඩ පුරවා
කිතුල් රා පෙරවා - බීව හොති යෙති රෝග හරවා

17. කලවා කොඳු රිදී - නහර පණ නැති ලෙඩ දී
නම් පිය මිතු සදී - බීව හොත් එය නසයි රා ඉදී

18. අඟ පසඟ වකුටුව - වාත කැකුම් පිහිටුව
යස පොල් රා දුටුව - සැණින් යයි ගත වඩා සතුටුව

19. අජීරණ ගඳ ලෙඩ - ඇතහොත් කිකිළිබිජු මැඩ
බ්‍රැන්ඩි සමඟින් තුඩ - ලුවොත් යෙයි පිනි දිනිඳු දුට හැඩ

20. ලෝ පූජිත විස්කී - සෝඩා එක්ක හැක්කී
බීවොත් වරක් කී - රෝග සැණෙකින් යෙයි වැළැක්කී

21. ජින් නම් ඉතාමය - යහපත් ගුණ යුතාමය
මුතුරු ලෙඩැ තාමය - බීවහොත් පිරිසුදු වෙතාමය

22. නොකී නව මනහර - සුරා ඇති ලොව බටහිර
ගෙන සමඟින් බීර - බීව නුඹහට යෙහෙකි හැමවර

23. එහෙයින් සුරායා - බීලා බඩ පුරායා
විඳිමින් නුරායා - ගෙව්ව කල් දැන මේ සුරායා

24. බීම සැම වේලේ - වෙරිවී සිටින ලෝලේ
නුඹේ අද රාළේ - ගෙලේ ලම් මේ සුරා රාළේ

25. දිනේවා! දින දිඅන - සුරා සැල ළඟ ගැවසෙන
බේබදු මිතුරුවන - සුරා තුරු ඇති තුරා සතොසින

*උපුටා ගැනීමකි...*

***කර්නල් එම්පීපී පෙරේරා (විශ්‍රාමික)***


# යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු ස්කොෂ් ශූරතාවලිය - 2024












"යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු ස්කොෂ් ශූරතාවලිය - 2024" ඉකුත් ඔක්තෝබර් මස 07 වන දින පනාගොඩ ස්කොෂ් පිටියේ දී පැවැත්විණි. ඊට එක්වූ යුද්ධ හමුදා රෙජිමේන්තු 13 ක ක්‍රීඩකයන් ඉසව් 12 ක් යටතේ තරඟ කරමින් සුවිශේෂී දක්ෂතා දැක්වූහ.

එහිදී, තියුණු තරඟයකින් අනතුරුව විවෘත කණ්ඩායම් ශූරතාවලියේ ජයග්‍රහණය හිමිකරගැනීමට ගජබා රෙජිමේන්තුව සමත් වූ අතර, ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අනුශූරතාවය හිමිවිය. කාන්තා අංශයේ විවෘත කණ්ඩායම් ශූරතාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායටත් අනුශූරතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායටත් හිමිවිය. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්කොෂ් කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී ගේ සුරතින් තරඟාවලියේ ජයග්‍රාහකයින් වෙත ත්‍යාග ප්‍රදානය කරනු ලැබීය.

## මෙවර කරාතේ ශූරතාව යුද්ධ හමුදාවට

ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනය මගින් සංවිධානය කරන ලද " ජාතික කරාතේ ශූරතාවලිය - 2024", ඔක්තෝබර් මස 17 සහ 18 යන දිනයන්හිදී බණ්ඩාරගම ගෘහස්ථ ක්‍රීඩාංගනයේ දී පැවැත්විණ. ක්‍රීඩා සමාජ 31ක ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහභාගී වූ මෙම තරඟාවලිය විවිධ ඉසව් 35ක් ඔස්සේ පැවැත්විණි. එහිදී යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් රන් පදක්කම් 28 ක්, රිදී පදක්කම් 26 ක් සහ ලෝකඩ පදක්කම් 30 ක් දිනාගනිමින් තරඟාවලියේ විශිෂ්ටයෝ බවට පත්වූහ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා කරාතේ කමිටුවේ සහ යුද්ධ හමුදා කරාතේ සංචිතයේ උප සභාපති බ්‍රිගේඩියර් ආර්ඩී සලේ එන්ඩීසී ගේ අධීක්ෂණය යටතේ යුද්ධ හමුදා කණ්ඩායම මෙම තරඟාවලියට සහභාගී විය.





# සුහද බැඩ්මින්ටන් තරඟාවලියක්

යුද්ධ හමුදාව හා උතුරු ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරීන් අතර සුහදතාව වර්ධනය කිරීමේ අරමුණින් සංවිධානය කෙරුණු බැඩ්මින්ටන් තරඟයක් ඉකුත් ඔක්තෝබර් 02 වන දින 522 වන පාබල බළසේනා මූලස්ථාන ගෘහස්ත ක්‍රීඩාගාරයේ දී පැවැත්විණ. මරදන්කේණි ප්‍රාදේශීය ලේකම් තුමාගේ ඉල්ලීම මත සංවිධානය කෙරුණු මෙම තරඟාවලිය සඳහා එම කාර්යාලයේ සේවය කරන 42 යුත් කාර්ය මණ්ඩලයක් සහභාගී වූහ.

52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීආර් පතිරවිතාන යූඑස්ඒඩබ්ලිව්සී පීඑස්සී සහ 522 වන පාබල බළසේනාවේ වැඩබලන බලසේනාධිපති කර්නල් එස්එම්සීජ්එස් සමරතුංග ආර්එස්පී ගේ පූර්ණ අධීක්‍ෂණය හා මඟපෙන්වීම යටතේ මෙම තරඟාවලිය පැවැත්විණ. එහිදී, තරඟකරුවන් හට දිවා ආහාරය හා තේ පානය ලබාදීමට ද, තරඟ විනිශ්චය සඳහා යුද්ධ හමුදා විනිශ්චයකරුවන්ගේ සහාය ලබාදීමට ද කටයුතු කෙරිණ. 522 වන පාබල බලසේනාවේ සිවිල් සම්බන්ධීකරණ නිලධාරී ලුතිනන් කර්නල් එච්එම්ආර්ඩීකේ හේරත් විසින් මෙම තරඟාවලියේ සම්බන්ධීකරණය සිදුකරන ලදී.





# අන්තර් රෙජිමේන්තු දැල්පන්දු ශූරතාව දිනා









ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකා දැල්පන්දු කණ්ඩායම පසුගිය සැප්තැම්බර් මස 28 වන දින පනාගොඩ දී පැවති "අන්තර් රෙජිමේන්තු දැල්පන්දු ශූරතාවලිය - 2024" ජයග්‍රහණය කිරීමට සමත් විය. අවසන් තරඟයේ දී ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ "ඒ" කණ්ඩායම පරාජය කරමින් ඔවුහු මෙම ජයග්‍රහණයට හිමිකම් කියූහ. මෙම තරඟාවලිය සඳහා විවිධ රෙජිමේන්තු නියෝජනය කරමින් කණ්ඩායම් පහක් සහභාගී වූ අතර, එහි විශේෂ අවස්ථාවක් ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ ලාන්ස් කෝප්‍රල් සේනාරත්න කේකේඑස්පී නෙට්බෝල් රැජින ලෙස කිරුළ පැලඳවීම සිදුවූවාය.

මෙම අවස්ථාව සඳහා ආරාධිත අමුත්තා ලෙස 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී විය. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි උදූලා කස්තුරිමුදලි මහත්මිය ඇතුළු නිලධාරීන්, නිලධාරිණියන් සහ සෙසු නිලයන් රැසක් එක්වූහ.







# අන්තර් රෙජිමේන්තු කායවර්ධන, බර ඉසිලීම සහ සවි එසවීමේ තරඟාවලිය - 2024







යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු කායවර්ධන, බර ඉසිලීමේ සහ සවි එසවීමේ තරඟාවලිය - 2024 පනාගොඩ, යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගණයේ දී ඉකුත් ඔක්තෝබර් මස 22 සිට 24 වන දින දක්වා පැවැත්විණි. 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති සහ යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු කායවර්ධන, බර ඉසිලීමේ සහ සවි එසවීමේ කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීජේකේ විමලරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් මෙම තරඟාවලිය පැවැත්විණ. කායවර්ධන, බර ඉසිලීම සහ සවි එසවීම යන අංශ යටතේ රෙජිමේන්තු 17 ක් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 140 දෙනෙක් මෙම තරඟාවලිය සඳහා සහභාගී වූහ.

එහිදී, තියුණු තරඟයකින් අනතුරුව බර ඉසිලීමේ පිරිමි අංශයේ ශූරතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය විසින් දිනාගත් අතර, අනුශූරතාව හිමිකරගන්නා ලද්දේ ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව විසිනි. තවද, කාන්තා අංශයේ ශූරතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය හිමිකරගනිද්දී ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය අනුශූරතාවට හිමිකම් කීය. සවි එසවීමේ ඉසව්වේ ශූරතාව ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට ද අනුශූරතාව ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට ද හිමිවිය. කායවර්ධන ශූරතාව ශ්‍රී ලංකා සංඥා බලකායත් අනුශූරතාවය ගැමුණු හේවා බලකායත් දිනාගන්නා ලදී.



# නව ටෙනිස් පිටියක් සහ එළිමහන් ශරීර සුවතාගාරයක් විවෘත කෙරේ



යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ නිලධාරීන් සහ සෙසුනිලයන් අතර ශාරීරික යෝග්‍යතාවය සහ ක්‍රීඩාශීලීත්වය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් පැවති දිගුකාලීන අවශ්‍යතාවයක් සපුරාලමින් ඉකුත් ඔක්තෝබර් මස 29 වන දින එම කඳවුරු පරිශ්‍රයේ ඉදිකළ නව ටෙනිස් පිටියක් සහ එළිමහන් ශරීර සුවතාගාරයක් විවෘත කෙරිණ. යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති සහ 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්එස්සීකේ වනසිංහ ආර්එස්පී යූඑස්පී ගේ සුරතින් මෙම නව පහසුකම් විවෘත කෙරුණු අතර, එහිදී යුද්ධ හමුදා ටෙනිස් සංචිතය වෙතින් ප්‍රදර්ශන ටෙනිස් තරඟයක් ද පවත්වන ලදී,

# ගජබා රෙජිමේන්තුවෙන් උපහාර






ගජබා රෙජිමේන්තු ක්‍රීඩකයින් සහ පුහුණුකරුවන් වෙනුවෙන් උපහාර පුදකිරීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් මස 27 වන දින එම රෙජිමේන්තු මූලස්ථානයේ දී පැවැත්විණි. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යාපනය ආරක්ෂක සේනා ආඥාපති මෙන්ම ගජබා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එම්ජ්ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී සහභාගී විය. එහිදී, එම ක්‍රීඩකයින් සහ පුහුණුකරුවන්ගේ කැපවීම ඇගයීමට ලක්කරමින් රෙජිමේන්තු අධිපතිගේ සුරතින් සමරු තිළිණ ප්‍රදානය කරනු ලැබීය. සංස්කෘතික නර්තන අංග රැසකින් ද වර්ණවත් වූ එම උත්සවය අවස්ථාවට නිලධාරීන් සහ සෙසුනිලයන් රැසක් සහභාගී වූහ.

# අන්තර් රෙජිමේන්තු එල්ලේ ශූරතාවලිය - 2024





යුද්ධ හමුදා එල්ලේ කමිටුව වෙතින් සංවිධානය කරනු ලැබූ "යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු එල්ලේ ශූරතාවලිය - 2024" රෙජිමේන්තු 12 ක් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 300 කට අධික පිරිසකගේ සහභාගීත්වයෙන් ඉකුත් ඔක්තෝබර් මස 25 වන දින දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයේ දී පැවැත්විණි. එහිදී, තරඟාවලියේ පිරිමි කාණ්ඩයේ තරඟයේ ශූරතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායටත්, අනුශූරතාවය ශ්‍රී ලංකා පාබල හමුදාවටත් හිමි වූ අතර තෙවන ස්ථානය දිනාගැනීමට ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව සමත්විය. ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ කෝප්‍රල් ජයරත්න ආර්ජ්එස්එච් තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය දිනාගත් අතර දක්ෂතම පන්දු රකින්නා වූයේ ශ්‍රී ලංකා පාබල හමුදාවේ මදුවන්ත එල්එච්ජ්ජේය. එමෙන්ම, දක්ෂතම පිතිකරු ලෙස ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ ලාන්ස් කෝප්‍රල් ලක්මාල් කේඅයි සම්මාන දිනාගත්තේය.





තරඟාවලියේ කාන්තා කාණ්ඩයේදී 1 ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය ශූරතාවය දිනාගත් අතර, අනුශූරතාවය 2 (ස්වෙච්ඡා) බළඇණිය ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායට හිමිවිය. එම කාණ්ඩයේ දක්ෂතම ක්‍රීඩිකාව ලෙස 1 ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ සැරයන් විමලරත්න කේඑම්එස්එස් ද දක්ෂතම පන්දු රකින්නිය ලෙස 2 (ස්වෙච්ඡා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ කෝප්‍රල් ඉන්ද්‍රවංශ එන්එල්එස්කේ ද සම්මාන දිනාගත්හ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලයේ මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදා එල්ලේ කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් කේවීඑන්පී ප්‍රේමරත්න ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ සුරතින් ජයග්‍රාහකයින් වෙත ත්‍යාග සහ කුසලාන ප්‍රදානය කරනු ලැබීය.

# 21 වසරක අභිමානය සැමරේ





නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානයේ අභිමානවත් 21 වන සංවත්සරය ඉකුත් ඔක්තෝබර් මස 27 වන දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් සංවිධානය කෙරුණු වොලිබෝල් සහ සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියක් එම මූලස්ථාන ක්‍රීඩාංගණයේ දී පැවැත්විණ. කණ්ඩායම් 16 ක් සහභාගී වූ මෙම තරඟාවලියේ දී වොලිබෝල් ශූරතාවය 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය විසින් දිනාගත් අතර අනුශූරතාවය 3 (ස්වෙච්ඡා) බලඇණිය සන්නද්ධ බුද්ධි බලකායට හිමිවිය. එසේම, ක්‍රිකට් තරගාවලියේ ශූරතාවය හටකාර්ය සම්පාදන අණසක මූලස්ථාන කණ්ඩායම දිනාගත් අතර, නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථාන කණ්ඩායමට එහි අනුශූරතාවය හිමිවිය. තවද, එහිදී තරඟාවලිය පුරා කැපී පෙනෙන දක්ෂතා දැක්වූ තරඟකරුවන් වෙත විශේෂ සම්මාන ද පිරිනැමිණ. සම්මාන ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිතයා ලෙස නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එස්ජ් කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී සහභාගී විය.





## අන්තර් රෙජිමේන්තු චෙස් ශූරතාවලිය - 2024

යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු චෙස් ශූරතාවලිය පනාගොඩ ශ්‍රී ලංකා සංඥා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී ඉකුත් ඔක්තෝබර් මස 25 වන දින පැවැත්විණ. ඊට රෙජිමේන්තු 14 ක ක්‍රීඩක ක්‍රීඩිකාවෝ තරඟ ඉසව් තුනක් යටතේ තරඟ වදිමින් දස්කම් ප්‍රදර්ශනය කළහ. එහිදී, තරඟාවලියේ සමස්ත ශූරතාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය විසින් හිමිකරගත් අතර, ඉංජිනේරු සේවා බලකාය අනුශූරතාව දිනාගැනීමට සමත් විය.




උණුසුම් තරඟ මාලාවකින් අනතුරුව විවෘත පිරිමි අංශයේ ශූරතාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය දිනාගත් අතර අනුශූරතාව ඉංජිනේරු සේවා බලකාය හිමිකර ගත්තේය. කාන්තා විවෘත අංශයේ කණ්ඩායම් ශූරතාවය ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය විසින් දිනාගනිද්දී අනුශූරතාව හිමිවූයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායටය.

අවසන් මහ තරඟාවලියේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අධ්‍යක්ෂ ජෙනරාල් පාබල සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා චෙස් කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් එස්ඩබ්ලිව්බී වෙලගෙදර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී සහභාගී වූ අතර, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී පීඑස්සී සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා චෙස් කමිටුවේ උප සභාපති කර්නල් එම්එම්එම්පී මහේෂ් කුමාර ඇතුළු නිලධාරීන් සහ සෙසු නිලයන් රැසක් ද ඊට සහභාගී වූහ.





# යුද්ධ හමුදා සංවත්සර සැමරුමට ක්‍රිකට් තරඟාවලියක්

75 වෙනි යුද්ධ හමුදා සංවත්සරය නිමිත්තෙන් වන්නි ආරක්ෂක සේනා මූලස්ථානය සංවිධානය කළ සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියක් එම මූලස්ථාන ක්‍රීඩා පිටියේදී ඉකුත් ඔක්තෝබර් මස 03 වන දින පැවැත්විණ. කණ්ඩායම් 7 ක් තරඟ වැදුණු එහි ශූරතාව යුද්ධ හමුදා පොලිස් හේවා බලකා වන්නි විනයාරක්ෂක ඛණ්ඩය විසින් හිමිකරගන්නා ලද අතර, එහි අනුශූරයන් වූයේ වන්නි ආරක්ෂක සේනා ආරක්ෂක ඛණ්ඩයයි. මෙම අවස්ථාවට සමගාමීව සංගීත වැඩසටහනක් ද පැවති අතර, එහිදී එම මූලස්ථානයේ සේවය කරනු ලබන සිවිල් සේවක කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් සඳහා රුපියල් 5000 බැගින් වටිනාකමින් යුත් වියළි සලාක පාර්සල් පිරිනැමීම ද සිදුකෙරිණ. ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී මෙම අවස්ථාවන්ට ප්‍රධාන ආරාධිතයා ලෙස එක්විය.








# 11 වන පාබල සේනාංකයෙන් සුහද ක්‍රිකට් තරඟාවලියක්

11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඒයූ කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී ගේ මඟපෙන්වීම මත ඉකුත් ඔක්තෝම්බර් මස 21 සහ 29 යන දෙදින තුළ 1 බළඇණිය ශ්‍රී ලංකා රයිෆල් බලකා ක්‍රීඩාංගණයේදී සුහද ක්‍රිකට් තරඟාවලියක් පැවැත්විණි.

මේ සඳහා 11 වන පාබල සේනාංකය සහ ඒ යටතේ ස්ථාපිත බලසේනා සහ බළඇණි නියෝජනය කරමින් කණ්ඩායම් 6ක් සහභාගී වූහ. තරඟාවලියේ අවසන් මහා තරඟයේදී, 2 බළඇණිය ශ්‍රී ලංකා රයිෆල් බලකා කණ්ඩායම ශූරතාව දිනාගත් අතර, 642 වන පාබල බලසේනා කණ්ඩායම එහි අනුශූරතාව හිමිකරගත්තේය.



# 27 වසක අභිමානය සමරන 563 වන බලසේනාව








563 වන පාබල බලසේනාවේ අභිමානවත් 27 වන සංවත්සරය බලසේනාධිපති බ්‍රිගේඩියර් වයිඑම්එස්සීබී ජයතිලක ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් 2024 ඔක්තෝබර් මස 04 වන දින උත්කර්ෂවත් ලෙස සමරන ලදී. මෙම අවස්ථාවට සමගාමීව අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධි මූලයේදී බලසේනා ධජයට සෙත්පැතීම සහ කිරි ආහාර පූජාවක් ද පවත්වන ලද අතර, වව්නියාව - ඕමන්ත අලගල්ල, පොට්ටුකුලම් විරමා මුණිවර් ප්‍රදේශවල පාසල් ළමුන් හට පාසල් උපකරණ පරිත්‍යාග කිරීම ද සිදුකෙරිණ. එසේම, සේවයේ යෙදී සිටින, ජීවිත පූජාකළ සහ තුවාල ලබා දැනට ප්‍රතිකාර ලබන සියලුම නිලයන් හට පින් අනුමෝදන් කිරීමත් සෙත්පැතීමත් උදෙසා පිරිත් දේශනාවක් ද පැවැත්විණ.

තවද, බලසේනාධිපති වෙත කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීමද සිදු කෙරුනු අතර, එහිදී බලසේනාධිපති බලසේනාවේ ඉතිහාසය සහ ඉදිරි ප්‍රගමනය පිළිබඳ සියලු නිලයින් දැනුවත් කිරීමට ද කටයුතු කළේය.


# රණවිරුවා








**අධීක්ෂණය**

මේජර් ජෙනරාල්
කේඑන් රසික කුමාර
එන්ඩීසී පීඑස්සී

**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
එම්අයිඑස් චන්ද්‍රකුමාර
යූඑස්පී පීඑස්සී අයිජී





**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ

**සහය සංස්කාරක**

කපිතාන්
එච්පීජේ හවන්ති

**පරිගණක අකුරු සංයෝජනය, කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 බකි II සේනාරත්න ජීසී - 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීජ්එම් - 11 ඉසේරෙ

**ඔබේ නිර්මාණ, අදහස් හා යෝජනා එවිය යුතු ලිපිනය**

"රණවිරුවා"
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර.

**ඊමේල්**

dtemedia&psyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුහ දිගුව**

51445 / 51446 / 51447

**"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට**

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය




# 75 සංවත්සරය නිමිත්තෙන් විශේෂ මුද්දරයක්



ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 75 වන සංවත්සරය නිමිත්තෙන් තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර කාර්යාංශය වෙතින් ඉකුත් ඔක්තෝබර් 10 වන දින විශේෂ සමරු මුද්දරයක් නිකුත් කරනු ලැබීය. යුද්ධ හමුදා මූලස්ථානයේ පැවති මෙම උත්සව අවස්ථාව සඳහා ප්‍රධාන අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය. පනාගොඩ පිහිටි ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ පැවති 75 වන සංවත්සර දින සැමරුම් පෙළපාලියේ එක් අංගයක් ලෙස මෙම වැඩසටහන පැවැත්විණි. මෙම අවස්ථාවට තැපැල්පති එස්.ආර්.ඩබ්ලිව්.එම්.ආර්.පී. සත්කුමාර මහතා සහ නියෝජ්‍ය තැපැල්පති ඩී.ඒ. රාජිත කේ රණසිංහ ඇතුළු කාර්ය මණ්ඩල සාමාජිකයන් සහභාගී වූ අතර එහිදී ප්‍රථම නිල මුද්දරය මුද්‍රා තබා තැපැල්පති තුමන්ගේ සුරතින් යුද්ධ හමුදාධිපති වෙත පිළිගැන්වීය.






මේ හැම අඩි සලකුණක් අස්සෙම කතාවක් තිබුණා.
ඒ හැම කතාවක් අස්සෙම ජීවිතයක් තිබුණා.
එහෙම ජීවිත දහස් ගණනක් මතින් දිනාදුන්න රටක් තිබුනා.
අද ඔබ නිදහසේ හුස්ම ගන්න තැන ඒතැනයි.

පැත්ත නොගෙන සටන් වැද
රොත්තටම පයගහන්න
මත්තටත් බිමක් ඉතුරු කළ
ඇත්තම විරුවන්ගෙ
උත්තම කැපකිරීමේ

**75 වෙනි සැමරුම...**

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.